11 ශ්‍රේණිය සිංහල

ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පොත අංක-01-2022

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

(විවිධ පළාත්, කලාප සහ පාසල් මගින් පළමුවන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 06ක් සහ ලැබී ඇති පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමු වාර පරීක්ෂණය - 2020

11 - ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය I,II

නම/විභාග අංකය :- ..... කාලය: පැය 03යි විනාඩි 10 යි.

සිංහල භාෂාව හා සාහිත්‍යය I

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

(01) මට වුණේ ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ වැඩක් යැයි කියමින් ගුණදාස පිටත් ව ගියේය.
(1) අවදානම් වැඩක් අනුන් ලවා කරවීම. (2) ආපදාවෙන් ගැලවෙන්නෙක් නැත.
(3) කිසිම ප්‍රයෝජනයක් නොලැබීම. (4) එක් විපතකින් ගැලවී තවත් විපතකට පත් වීම.

(02) සමාජය තුළ වැඩ කිරීමේ දී ගැටවලට හසුවන අවස්ථා ද ඇත.
(1) අනුන්ගේ උගුල්වලට හසු වීම. (2) දරුණු ලෙස පළිගැනීම.
(3) ඕනෑවට එපාවට වැඩ කිරීම. (4) අනතුරක සේයා පහළ වීම.

(03) සමන් විභාග ප්‍රතිඵල ලැබෙන තුරු ඇඟිලි ගනිමින් සිටියේ ය.
(1) පමණට වඩා සූදානම් වීම. (2) නොඉවසිල්ලෙන් සිටීම.
(3) මහත් බියට පත් වීම. (4) තද ආශාවෙන් යමක එල්බ ගෙන සිටීම.

- අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

(04) පැරණි අධ්‍යාපන ක්‍රමය තුළ ..... ප්‍රධාන කාර්යයකි.
(1) නිරීක්ෂණය (2) වනපොත් කිරීම. (3) පරිශීලනය (4) විමර්ශනය

(05) කඩිනම් ගල්ඔය ව්‍යාපාරය ආශ්‍රිතව ගොවි ජනපද ..... කරන ලද්දේ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා විසිනි.
(1) ප්‍රතිසංස්කරණය (2) ප්‍රතිස්ථාපනය (3) ප්‍රතිෂ්ඨාපනය (4) ප්‍රතිනිර්මාණය

(06) රචනා රීතිය යනු භාෂා භාවිතයේ දී විශිෂ්ට ලෙස කෙරෙන පද ..... යි.
(1) සංකෝචනය (2) සංඝටනය (3) කෙටිකිරීම (4) ගැළපීම.

(07) අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) තබ්ලාව, බටනළාව, වීණාව, සර්පිනාව
(2) නාමපද, ක්‍රියාපද, නිපාත, උපසර්ග
(3) රියන, නියන, කියත, මිටිය.
(4) ළමයි, ගුරුවරු, දෙමව්පියෝ, ආදි ශිෂ්‍යයෝ

(08) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) විශිෂ්ට, දෘෂ්ඨිය, නිශ්ඵල, කොට්ඨාසය.
(2) දෘඪතර, ඝණ්ඨාරය, මජ්ඣිම, චන්දය.
(3) අලුයම, ගැටලු, සමස්ත, මහලු
(4) ශාඛය, අවස්ථෝචිත, ව්‍යංගාර්ථ, දූරකථනය.

(09) අරුණ, ජීවිතය, මැදැගිල්ල, ආධාර යන වචනවල දෙවෙනි අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කෙටි පාපිල්ල, කෙටි ඇදය, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල.
(2) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය හා ඇලපිල්ල.
(3) කෙටි ඇදය, කෙටි පාපිල්ල, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල.
(4) කෙටි ඇදය, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල හා කෙටි පාපිල්ල.

(10) ''රළ'' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,

(1) කණ්ඨජ (2) තාලුජ (3) මූර්ධජ (4) දන්තජ

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ළමයෙක්, කාන්තාවක, අපි, කම්කරුවන්
(2) ළමයි, අලියෙක්, වෛද්‍යවරු, ඔවුන්
(3) මිනිසුන්, නීතිඥවරයකු, ගොවියෙක්, මම
(4) ළමයෙක්, කාන්තාවක්, ඔවුහු, ගුරුවරු.

(12) ''අති + අවශ්‍ය'' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) අත්‍යවශ්‍ය (2) ආත්‍යාවශ්‍ය (3) ආත්‍යවශ්‍ය (4) අත්‍යාවශ්‍ය

(13) ''ආදිවාසීහු වන වදුලෙහි ජීවත්වීමට කැමැත්තක් දක්වති'' යන වාක්‍යයේ 'වන වදුලෙහි' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) සම්බන්ධ විභක්තිය (2) කර්ම විභක්තිය (3) ආධාර විභක්තිය (4) කරණ විභත්තිය

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.**

(14) සාර්ථක කෙටි කතාවක් **ආකස්මික** ව කළ හැකි දෙයක් නොවේ.

(1) හේතුවක් ඇතිව (2) ක්ෂණිකව (3) එක දිගට (4) හේතුවක් නැතිව

(15) කලා නිර්මාණ කරුවා තම අත්දැකීම් **ප්‍රතිනිර්මාණය** කිරීමෙන් නිර්මාණකරණයෙහි යෙදෙයි.

(1) යළි නිරීක්ෂණය (2) යළි ආපසු බැලීම (3) යළි ගොඩනැංවීම. (4) යළි උපකල්පනය

(16) 'ඤ' යනු තාලුජ අක්ෂරයකි.

(1) මුදුනෙන් හටගන්නා
(2) තල්ලෙන් හටගන්නා
(2) තොල්වලින් හටගන්නා
(4) උගුරෙන් හට ගන්නා.

(17) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගය අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) තද්ධිත - සිරිමත්, ගුණවත්, කුල්මත්, දිරිමත්
(2) මිශ්‍ර ක්‍රියා - ගය ගයා ලියමින්, කියමින්, බලමින්
(3) සන්ධි - එදිනෙදා, දකුණත, වියවුල, අරුණෝදය
(4) සමාස - කිරිබත්, මව්පිය, වනමල්, දසබල

(18) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය තෝරන්න.

(1) පොත, පත්‍රය, සඟරා, ලිපිය
(2) වඩු බංකුව, දඬුඅඬුව, අතකොළුව, කියත.
(3) පතල, ඉල්ලම් කුර, කුඩය, උදැල්ල.
(4) පෑන, පැන්සල, පන්හිඳ, කංචුකය.

(19) එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) පොත - ග්‍රන්ථය, උවම් - උපමා, සබවස - අසත්‍යය, චිරන්තන - පෞරාණික.
(2) මුහුද - අර්ණවය, දැමය - ශාකය, අත - හස්තය, දියත - ලෝකය.
(3) නයන - ඇස, හසළත්වය - නිපුණත්වය, උක්තීන් - කියමන්, තඹර - මානෙල්.
(4) සෙව්වන්දි - ඉද්ද, ඉසුරු - සම්පත්, වණ - අකුර, සමය - ආගම.

(20) මුලි දී ඇති පදයට **සමානාර්ථයක් නොයෙදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පණ්ඩිත - විද්වත්, බහුශ්‍රැත, ව්‍යක්ත, විශාරද.
(2) අනංගයා - වියොවග, මල්සරා, මින්දද, මලවි.
(3) දක්ෂ - විදග්ධ, නිපුණ, ස්නිග්ධ, ප්‍රවීණ.
(4) ජලය - අඹ, දල, උදක, සිලිල.

(21) **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ආකූල - ව්‍යාකූල
(2) නුවණ - නුනුවණ
(3) ඍජු - කුටිල
(4) ප්‍රත්‍යක්ෂ - අනුමාන

(22) **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?

(1) දරුවා අඬමින් අම්මා ළඟට දිව්වේය.
(2) නීතිරීතිවලට අනුගතව කටයුතු කරනු මැනවි.
(3) ගෙවිලිය කවි කියමින් ගොයම් නෙළයි.
(4) ළමයා පොත් ටික අතට ගෙන පාසලට ඉක්මනින් ගියේ ය.

(23) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'තොමෝ' යන්නෙහි පුරුෂවාචී නාමපදය වන්නේ 'තෙමේ' යන්නයි.
(2) 'සිහිනිඟ යන්න ස්වරාදේශ සන්ධි පදයකි.
(3) 'අප' යන්න අනුක්ත නාමපදයකි.
(4) 'කිරිබත්' විභක්ති සමාස පදයකි.

- **අංක 24 සිට 26 තෙක් ප්‍රශ්නවල තද අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(24) ශ්‍රී ලංකාව **මනස්කාන්ත** දිවයිනකි.

(1) සිත් නළවන
(2) සිත් සතුටු කරවන
(3) සිත් ඇදගන්නා
(4) සිත් ඔකඳ කරවන

(25) ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් ගොඩ නැංවීම සඳහා මහාචාර්ය සේනක බිබිලේ **අප්‍රතිහත** ධෛර්යයෙන් යුතුව කටයුතු කළේ ය.

(1) නොපසුබස්නා
(2) ඉතා මහන්සියෙන්
(3) සිත් රිදවන
(4) අඛණ්ඩ

(26) පැරණි **සම්භාව්‍ය** කෘති රචනා කිරීමේ දී උපමා භාවිතයට ගෙන ඇත.

(1) පාලි
(2) අලංකාර
(3) පැරණි
(4) උසස්

- **අංක 27, 28 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

(27) 'අය මාර්ග මුළුමනින් ම නැතිකර ගැනීම'

(1) අඬුව තිබෙද්දී අත පුළුස්සා ගැනීම.
(2) අතු කඩා මොර කන්නා සේ.
(3) ගෙන්දගම් පොළොව රත්වෙලා වගේ.
(4) ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ.

(28) 'නැති වූ දෙයෙහි අගය වැඩි යයි සිතීම'

(1) පරිස්සමට තිබූ දෙය ඇලියාවට ගියා වගෙයි. (2) ගඟට ඉනි කැපුවා වගෙයි.

(3) ගිය ලූලා මහ එකා. (4) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ.

◆ **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

(29) (1) සිසුහු පස්දෙනෙක් සිංහල විෂයට විශිෂ්ට සම්මාන හිමි කර ගත්හ.

(2) පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුත්තාහ.

(3) අපි එය කළොත් යෙහෙකි.

(4) දක්ෂ ක්‍රීඩකයෙක් වන්නේ කෙසේ ද?

(30) (1) ගංගාවෝ ගලා බසියි. (2) ඈ ගුරුවරියක වූවා ය.

(3) අපි ශ්‍රී ලාංකික පුරවැසියන් (4) ඒ තෙම මහන්සියෙන් වැඩ කළේ ය.

(31)
- මොහොතක නිහඬතාවට ..... සභාවෙන් ප්‍රතිචාරයක් ලැබිණි.
- සෙබළු වහා ම ක්‍රියාත්මක වූ..... ප්‍රතිවාදීන්ගේ ප්‍රයත්නය අසාර්ථක විය.
- සැළලිහිණි කවියා සන්ධ්‍යා වර්ණනය ..... අපූර්ව කාව්‍ය සංකල්පනා මැවීමට සමත් වේ.
- හින්දු උත්සව අතරින් දීවාලි ..... දීපවාලිය වැදගත් හා වර්ණවත් උත්සවයකි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) පසු, හෙවත්, බැවින්, තුළින් (2) පසු, බැවින්, තුළින්, හෙවත්

(3) පසු, තුළින්, බැවින්, හෙවත් (4) පසු, තුළින්, හෙවත්, බැවින්.

(32) පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූවිට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?

''ඒ ගොල්ලො අපේ වැඩේ කරනව.''

(1) ඔවුහු අපේ වැඩ කරති. (2) ඔවුන් අපේ වැඩ කරති. (3) ඔව්හු අපේ වැඩ කරහු. (4) ඔවුන් අපේ වැඩ කරහි.

(33) 'සෙංකොට්ටං' නමැති නව කතාවේ රචකයා වන්නේ,

(1) ඒ.වී. සුරවීර (2) සිරි ගුණසිංහ

(3) මහින්ද ප්‍රසාද් මස්ඉඹුල (4) මහගමසේකර

(34) ශබ්ද ධ්වනිය වඩාත් ඉස්මතු වී පෙනෙන කවි පදය ඇතුළත් වරණය තෝරන්න.

(1) කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට (2) සිසිවන දුවන ඉඟ සුඟ ගත හැකි මිටින

(3) සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී. (4) පුවළ සිහළ දළ බළ මුළුනිති ඔසළ

(35) ''ඇගෙ රන්වන් මුව කුඩා ය; ජපා පුෂ්පයක් බඳු ය.'' යන පාඨයෙහි 'ජපා පුෂ්පයක්' යන්නෙහි අර්ථය කුමක් ද?

(1) නිල් මහනෙල් (2) රෝස මලක් (3) වද මලක් (4) පිච්ච මලක්

(36) පහත සඳහන් කවියේ දෙවෙනි පදය සම්පූර්ණ කරන්න.

හැම ගනඳුරු බොන වර නිසයුරා ගත

.....

පුල් නිලුපුල් සම් වන් කතක වුවනත

කලදෝ කැට තෙලෙක දිසි වැනි පැහැ දිමුත

(1) නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත (2) ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත

(3) පහන් බැවින් පිටතට සස ලෙසින් වත (4) තර පතරින් සඳ'දර තර පහර දෙත

(37) ''පෙර දිග ගොරහැඬි රකුසෝ
මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොව ගත්ත
කළු රෙදි පොට
මොකටද මේ තීරුවලට ඉරා දමන්නේ''

ඉහත සඳහන් කවියේ රචකයා වන්නේ,

(1) සිරි ගුණසිංහ
(2) ගුණදාස අමරසේකර
(3) කුමාරතුංග මුනිදාස
(4) චන්ද්‍රරත්න මානවසිංහ

(38) ප්‍රාදේශීය ව්‍යවහාරයේ දී 'බක්කම්මා' යනු
(1) බාලම්මා
(2) කුඩම්මා
(3) පුංචි අම්මා
(4) ලොකු අම්මා.

(39) ''කළුගැහී තරගයට ඉහළ ගිය
සිමෙන්ති බිත්ති මිසක
ඇසට නිලට
අහසක් ගහක් කොළක
අවටත් නැත
නිව්යෝර්ක් නම් පුරවර
සියක් මහල් එක් ටැම් ගෙය මුදුනේ
දොර ජනෙල් වඩා සිර කළ කාමරයක
ඇඳක් - පුටුවක් - මේසයක්
මම''
මෙම පද්‍ය ඛණ්ඩයෙන් කියැවෙන්නේ,

(1) කාමරයක් ගැන ය.
(2) බෝඩිමක් ගැන ය.
(3) කාර්යාලයක් ගැන ය.
(4) නිවසක් ගැන ය.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

''මිනිස් හිතේ හට ගන්නා අදහස් හා හැඟීම් ප්‍රකාශ කරන උපකරණය භාෂාව යි''

(1) මිනිස් හිතේ පහළ වන හැඟීම් ප්‍රකාශ කරන මාධ්‍යය භාෂාවයි.
(2) මිනිස් සිත තුළ ජනිත වන අදහස් ප්‍රකාශ කරන උපකරණය භාෂාවයි.
(3) මිනිස් සිතෙහි පහළ වන සියලු ම දේ ප්‍රකාශ කරන උපකරණය භාෂාව යි.
(4) සිත තුළ ජනිත වන හැඟීම් ප්‍රකාශ කරනුයේ භාෂාව මගිනි.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමු වාර පරීක්ෂණය - 2020

11 - ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම/විභාග අංකය :- .....

◆ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල හෝඩියේ ඇතුළත්

(අ) තාලුජ (ආ) මූර්ධජ අක්ෂරය බැගින් ලියන්න.

(ii) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) උත්තීර්ණ (ආ) විත්තිය

(iii) පහත සඳහන් පදවල ප්‍රකෘති වෙන් කර ලියන්න.

(අ) මහල්ලා (ආ) පිහිය

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාත පද දෙකක් උපුටා ලියන්න.

ඔහු දිගු නිවාඩුවකින් පසු ව නැවත සේවය සඳහා වාර්තා කළේ ය.

(v) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

(අ) කම්මුල (ආ) ගුරුළිඳු

(vi) පහත සඳහන් "ල හා ළ" සහිත පද දෙකේ අර්ථය වෙන වෙන ම ලියන්න.

(අ) ලය (ආ) ළය

(vii) පහත සඳහන් වාක්‍යයේ පද දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක **පමණක්** නිදොස් කර ලියන්න.

''ජාතික සම්ප්‍රදායට ගරු කරමින්, උත්සවය විශිෂ්ඨ අන්දමින් සරළ ව පැවැත්විණි.''

(viii) පහත සඳහන් වාක්‍ය දෙක සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) විදුලි ඉංජිනේරුවන් නව විදුලි බලාගාරයක කටයුතු අරඹති.

(ආ) අපි ළමයි හා පෙළට සිටියෙමු.

(ix) පහත දැක්වෙන වාක්‍ය දෙකෙහි ඉරි ඇඳි පදවලට ගැළපෙන සේ යුගල පද යොදා ලියන්න.

(අ) මේ මස සේවකයන්ට <u>වැටුප්</u> ගෙවීමට ආදායම ප්‍රමාණවත් නොවන බව ඔහු පැවසුවේ ය.

(ආ) වැදගත් වැඩක් <u>නොසැලකිලිමත්</u> ව කිරීම හොඳ නැත.

(x) පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කර ලියන්න.

(අ) ගිය හකුරට නාඩන්නේ .....

(ආ) හිසරදේට ..... මාරු කරන්නා සේ (ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන අ , ආ , ඉ , ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ක්‍රීඩාව මිනිසාට කායික හා මානසික වශයෙන් ලබාදෙන රුකුල ඉමහත්ය. එය රටක උදාසීනත්වයෙන් තොර ක්‍රියාශීලී මිනිසුන් සංවර්ධනයට වටිනා මෙහෙයක් ඉටු කරයි. ශරීර සුවතාවය සඳහා ක්‍රීඩාවේ අගය පිළිබඳ සිතමු.

(ආ) කුණු කසළ අනිසි ලෙස බැහැර කිරීමෙන් සිදුවන හානිය බරපතල ය. මිනිසාගේ දැනුම්වත් වීමෙන් හා යහපත් ආකල්ප හේතුවෙන් මේවායින් මිදෙන්නට හැකි ය. අසුන්දර හැඩගැසීම් දුරු කර සුන්දර වටපිටාව කාගෙත් ශුභ සිද්ධිය උදා කරයි.

(ඉ) රටක සංවර්ධනයට පමණක් නොව එහි පැවැත්ම සඳහා විනය ගරුක සමාජයක් තිබිය යුතුයි. සදාචාර සම්පන්න විනයගරුක මිනිසුන් බිහිකිරීමට අදහන ආගම බලපායි. වර්තමානයේ මුදල හා තරගකාරිත්වය මේ සියල්ල යටපත් කරයි.

(ඊ) සුන්දරත්වය ලබාදෙන වනගහනයන් ශ්‍රී ලංකාවේ බොහෝය. මේවා තුළින් මිනිසාට ලැබෙන යහපත් ප්‍රතිඵල රාශියකි. එහෙත් මෙවැනි පාරිසරික දායාදවලට අද අත් වී ඇති තත්ත්වය කනගාටුදායක ය. වන සම්පත සුරැකීම හා ඒ සඳහා නිසි පිළියම් යෙදීම කාගේත් යුතුකමකි. (ලකුණු 25)

(03) පහත සඳහන් ඡේදය වචන 65 - 75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

කිසිම ආර්ථික ක්‍රමයක් හෝ සමාජ ක්‍රමයක් පූර්ව නූතන අවධියේ පවා සියවස් ගණනක් තිස්සේ ස්ථාවර ව හෝ නොවෙනස්ව හෝ නොපැවති බව වර්තමාන ඉතිහාසඥයෝ පිළිගනිති. ඉතිහාසය සම්බන්ධයෙන් සලකන කල මෙය ලෝකයේ කවර රටකට වුව ද සාධාරණය කෙසේ වුවද අභ්‍යන්තර වර්ධන, බාහිර පීඩන සහ බලපෑම් අනුව පමණක් නොව වසංගත වැනි විනාශකාරී අවස්ථාවල දී උද්ගත වන තත්ත්වයන් අනුව ද බලාපොරොත්තු රහිත ලෙස පිට පිට ම පැන නැගිය හැකි නියඟය, දුර්භික්ෂ වැනි ස්වභාවික ආපදා අනුව ද විවිධ කාලවල දී වෙනස්වීම් සිදුවිය හැකි අතර ඒවායේ ප්‍රමාණය විවිධාකාර වීමට ද පුළුවන. තවද බැලූ බැල්මට සුළු සුළු වෙනස්කම් පමණක් පෙන්නුම් කරන කාල පරිච්ඡේද ඇත්ත වශයෙන් ම මුල් බැස ගන්නා වූ වැදගත් වෙනස්කම් වර්ධනය වන කාල පරිච්ඡේද විය හැකි ය. ඒවායේ රාශිභූත ප්‍රතිඵල පැහැදිලිව දක්වන්නේ දශක ගණනාවකට පසුව ය.

කෙසේ වුව ද ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ඉතිහාසයේ පුළුල් කාල පරිච්ඡේද අළලා අර්ථවත් ලෙස පොදු නිගමනයන්ට එළඹීමට පුළුවන. එසේ කළ හැකිවන්නේ විශේෂයෙන් ආර්ථික සහ සමාජීය රටාවල රාමුව බොහෝ දුරට නොවෙනස්ව පැවති කාල පරිච්ඡේද සම්බන්ධයෙනි.

(ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

යටත් විජිත අවධියේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවීම් කෙරෙහි සැලකිලිමත් වීමේ දී අවධානය යොමු කළ යුතු තවත් වැදගත් කරුණු කීපයක් ඇත. ඒවා අතර අලුත් බෝග වර්ග, අලුත් කර්මාන්ත, නව තාක්ෂණික ක්‍රම හා යන්ත්‍රෝපකරණ හඳුන්වා දීම සඳහන් කළ හැකි ය. දුම්කොළ වගාව නොඅනුමානව ම පෘතුගීසින් විසින් හඳුන්වා දෙනු ලැබූ අතර දිවයිනේ වයඹ දිග හා උතුරු ප්‍රදේශවල දුම්කොළ සරුවට වැඩුණි. දුම්කොළ වගා කළ ප්‍රදේශවලදී ම අලෙවි කෙරිණි. එය යාපනයේ සිට දකුණු ඉන්දියාවට අපනයනය කළ වැදගත් ද්‍රව්‍යයක් ද විය. මඤ්ඤොක්කා වගාව ගැන පෘතුගීසින්ගේ කාලයේ දී සුළු වශයෙන් දැන සිටින්නට ඇති නමුත් එය පුළුල් ලෙස ව්‍යාප්ත වූයේ ලන්දේසි කාලයේ දී ය. මල්බෙරි වගාව සහ පටපණුවන් ඇති කිරීම ආරම්භ කරන ලද්දේ ලන්දේසින් විසිනි. එහෙත් සේද කර්මාන්තය එතරම් සාර්ථක නොවීය. ඒකධිකාරි අපනයන බෝගයක් වශයෙන් කෝපි වගාව දහඅටවන සියවසේ මුල් භාගයේ දී ආරම්භ කෙරිණි.

ඉන් වසර කිහිපයකට පසුව එය සාර්ථක වූවත් ලන්දේසින් විසින් ම එය වගා කිරීම අධෛර්යවත් කරන ලදී. ඊට හේතු වූයේ එවකට ඔවුන්ට අවශ්‍ය තරම් කෝපි ජාවා දිවයිනෙන් ලබාගත හැකි වීමත් කිසියම් හේතුවක් නිසා ජාවා ප්‍රදේශයේ නිෂ්පාදනය අඩු වුවහොත් ලංකාවේ කෝපි වගාව යළි පුනරුත්ථාපනය කළ හැකි තත්ත්වයක පවතින බවට ඔවුන් තුළ විශ්වාසයක් ගොඩ නැගී තිබීමත් ය. ආරම්භයේ දී කෝපි සඳහා ඉහළ මිලක් ගෙවීමට ඉදිරිපත් වීමත් සමඟ වගාවේ සාර්ථකත්වය පෙන්නුම් කරන විට විශාල ලෙස මිල පහත දැමීමක් සිදුවිය.

(1) යටත් විජිත සමයේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවීම් කෙරෙහි බලපෑම් කළ කරුණු අතරින් එකක් සඳහන් කරන්න.

(2) මඤ්ඤොක්කා වගාව පුළුල් ලෙස පැතිරුණේ කුමන පාලන කාලයක දී ද?

(3) දිවයිනේ සරුවට වැඩුණු දුම්කොළ වගාව දැකිය හැකි වූයේ කුමන ප්‍රදේශවල ද?

(4) කෝපි සඳහා ගෙවන ලද ඉහළ මිල පහත දැමීමට හේතු වූ කරුණ වන්නේ කුමක් ද?

(5) කෝපි වගාව ඒකාධිකාරී අපනයන භෝගයක් ලෙස ආරම්භ වූයේ කුමන කාලයේ දී ද?

(ලකුණු 2 × 5 = 10)

(05) සඳසිරිගම විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2020 අප්‍රේල් මස විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට නියමිත අතර පහත සඳහන් පරිදි වැඩසටහන සාකච්ඡා කර ගෙන ඇත.

ප්‍රධාන ආරාධිත අමුත්තා - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා

කලාපයේ සියලු ම අධ්‍යක්ෂවරුන්ට හා අවට පාසල්වල විදුහල්පතිවරුන්ට ආරාධනා කිරීම

එහි අංග වශයෙන් පිළිගැනීමේ ගීතයක්, නර්තන අංග 3ක් ත්‍යාග ලබාදීම ප්‍රාථමික අංශය හා ද්විතීක අංශය වශයෙන් අදියර 2ක් වශයෙන් ක්‍රියාත්මක වීමට නියමිත ය.

මෙම කරුණු සැලකිල්ලට ගෙන ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා න්‍යාය පත්‍රය සකස් කරන්න.

නැතහොත්

වරුණගම ප්‍රදේශවාසින් විසින් වැඩිහිටි ප්‍රණාම උළෙලක් පසුගිය දින පැවැත්වීය. ප්‍රාදේශීය ලේකම්තුමා ද මෙයට සහභාගි විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් 18ක සිටින වයස්ගතම වැඩිහිටියෝ මෙහිදී ප්‍රණාම ලැබූහ. ප්‍රාදේශීය ශාසනාරක්ෂක බෞද්ධ බල මණ්ඩලයේ ලේඛකාධිකාරි කිතලගම ධම්මදස්සි නාහිමිපාණන් වහන්සේ ද උත්සවය සඳහා වැඩම කළ අතර මෙය කාලෝචිත වැඩසටහනක් බව අනුශාසනාවේ දී පැවසූහ. වරුණගම ප්‍රාදේශීය වාර්තාකරු රත්නසේකර ඔබ යැයි සිතා පුවත්පතක පළ කිරීම සඳහා වාර්තාවක් සකස් කරන්න.

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමු වාර පරීක්ෂණය - 2020

11 - ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය - III

නම/විභාග අංකය :- ..... කාලය: පැය 02යි.

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "මගේ අත මිට තිබුණා. ඔක්කො ම ඒ නඩුව වෙනුවෙන් වියදම් කළා."

(අ) කවරකු විසින් මෙම ප්‍රකාශය කරන ලද්දේ ද?

(ආ) මෙම ප්‍රකාශය අසා සිටියේ කවු ද?

(ii) කාටත් හිමි පොදු දේ නම්
නැති බැරි හිඟ අවහිර කම්
.....
.....

(අ) ඉහත පද්‍යයේ ඉතිරි දෙපදය ලියන්න.

(ආ) මෙම කවිය රචනා කළ කවියාගේ මුල් ම කාව්‍ය කෘතිය නම් කරන්න.

(iii) "මොහු සිල්වත්නට අටපිරිකර දුන් බව දැන, "එ මහණැ"යි දකුණත දික් කළහ.

(අ) ඉහත උද්ධෘතය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?

(ආ) 'සිල්වත්නට අටපිරිකර දුන්හ'යි මෙහි සඳහන් වන්නේ කවුරුන් ද?

(iv) අප බෝසතුන් මිස
අනෙකෙකු නො ම අසන ලෙස
සුර රජ සිට අහස
තතක් සිඳුව'යි කීය එ විගස

(අ) ඉහත කවිය උපුටා ගත් මුල් කෘතියේ කතුවරයා නම් කරන්න.

(ආ) 'සුර රජ'යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් ද?

(v) (අ) සාහිත්‍ය විද්‍යාව, කල්පනා ලෝකය යන කෘතිවල කතුවරයා නම් කරන්න.

(ආ) ඔහු රචනා කළ ස්වයං ලිඛිත චරිතාපදානය කුමක් ද?

(vi) "එහෙයින් දිවැසින් බලනුවෝ ප්‍රාර්ථනාව තෙල ලෙසින් ම සමෘද්ධ වන නියාව දැන සිනා පහළ කළහ"

(අ) මෙහි සඳහන් ප්‍රාර්ථනය කුමක් ද?

(ආ) ඉහත උද්ධෘතය ඇතුළත් මුල් කෘතියට මූලාශ්‍ර වූ ග්‍රන්ථය නම් කරන්න.

(vii) (අ) එච්. එම්. කුඩලිගම කවියා සිය නිර්මාණ සඳහා ආභාසය ලැබුයේ කුමන කවියෙකුගෙන් ද?

(ආ) කුඩලිගමයන්ගේ සමකලීන කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(viii) "ගියොත් හුදෙක් අපට ම ලජ්ජා වන්නී ය. ඔබ ගමන නොකැමැත්තෙමි."

(අ) ඉහත ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) 'ඔබ ගමන' යනුවෙන් මෙහි සඳහන් වන ගමන කුමක් ද?

(ix) පහත සඳහන් ජනකවි ප්‍රභේද සඳහා නිදසුන් කවි වර්ග දෙකක් බැගින් දක්වන්න.

(අ) කෙළි ගී - (ආ) කෘෂි කර්මාන්තය හා බැඳුණු ජන කවි -

(x) (අ) අමාවතුර සඳහා මුල්කර ගත් බුදුගුණය කුමක් ද?

(ආ) අමාවතුර සඳහා කතුවරයා භාවිත කොට ඇත්තේ සිංහල කතා කලාවේ කුමන රීතිය ද? (ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ගුත්තිල **මහ** **සිපී**

සක්දෙව් බසින් සැතපී

මින් දිනමැයි **දැපී**

බමර තත පළමුවෙන් සිඳපී

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) සමස්ත පද්‍යයෙහි අදහස ලියන්න.

(ii) 'රන් හැර ගෙන නොදෙමි. අපටත් රක්ෂාව නම් ඌ ම වේ ද?"

(අ) මෙම ප්‍රකාශය කළේ කවර හේතුවක් නිසා ද?

(ආ) අපටත් රක්ෂාව නම් ඌ ම වේ ද? යන්නෙහි අදහස ලියන්න.

(iii)"බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා දණ්ඩෙන් ගසන ලද ආශිර්විෂයක්හු මෙන් ක්‍රෝධයෙන් දිලහී කිපුණාහු..."

(අ) බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් මෙසේ කෝපයට පත්වීමට හේතු වූයේ කුමක් ද?

(ආ) 'ආශිර්විෂයක්හු' යන්නෙහි අදහස ලියන්න.

(iv)"**වටාලා** ශිල්ප උගන්නට එන්නෝ නොවෙති. එ සෙ වන්නා හා මට ලාභ පිරිහෙයි. එ සෙ බැවින් ශිල්ප සමහරයට **උපචාර** යයි කියා මිනිස් දහසක් මරන්නට කියමි."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

(v) "වේ රුදු දෝසා කළ මේ දේ

මා පුතු නොතකා විපාකේ

මුවපත් වූයේ

නියත විනාසේ

මේ මොහොතේ කිම් කරනෙම් දෝ

මුළා වී මඟ නොපෙනේ"

(අ) තම පුතුගේ ක්‍රියාවෙන් මව කම්පනයට පත් වූ ආකාරය පැහැදිලි කරන්න.

(ආ) පුතු මෙසේ කිරීමට හේතු වූ කරුණ සඳහන් කරන්න. (ලකුණු 4 × 5 = 20)

(03) (i) මිනිස්කම පිළිබඳ සානුකම්පිත ව ද

(ii) හාස්‍යය හා උපහාසයෙන් යුතුව ද

චරිත නිරූපණය කිරීමට ධර්මසේන හිමියන් පෑ සමත්කම උග්ගසේන සිටුපුත්හුගේ කථා වස්තුව රසවත් සාහිත්‍යාංගයක් වීමට ඉවහල්වී ඇත. එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්,

(i) සමාජ හිතකාමීන් බිහිවීමටත්

(ii) සමාජ විරෝධී පුද්ගලයන් බිහිවීමටත්

ඇසුරු කරන්නන්ගේ හැසිරීම ඉවහල් වන්නේ කෙසේ දැයි අඟුල්මල් දමනයෙන් මනාව පැහැදිලි කෙරේ. එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15)

(04) (i) කවියා යොදා ගත් කාව්‍යෝපක්‍රමත්

(ii) කාව්‍යාලංකාරත්

ගංගාවේ සංගීතය පැදි පෙළ රසවත් නිර්මාණයක් වීමට හේතු වී ඇත.

සුදුසු නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්,

(i) බස් වහර භාවිතයේ දී පෙන් වූ සමත්කමත්

(ii) රස විඳින්නන්ගේ හැසිරීමත් ගුත්තිල වෙණ නද පැදිපෙළ සාර්ථකත්වයට ඉවහල් වී ඇත. එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15)

- **05, 06, 07 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

(05) සහෘද මනසෙහි චිත්තරූප මැවෙන අයුරින් අවස්ථා හා සිද්ධි නිරූපණයට ජාතක කථා කතුවරයා සමතෙකි. සතර කන් මන්ත්‍රණයෙන් සුදුසු නිදසුන් **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(06) ජනකවියට සුවිශේෂී වූ ලක්ෂණ කවරේදැයි 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' පැදි පෙළ ඇසුරෙන් නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(07) දිරියෙන් දිවියට මුහුණ දුන් අහිංසක ගැමි කතකගේ චරිතයක් ලෙස බැද්දේගම නවකතාවේ පුංචි මැණිකාගේ චරිතය නිරූපණය කොට ඇත. නියමිත කොටස ඇසුරින් නිදසුන් **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10)

රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
පළමු වාර පරීක්ෂණය - 2020
First Term Test - 2020

21	S	I, II, III

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II, III **කාලය පැය තුනයි.**

නම / අංකය : ..... **11 ශ්‍රේණිය**

සැලකිය යුතුයි,

- සියලුම ප්‍රශ්න වලට පිළිතුර සපයන්න
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තොරන්න. (විභාගයේදී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)
- අංක 1- 4 තෙක් ප්‍රශ්න වල ඉරි ඇදි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. අධ්‍යක්ෂවරයා ගත් තීරණ <u>හමස් පෙට්ටියට</u> යෑම පිළිබඳව සේවකයෝ පුදුමයට පත් වෙති.
   i. ඉටුවී තිබීම ii. නිශ්ඵල දෙයක් වීම
   iii. ක්‍රියාත්මක වී නොතිබීම iv. වාර්තාවට ඇතුළු වී තිබීම

2. අධ්‍යාපනයේ <u>කටුකොහොල් හැරවීම</u> ගැන එතුමා සිය කථාවේදී දැඩිව අවධාරණය කළේය
   i. කැලෑ එලිකිරීම ii. පනත් සම්මත කිරීම iii. එරෙහි වීම iv. බාධක ඉවත් කිරීම

3. <u>කොලේ වහලා ගැහීමෙන්</u> ප්‍රශ්නය අවුල්වන බව විදුහල්පතිතුමා පැහැදිලි කළේය
   i. යමක් සැවීමෙන් ii. කාඩ් සෙල්ලම් කිරීමෙන්
   iii. සෙවිය නොහැකි iv.වීමෙන්මුදල් වංචා පකිරීමෙන්

4. මැදපෙරදිග ගොස් පැමිණි ඔහුගේ <u>පම්පෝරිය ඇසීමට</u> කිසිවෙක් කැමති නොවූහ
   i. උගත් වචන ii. බොරු පුරසාරම් කීම iii. ධනවත් කම් iv. සියලු විස්තර

- අංක 5 සිට 10 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන් වලට සුදුසු පදය යොදන්න

5. තමා අසා ඇති කියවා වි ඇති දේ ඇසුරෙන් ..... මගින් ගොඩනැගූ යථාර්ථය නිර්මාණයේ අන්තර්ගත වෙයි.
   i. ධ්වනිපූර්ණ ii. වාච්‍යාර්ථය iii. අවස්ථෝචිත iv. පරිකල්පනය

6. ගොවිතැන සමග ..... ම බැඳුනු අනෙක් මහාර්ඝ නිර්මාණය වැව ය.
   i. ශිෂ්ටාචාරයේ ii. සහයෝගීතාව iii. අත්‍යන්තයෙන් iv. බීජරෝපනය

7. වචන දහස් ගණනකින් කිව යුතු දෙයක් එක් ප්‍රබල ..... කිව හැකිය
   i. නාදයකින් ii. ආතතියකින් iii. විරාමයකින් iv. සංකේතයකින්

8. ග්‍රාමීය ප්‍රදේශයන්හි දක්ෂ දරුවන්ට සමාජයේ ඉහළ ස්ථරවලට ..... වීමේ හිණි මග මධ්‍ය මහා විද්‍යාලය
   i. වසන් ii. සම්ප්‍රාප්ත iii. ප්‍රතිපත්ති iv. විවේචනය

9. ඒ භාෂාව කථා කිරීමට ඉමිහිරිය, රසවත් ඇමතුමෙන් හා ..... භාවයෙන් පරිපූර්ණය
   i. වාග් ශක්තියෙන් ii. අභිමානයෙන් iii. ප්‍රතිභාවයෙන් iv. ජනකාන්ත

10. සංචාරක ජීවිතයෙන් මිදී එක් තැනක දීර්ඝ කාලයක් ජීවත්වීමේ පුරුද්දට නැඹුරුවූහ. ඒය හඳුන්වන්නේ ..... යනුවෙනි
   i. ස්ථිරවාසීතාව ii. ලියාපදිංචිය iii. ස්ථාවරභාවය iv. වළවාසස්ථාන

- 11-15 තෙක් වාක්‍යවල දක්නට ලැබෙන වරද කුමක්ද යන්න ඉදිරිපත් කොට ඇති ප්‍රකාශ අතරෙන් තෝරන්න

11. ඉක්මනින් විසඳිය යුත්තේ කතාකරන භාෂාවෙන් පොත් ලිවිය යුතුය
   i. ලිවිය යුතුද යන්න නොයොදා ලිවිය යුතුය යැයි යෙදීම
   ii. ලියනු යුතු යැයි නොයොදා කාකරන භාෂාවෙන් යැයි යෙදීම
   iii. ලේඛන රීතියෙන් යැයි නොයොදා ලිවිය යුතුයැයි යෙදීම
   iv. අනුක්‍රමයෙන් යැයි නොයොදා ඉක්මනින් යැයි යෙදීම

12. සුදත්තගේ උපදෙස් සාමාජිකයන් නොමග යවන සුලුය
   i. සාමාජිකයෝ යැයි විය යුතු තැන සාමාජිකයන් යැයි යෙදීම
   ii. සුදන්ත දුන් උපදෙස් යන්න වෙනුවට සුදන්තගේ උපදෙස් යැයි යෙදීම
   iii. නොමගට යන්න නොයොදා නොමග යයි යෙදීම
   iv. යවනසුලු යන්න වෙනුවට යන සුලු යැයි යෙදීම

13. යෝජනාවෙන් කියවෙන්නේ රට රැකීමට එකාමෙන් නැගී සිටිය යුතුය
   i. සිටිය යුතුම යයි අවධාරණය නොකොට තිබීම
   ii. යෝජනාවෙන් ඉදිරිපත් වෙන්නේ යයි නොකියා කියවෙන්නේ යයි යෙදීම
   iii. සිටිනු යුතුය යැයි යෙදීම වෙනුවට සිටිය යුතු යැයි යෙදීම
   iv. නැගී සිටිය යුතු බවය යන යෙදුම වෙනුවට නැගී සිටිය යුතුය යැයි යෙදීම

14. මාමා දැන් රක්ෂාව කරන්නේ රථවාහන මිලයට ගැනීම හා විකුණන ස්ථානයකය
   i. විකිණීම කරන යැයි නොයොදා විකුණන යැයි යෙදීම
   ii. මිලයට ගෙන යන්න වෙනුවට මිලයට ගැනීම යයි යෙදීම
   iii. දැනට රක්ෂාව කරනුයේ යැයි නොයොදා දැන් රක්ෂාව කරන්නේ යැයි යෙදීම
   iv. වෙළඳාම් කරන යන්න වෙනුවට විකුණන යැයි යෙදීම

15. මට කියන්නට ඇත්තේ සියලු දෙනාම එකාමෙන් සමගියෙන් නැගී සිටීමට අධිෂ්ඨාන කරගෙන සිටීමයි
   i. කියන්නට ඇත්තේ යැයි අනවශය කොටසක් යෙදීම
   ii. නැගී සිටීම වෙනුවට සිටීමයි යන්න යෙදීම
   iii. සිටින බවය යැයි නොයොදා සිටීමයි යන්න යෙදීම
   iv. එකාමෙන් යැයි කියා සමගියෙන් යැයි නැවතත් කීම

16. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න
   i. ේඑරාවන, එළිපෙහෙලි, අභ්‍යවකාස, උසුළු විසුළු
   ii. සෙවනැල්ල, විශ්ලේෂණ, විශේෂණ, විමර්ශණ
   iii. ලෞකික, යථාවබෝධ, ප්‍රස්ථාව පිරුළු, ප්‍රතිෂ්ඨාපන
   iv. නිලධාරී, නිෂ්ප්‍රයෝජන, ජ්‍යෝතිෂ, කාලච්ඡේදය

17. මුලින් දැක්වෙන පදයට සාමානාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න
   i. උපදේශය - අවවාදය, අනුශාසනය, දැනමුතුකම, ඔවදන
   ii. කනගාටුව - තැවුල, සන්තාපය, ඛේදය, උදහස
   iii. කෙට්ටු - කෘෂ, කැහැටු, කේඩෑරි, වැහැරුණු
   iv. උගත් - විද්වත්, වියත්, පැණසර, විග්ධ

18. විරුද්ධාර්ථවත් පද යුගලය සහිත වරණය තෝරන්න

i. මෘදු - සිනිඳු ii. තිමිර - අඳුර iii. පටුත්වය - කෝඩු iv. නිර්ණය - නිගමනය

19. "හිරු උදාවත නෙළුම් මල් පිපෙයි" යන වාක්‍යයේ උදාවන යන්න,

i. පූර්ව ක්‍රියා පදයකි ii. අසම්භාව්‍ය ක්‍රියා පදයකි
iii. මිශ්‍ර ක්‍රියා පදයකි iv. අතීත කාල ක්‍රියා පදයකි

20 සහ 21 ප්‍රශ්න වල වැරදි අදහස සහිත වාක්‍ය තෝරන්න

20. i. දර්පය යන්න අහංකාර යන්නට පර්යාය පදයකි
ii. දරුවා ඇතුකෙරේ භයින් <u>මහඩින්</u> හැඩීය. ඉරි ඇදි පදය ක්‍රියා විශේෂණයකි
iii. "දුමන" යන පදයේ දු යනු උපසර්ගයකි
iv. දක්ෂ කතුවයෙකු වන්නේ කෙසේද? යන වාක්‍ය ව්‍යාකරණානුකූලව නිවැරදිය

21. i. "තෙමේ" යන්න පුරුෂ ලිංග ඒකවචන ද "තොමෝ" යන්න ස්ත්‍රී ලිංග ඒකවචන ද වේ
ii. "කෝ" "කොයි" "කවරහුද" ආදී පද යොදා ප්‍රශ්න ඇසීමේදී උක්තය උක්ත ස්වරූපයෙන්ම සිටී
iii. "සමග" "කැටුව" යන නිපාත එක්ව යන අර්ථය ගනී. එවිට ඒ සමග ඇති නාමපදය අනුක්ත වේ
iv. ව්‍යංජනයකය පරව බැඳෙන "ර්" වෙනුවට රේඵයත් ව්‍යංජනයකට පරව බැඳෙන "ය" වෙනුවට රකාරාංශයත් යො දනු ලැබේ.

22. දී ඇති වචන ගොනු අතුරින් අන්‍යෝන්‍ය වශයෙන් ලංවන කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේලිය වන්නේ,

i. කොහොඹ, හල්මිල්ල, බුරත, වීර
ii. සරම, බැනියම, කමිසය, අමුඩය
iii. කඩුව, පොල්ල, දුන්න, බොලොක්කය
iv. මාල, වලලු, මුදු, තෝඩු

23. අර්ධ ස්වර පමණක් ඇතුළත් වාක්‍ය තෝරන්න

i. ය ර ල ව ii. ය ම ම බ ව iii. ග ඩ ද ඹ iv. ශ ෂ ස හ

24. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න

i. ක්‍රියාපද - නිරෝගිවෙත්වා, එනු, එමින්, කරන ii. නිපාත - පතා, එපා, මුත්, අනු
iii. තද්ධිත - ළැදියා, පාපීය, ජාතික, මූලික iv. කෘදන්ත - බලන, කියූ, නැටිලි, ගැයුමන්

- අංක 25-26 ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න

25. නිසි ඵල ලබාගත නොහැකිවීම

i. ගහෙන් දිය බී මුහුදට ආ වඩන්නා සේ ii. දත් නැතිදා උක්දඬු ගිනි තපින්නද?
iii. බත් ඇති දා කොස් තිත්තලු iv. ගැරඩින් පෙනේ කරන්නට හදනවා වගේ

26. වැරදි කරුවාගෙන්ම පිහිට පැතීම

i. හොරාගෙ අම්මාගෙන් පේන ඇහුවා වගේ ii. බල්ලාගේ වැඩේ බූරුවා කෙරුවා වගේ
iii. නයි පොළොං දබරය වගේ iv. කපන්ට බැරි අත ඉඹින්නා වගේ

27. පහත දී ඇති අක්ෂර ගැලපීමෙන් සූචනය වන නිවැරදි පුද්ගල නාමය ඇතුළත් වරණය වන්නේ,

i. බු දු හු අ සෙ න් සෙ රි අ ii. ර නෝ ම ත් ජ ම ය න ත් ල
iii. ම ල වි කු ර මා ත් න ර ම ග iv. ක න යා ජී සේ බි නා ක ය

28. ශිෂ්‍යාව යන පදයේ අනියමාර්ථ ඒකවචන අනුක්තපදය සහිත වරණය තෝරන්න
   i. ශිෂ්‍යාවන් ii. ශිෂ්‍යාවක්
   iii. ශිෂ්‍යාවක iv. ශිෂ්‍යාවෝ

29. ගයන්න, නටනවා, දුවයි, බලති යන ක්‍රියාපදවල ධාතු ප්‍රකෘති පිළිවෙලින්
   i. ගය, නට, දුව, බල ii. ගසා, නටා, දුවා, බලා
   iii. ගයයි, නටයි, දුවයි, බලයි iv. ගැයූ, නැටූ, දිවූ, බැලූ

30. වඟ + මුතු එයින් + ඇත ේද + තඹ + පලා යන පද නිවැරදි ලෙස සන්ධි කර ඇති පද පේළිය තෝරන්න
   i. වංමුතු එයිනැත දැත තම්විලා ii. වගමුතු එයින්ඇත දෙඇත තම්බවිලා
   iii. වංමුතු එයනැත අත්දෙක තඹපලා iv. වගතු එයින්එහා දැත තඹරලා

- අංක 31-35 දක්වා දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න

31. i. දෙරටේම නියෝජිතයෝ ඇමතිවරු ඉදිරියේ ගිවිසුමට අත්සන් තැබූහ
   ii. පළාත් සභාවේ සභිකයන් විසින් ඇමතිතුමා පිළිගැනිණි
   iii. ක්‍රීඩකයෝ පුහුණු කරනු ලැබුවේ උපදේශකවරුය
   iv. සමහරු පොත්පත් කියවීමෙන්ම දැනුම දියුණුකරගනී

32. i. උද්යෝගයෙන් හා පරිත්‍යාගයෙන් ක්‍රියාකළ අපේ ජාතික වීරයන් සියලු බාධා ජයගත්හ
   ii. අපරාධ මැඩලීම සඳහා පොලිස් නිලධාරීහු මහජන සහායද ලබාගත යුතුය
   iii. මා ඉදිරි දිනක ගමට එතියි සිතමින් පියාණෝ කල් ගෙවති
   iv. අපකිසිවෙකුට බිය නොවේයැයි කීමෙන් හෙළිවන්නේ අපතුළ ඇති බියමය

33. i. කලාකාමී තරුණයා විසින් රඟහල ඉදිකරන්නේ විශාල ධනයක් වැයකරමිනි
   ii. අළුතින් පත්වී ආ ලේකම්තුමා දක්ෂයෙක්ද?
   iii. අද රැස්වීමට සේවක සේවිකාවෝ පැමිණ නැත
   iv. මේ දේශනය පවත්වමියි ඒදා මම පොරොන්දු වූ බැවින් අද පැමිණියෙමි

34. i. මෙරට පැමිණි ඉංග්‍රීසීහු මුලදී පාලනය කළේ මුහුදුබඩ ප්‍රදේශ පමණි
   ii. අශෝක චක්‍රවර්තීහු පිටරටවලටද ධර්ම දූතයෝ යැවූහ
   iii. සේවකයන් නියමිත කාලයතුළ වැඩ කොටස නිම නොකරතියි සිතූ ස්වාමියා අතිකාල ක්‍රමයක් යෝජනා කළේය
   iv. මැණියන් විසින් අපි නිරකුරුවම රක්ෂා කරන්නීය

35. i. සැකකරුවන් රක්ෂිත බන්ධනාගාර ගතකරනු ලැබූහ
   ii. ළමයා නිසි ඉගෙනීමේ යෙදේ නම් ඔහු උගතකු වනු නිසැකය
   iii. විදුහල්පතිතුමා සභාව අමතා සාරවත් කථාවක් පැවැත්වූහ
   iv. විවිධ ප්‍රසංගයේ අමුත්තෙක් ලෙස මා ද ඇරයුම් ලද නමුත් මම එහි නොගියෙමි

36. "ඉතා ඉක්මනින් විසඳිය යුත්තේ කතාකරන භාෂාවෙන් ලිවිය යුතුය"
   i. ලිවිය යුතු නොවේ යන්න ලිවිය යුතු යැයි දැන්වීම
   ii. ලිවිය යුතුද යන්න වෙනුවට ලිවිය යුතු යැයි ඉදිරිපත් කිරීම
   iii. ලියන භාෂාවෙන් යැයි නොලියා කතා කරන භාෂාවෙන් යයි යෙදීම
   iv. ක්‍රමානුකූලව යන්න වෙනුවට ඉතා ඉක්මනින් යැයි යෙදීම

37. සභාපතිතුමාගේ කතාව සාමාජිකයින් නොමග යන සුලුය
   i. සභාපතිතුමාගේ කතාව යන්න වෙනුවට සභාපතිතුමා පැවැත්වූ කථාව යැයි නොයෙදීම
   ii. සාමාජිකයෝ යන්න නොයොදා සාමාජිකයන් යැයි යෙදීම
   iii. යවනසුලු යන්න වෙනුවට යනසුලු යැයි යෙදීම
   iv. නොමග යන්න වෙනුවට නොමගට යැයි නොයෙදීම

- අංක 38-40 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති ප්‍රකාශයට වඩාත් සමීප අර්ථය ලබාදී ඇති වරණය තෝරන්න

38. සාහිත්‍ය කෘතියේ අන්තර්ගතය නිර්මානකරුවා ගේ අත්දැකීම් මත පදනම් වෙයි. ඔහු අසා දැක තිබෙන විඳ ඇති දේ ඇසුරෙන් පරිකල්පනය මගින් ගොඩනැගූ යථාර්ථය නිර්මාණයේ අන්තර්ගත වෙයි.
    i. සාහිත්‍යකරුවාගේ පරිකල්පනයටත් අන්තර්ගතයටත් හේතුවන්නේ යතාර්ථය නිසා ඇතිවූ අත්දැකීම් සම්භාරයයි
    ii. නිර්මාණකරුවාගේ අත්දැකීම් ඇසුරෙන් පරිකල්පනයෙන් මතු කරගත් යථාර්ථය නිර්මාණයේ අන්තර්ගතය වෙයි
    iii. බිහිවන යථාර්ථය සාහිත්‍ය කරුවාගේ අත්දැකීම් මත අනුව පරිකල්පනය කෙරේ
    iv. සාහිත්‍ය කෘතියේ අන්තර්ගය අත්දැකීම් මත පිහිටා පරිකල්පනය කිරීමේ අන්තර්ගතය අත්දැකීමකි

39. රචනා රීතිය යනු භාෂා සාහිත්‍යයේදී විශිෂ්ඨ ලෙස කෙරෙන පද ගැලපීමයි. එය ලේඛකයාගේ වචන තෝරාගැනීම හා වචන ගැලපීමත් කථන ක්‍රමයත් යන දෙකෙහිම සංකලනයෙන් සකස්වන ප්‍රකාශන උපක්‍රමයකි
    i. ආකාර දෙකක වචන සංකලනයේ ප්‍රකාශන උපක්‍රමය රචනා රීතියයි
    ii. භාෂා භාවිතයේදී මනා ලෙස වචන සැකසුමෙන් ගැලපීම යනු රචනා රීතියයි
    iii. ලේඛකයෙකුගේ වචන සැකසුම හා කථන ක්‍රමයේ ගැලපීමෙන් විස්තර කෙරෙන ප්‍රකාශන උපක්‍රමය රචනා රීතියයි
    iv. විශිෂ්ට පද ගැලපීමත් ලේඛකයාගේ ප්‍රකාශන උපක්‍රමයත් වන්නේ රචනා රීතියයි

40. භාෂාවේ භාවිත ගුණය යනුවෙන් අදහස් වන්නේ,
    i. ව්‍යංගාර්ථවලින් පරිපෝෂිත වාං මාලාවක් යොදා ගැනීමේ හැකියාව
    ii. සිතේ ඇතිවන ප්‍රහර්ෂය වර්ණනා කිරීමේ හැකියාව
    iii. සමාස පද බහුලව භාවිත කොට නිර්මාණය රසවත් කිරීමේ හැකියාව
    iv. භාවයන් ප්‍රබෝධවත් කොට අත්දැකීමට සහභාගී කරවා ගැනීමේ හැකියාව

සිංහල භාෂාව හා සාහිත්‍ය II

සැ.යු. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
කාලය පැය 02
II පත්‍රය

1. (1) සිට (X) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංක ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. (අ) සිංහල අක්ෂර මාලාවේ තාලුජ අක්ෂර දෙකක් ද උෂ්මාක්ෂර දෙකක්ද ලියා දක්වන්න

(අ) ..... (ආ) .....

II. ඊ හා ඣ යන අක්ෂර වලින් ඒන වචන දෙක බැගින් ලියන්න

(අ) ..... (ආ) .....

III. පහත සඳහන් පද දෙක විසන්ධි කොට ලියන්න
(අ) පන්ලක්ෂ - ..... දුරාචාර - .....
(ආ) පිළිතුරු , දැගුල් යන පදවල සන්ධි නාමය ලියන්න

IV. (අ) ගොයම්මිටි ගොඩ ගැසූවිට හඳුන්වන නම ලියන්න
.....
(ආ) උණ පුරුක් ප්‍රයෝජනයට ගෙන වක්කඩ අසල අටවන්නේ කුමක්ද?
.....

V. "මුණ රවාගෙන ගොස් ගෙට වැදිලා
පූන නූල ඇද දමමින් බිඳලා"
(අ) ඉහත කවි දෙපදයෙන් පූර්ව ක්‍රියා පදයක් ලියන්න
.....
(ආ) මිශ්‍ර ක්‍රියා පදයක් ලියන්න
.....

VI. (අ) හේන ගිනි ලෑමෙන් පසු ප්‍රථම වර්ෂාව හඳුන්වන නම ලියන්න
.....
(ආ) ගොවීන් "මහළුකා" යනුවෙන් හඳුන්වන්නේ කවුද?
.....

VII. පහත දැක්වෙන ක්‍රියා පදවල ප්‍රකෘති වෙන්කොට දක්වන්න

(අ) රකිනවා - .....(ආ) බොනවා - .....

VIII. "නුඹ සා මඩුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රුක සද මල් කැනක සිරි ගත"
ඉහත කවි පදවල ***සඳ සද*** අර්ථ වෙන් වෙන්ව ලියන්න.
(අ) සඳ - ..... (ආ) සද - .....

IX. (අ) ශබ්ද කෝෂයේ "කලකල" යනුවෙන් දක්වා ඇත්තේ කුමක්ද?
(ආ) ප්‍රේක්ෂකයායේ සිතේ කුතුහලය හා ආතතිය උපරිම ලෙස කුළුගැන්විය හැකි අවස්ථා හඳුන්වන නම ලියන්න

X. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
"සිය බිළිඳු දරුවා වඩාගත් ගැහැණිය මාලිගාව අසල වැලපෙන්නට වූවාය"

2. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වඩන 250 කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තරපත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළගැස්වීමේදී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- යොදාගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ මගපෙන්වීමක් අදාල විස්තර ඇසුරෙන් ලබා ගන්න.

(අ) වර්තමානය වන විට සමස්ත ලෝකයේ ම පාරිසරික වෙනස්කම් රැසක් සිදුවෙමින් පවතී. එක් රටක අධික සීතලෙන් මිය යන අතර තවත් රටක දැඩි නියඟයෙන් පීඩා විඳී. විවිධ රටවල ජනතාවට ජලය සොයා බොහෝ දුර යාමට සිදුවී ඇත්තේ ජල සම්පත සීමිත නිසාය. කෙසේ වෙතත් මේ වන විට ගෝලීය උණුසුම වැඩි වෙමින් පවතී. විශේෂයෙන් දුප්පත් රටවල ජනතාවට සිදුව ඇති පීඩනය අති මහත්ය. මේ තත්වය එක් රටකට පමණක් විසඳිය හැකි දෙයක් නොවේ.

(ආ) සංවර්ධනය වෙමින් පවතින රටවල ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ විදේශ විනිමය හිඟයයි. මේ නිසාම බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් විදේශ විනිමය උපයා ගැනීමට දැඩි පරිශ්‍රමයක් ගනී. මේ නිසාම රටවල් සංචාරක ව්‍යාපාරය කෙරේ දැඩි උනන්දුවක් දක්වයි. මේ රටවල ඓතිහාසික නගර, වනෝද්‍යාන, හිතකර වෙරළ පරිසරය ආදිය නැරඹීමට සංචාරකයෝ එති. සංචාරකයන් නිසා සිදුවන අහිතකර ලක්ෂණ ඉවත්කොට මෙම කර්මාන්තය දියුණු කොට අපරට සංවර්ධනයට දායක කිරීම කළ යුතුව ඇත.

(ඉ) ශ්‍රී ලංකාවේ ජාතීහු කිහිපයක් වෙසෙති. ඔවුන්ගේ සංස්කෘතිකාංග විවිධ වේ. එම විවිධත්වය නිසාම රටකට ඇති වන්නේ විවිධ ගැටළු සහගත තත්ත්වයන්ය. ආගම, භාෂාව, ඉඩම් පරිහරණය ආදී තත්වයන් උග්‍ර අතට හැරෙමින් පවතී. මේ නිසාම විවිධත්වය තුළ ඒකීය භාවය රටකට අවශ්‍ය වේ. එසේ නොවුනහොත් නුදුරු අනාගතයේදී ම නැවත මේ රට යුධ පිටියක් වනු නොඅනුමානයි.

(ඊ) ඉබෝලා, සාර්ස්, ඉන්ප්ලුවෙන්සා රෝග අතරට අළුතින්ම ආගමනය වී විශ්වීය බලපෑමක් කර සෙසු රෝග වලින් සිදුවන මරණ සංඛ්‍යාව දෙගුණ තෙගුණ කිරීමට සමත් වෛරස් රෝගයකි කොරෝනා. මේ තත්වය ඉතා කෙටි කලකින් නිර්මාණය වූවක් නොවේ. අත්තනෝමතික හා සාහසික ලෙස පරිසරයට කරන හානිය මෙහි ව්‍යාප්තියට බලපා ඇති එක් විශේෂ හේතුවකි. පරිසර හානිය තුළිනන් මෙහි වේගවත් ව්‍යාප්තිය මිනිසා කටයුතු කර ඇත. බටහිර රටවල ශීඝ්‍ර දියුණුව තුළින් වත් මේ සඳහා ක්ෂණික ප්‍රතිකාර සොයා ගැනීම අසීරු වී ඇත. ශ්වසන පද්ධතිය අකර්මන්‍ය කරන මෙම වෛරසය මාරාන්තිකය. පරිසරය පිරිසිදු හා හිතකර නම් මෙය ව්‍යාප්තිය හීන වේ. පරිසර සංරක්ෂණය යථාර්ථයක් කළ යුතුව ඇත. ස්වභාවධර්මය අසිරිමත්ය.

3. පහත දැක්වෙන පාඨය වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාවද සාරාංශය අග ලියන්න.

සෑම පුද්ගලයෙකු තුළ ම කලා නිර්මාණයකින් නිරූපිත ජීවන තතු සමාජ තතු දැකිය හැකිය. අවබෝධ කරගත හැකිය. එහෙත් එහි නිර්මාපකයා දැකිය නොහැකිය. නිර්මාණයේ පසුබිම දැකිය නොහැකිය. මේ අදහස් සාමාන්‍යයෙන් පිළිගන්නා නමුදු ඒවා ඒතරම් ම නිරවද්‍ය නොවේ. නිර්මාණයන්ගේ නිර්මාපකයා දැකිය හැකිය. එහි අර්ථය ඒ පුද්ගලයාගේ ස්වභාවය දැකීම නොවේ. ඇතැම් විට කෘතියකට වඩාත් සමීප වූ විට කෘතියේ නිර්මාපකයාගේ හැඩරුව, රුව ගුණ පවා දැකීමට පුළුවන. මේ අර්ථ සම්පන්න ක්‍රියාවක් ලෙස කෙනෙකුට පෙනෙනු ඇත. සැබැවින්ම මෙය භාවාත්මක ක්‍රියාවක් විය හැකිය. තතු එසේ වුවත් ඉන් අනාවරණය වන එක් වැදගත් දෙයක් ඇත. එනම් නිර්මාණය මෙන්ම නිර්මාපකයා පාඨකයාගේ ජීවිතයට කොතරම් දැඩිව සම්බන්ධ වන්නේ ද යන්නයි. ඒ දැඩි සම්බන්ධය නිසා පාඨකයා පරිකල්පනයෙන් බොහෝ දේ දකී.

4. සුප්‍රසිද්ධ වෛද්‍යවරයෙකුගේ අවමගුල් අවස්ථාවක් ගැන විස්තර කෙරෙන මේ පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

ඔබට කීම් එනමුත් නන් දෙසින් අවුත්
ලොකු කුඩා හිතවත් දන නෑ නොනෑ
උනට දුන් පණ හා ඔබ සුන් පණත්
සිහි කළෝ මුහුණේ අඳුරින් මහත්

ගමන දැක්ම වූවොත් වෙනදා ඔබේ
පිපෙන මූණු දනන් හැම මාවතේ
අඳුරු වී හැකිළී ගිය සේ බලත්
වෙනස මේ ගමනේ දැනුණේ තදින්

බැසමු වැන්දෙමු ගත්තෙමු පන්සිලුත්
පිරිකරත් ඇරදුන්නෙමු ලත් සෙයින්
මහණ මූණ නොවී මඳකුත් පහන්
වරදකින්ද පියාණෙනී ඒ ඔබේ

1. උනට දුන් පණ හා ඔබ සුන් පණ යන යෙදුමෙන් වෛද්‍යවරයා ගැන හෙළිවන තොරතුරු දෙකක් ලියන්න.
2. මෙතුමාගේ එදා ගමනත් අද ගමනත් දුටු ජනයා තුළ වූ හැඟීම් වෙන් වෙන්ව ලියන්න.
3. ‘‘බැසමු වැන්දෙමු’’ යන ප්‍රකාශයෙන් ඉදිරිපත් වන ඉරියව්ව සඳහා වරතමානයේ ව්‍යවහාර කරන යෙදුම කුමක්ද?
4. ‘‘පිරිකරත් ඇර දුන්නෙමු ලත් සෙයින්’’ යන්නෙන් පවුලේ අය ගැන කවර තොරතුරක් හෙළි වේද?
5. ‘‘මහණ මුහුණු නොවී මඳකුත් පහන්’’ මේ කොටසින් ඉදිරිපත් වන අර්ථය තනි වාක්‍යයකින් ලියන්න.

5. ලේඛකයෙකුගේ ගුණ සමරු උත්සවයකට සහභාගී වූ පුවත්පත් වාර්තාකරුවෙකුගේ දළ සටහනක් පහත දැක්වේ. එය ඇසුරින් පුවත් පතක් සඳහා වචන 100 ක පමණ වාර්තාවක් ලියන්න.

මාර්ටින් වික්‍රමසිංහ ගුණසමරුව
කුරුණෑගල නගර ශාලාව
2019.11.30 ප.ව. 2.00 – 6.00
මූලාසනය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
ප්‍රධාන දේශනය ගුණදාස අමරසේකර මහතා
මාර්ටින් වික්‍රමසිංහ මහතා නවකථා කෙටිකථා
රචකයෙකු වශයෙන්, ඔහුගේ කෘති දෙකක් ගැන සාකච්ඡාව
සහභාගීත්වය - ගිහි පැවිදි කිහිපදෙනක් පාසල් සිසුන්
මෙයට සමගාමීව මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ ඡයාරූප හා
පොත් ප්‍රදර්ශනයක් නගර ශාලා භූමියේ පැවැත්වුනි.
සංවිධානය ඇතුගල්පුර සාහිත්‍ය සමාජය

නැතහොත්

තරබාරුකම අද වන විට පාසල් දරුවන් අතර බෙහෙවින් දක්නට ලැබෙන ගැටළුවකි. මේ නිසාම සිදුවන වෙනත් ආන්තරා ද තිබේ. මේ පිළිබඳව පාසල් දරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් විද්‍යාලයීය සෞඛ්‍යය සංගමය මගින් සංවිධානය කොට තිබේ. ඒ සඳහා පහත කරුණු උපයෝගී කරගෙන සුදුසු දැන්වීම ක් සකස් කරන්න.

දිනය - 2020.04.05 පෙ.ව. 8.30 – 11.30
ස්ථානය - විද්‍යාලයීය කන්නන්ගර ශාලාව
දේශනය - වි.වෛද්‍ය මානෙල් ගීකියනගේ, වෛද්‍ය සිරිල් මීගස්තැන්න
සහභාගීත්වය - 9 ශ්‍රේණිය - 13 ශ්‍රේණිය දරුවන්

කාලය ලපැය 02 යි

III පත්‍රය

- **උපදෙස් දී ඇත පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**

1. (1) සිට (x) තෙක් අති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I. "උපාය නම් තමා කිමද? මෙසා මහත්වූ තොපගේ උපායෙකින් වැඩකුත් නිමාවෙකුත් දුටු දෑ නැති"
(අ) මෙසේ කීවේ කාටද?
(ආ) මෙසේ කීමට හේතුව කුමක්ද?

II. .....
.....
දකුතු රහන සුරහන රහ ලාගේ
උමතු නොවද කෙලෙසක සිත කාගේ

(අ) මෙම කවියේ මුල් පද දෙක ලියන්න.
(ආ) "කුසුම සරාගේ පැලද සරාගේ යන්නෙහි තේරුම ලියන්න.

III. "වහන්සේ හෙ මට මුසාවෙයි. මා විසින් බොහෝ සන්හු දනැ මරන ලදහ"
(අ) "හෙමට" යනුවෙන් මෙහි හඳුන්වන්නේ කුමක්ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් පොත අයත් සාහිත්‍ය යුගය ලියන්න

IV. "ඔබ දෙදෙන මා සමග
නොආවොත් යන්ට වේ"
(අ) මෙසේ යාමට අදහස් කරන්නේ කොතැනටද?
(ආ) මේ ප්‍රකාශය එන ග්‍රන්ථයේ කතුවරයා ලියන ලද ස්වයං ලිඛිත චරිතාපදානය ලියන්න

V. "ඔව්. එයත් මෙහෙ හිටියා උඹ ලඟ සල්ලිහෙම තියෙනවද?"
(අ) මෙහි "එයා" "උඹ" යනුවෙන් හඳුන්වන දෙදෙනාගේ නම් ලියන්න.
(ආ) මේ ප්‍රකාශය කරන අයගේ නම ලියන්න.

VI. "කඳු බෑවුමක දං - බෝවිටි පඳුරු තලා
පහලට ඇදී පරමල් පෙති ඉවත නොළා"
(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කර ලියන්න.
(ආ) තුන්වන පද්‍ය පදයේ අර්ථය ලියන්න

VII. (අ) "පාලිධම්ම පදට්ඨ කතාව" ඇසුරින් සකස් කළ ග්‍රන්ථය කුමක්ද?
(ආ) පාලි ජාතකට්ඨ කතාව ඇසුරින් සකස් කළ ග්‍රන්ථය ලියන්න

VIII. පහත සඳහන් ග්‍රන්ථවල කතුවරුන් නම් කරන්න
(අ) සාහිත්‍ය විද්‍යාව
(ආ) නන්දන ගීත

IX. (අ) ජනකවිය අනුරාධපුර යුගය දක්වා දිගු ඉතිහාසයකට නැකම් කියන බව පැවසෙන්නේ කුමන ග්‍රන්ථයකට අනුවද?
(ආ) "මේ වැඳීම් මාන තොප අතින් අද ඇසීමි" හෝ "මේ වැඳීම් මාන" යනුවෙන් අදහස් කළේ කුමක්ද?

X. (අ) සෑම කතා වස්තුවක්ම ඉදිරිපත් කිරීමට ප්‍රථම එම කථාව දැක්වීමට හේතුව ප්‍රකාශ කරන ග්‍රන්ථය කුමක්ද?
(ආ) 5 වන කාශ්‍යප රජතුමා රචනා කල දැනට හමුවී ඇති පැරණිම කෘතිය කුමක්ද?

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න

I. "නගන ලද දළ පුඩු සේසත් ඇති එක් සියයක් රාජාසන ආදී වූ පිළියෙල කොට තබන ලද **ශ්‍රී විභූතීන්** දැක මහ බෝසතාණන් වහන්සේ විසින් වදාරන ලද ක්‍රමයෙන්ම සියල්ල කොට සේනා මධ්‍යයට වැද බොහෝ දෙන **ක්ෂෝභ** කොට තමන්ගේ මියුලු නුවරට පලා ගියහ"

(අ) මේ පාඨය හා සම්බන්ධ සිද්ධිය කෙටියෙන් ලියන්න

(ආ) ඉරි ඇඳි පදවලට අර්ථ සපයන්න

II. "මෑ දන්නා ශිල්පත් උගත් හෙයින් මුත් **සයංසිද්ධ** නොවන්නේ වේද? ඇගේ එ **බැවුම්** පලවා මමත් ශිල්ප උගනිමි"

(අ) මෙස් සිතීමට මුල්වූ අවස්ථාව කෙටියෙන් ලියන්න

(ආ) ඉරි ඇඳි පදවලට අර්ථ සපයන්න

III. " යොදා සවන් වෙණ නද රස් සුලබව
නදා එකඟ සික් වන නොම සකොබව
සදා කුලය නොහැරම එන අසුබව
ඒදා ගියේ රිලවුන් සන්සල බව

(අ) වීනා නාදය ඇසීම නිසා මෙහි කියැවෙන සත්ත්ව වර්ගයාට සිදුවූයේ කුමක්ද?

(ආ) ඔවුන්ගේ පරම්පරා පුරුදු මොනවාද?

IV. "මුවපත් වූයේ - නියත විනාසේ
මේ මොහොතේ කිම් කරන්නෙමි දෝ
මුළා වී මග නොපෙනේ"

(අ) ඉහත ප්‍රකාශ කරන අයගේ චරිතයේ විශේෂ ලක්ෂණ ලියන්න

(ආ) ප්‍රකාශය කළ අය අනතුරුව කුමක් කළේද?

V. "අඩල වැඩක් නෑ ළමයා. මං දැන් හොඳටම වයස මිනිහෙක්. මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ."

(අ) මේ සිද්ධියට පදනම් වූ අවස්ථාව කෙටියෙන් ලියන්න

(ආ) ඔහු හොඳින් දන්නා බවට ඉදිරිපත් කරන සාධකය කුමක්ද?

3. (I) කාය ශක්තිය පරදා බුද්ධිමය හැකියාවේ ප්‍රබලත්වය කියාපෑම

(II) ඒ සඳහා අවස්ථා හා සිද්ධි යොදාගෙන තිබීම

උම්මග්ග ජාතකයේ එන සතරකන් මන්ත්‍රණය පාඩමෙන් සිත්ගන්නා අයුරින් ඉදිරිපත් කොට ඇති ආකාරය උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න

නැතහොත්

(I) කුඩා කළදීම දරුවන් ගුණ දහමින් පෝෂණය කිරීම

(II) ඒ සඳහා විවිධ කාව්‍ය, උපක්‍රම යොදා ගැනීම "මුණිසිරිපා සිඹිමින්නේ" කාව්‍ය පන්තියෙන් රසවත්ව කියා ඇති ආකාරය උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

4. I "සාමානයෙන් පැරණි ගමකට වඩා බැද්දේගම වෙනස් ගමක්" බවද

II ඒ සඳහා භාෂාව භාවිත කොට ඇති ආකාරය ද උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

"ගංගාවේ සංගීතය" පද්‍ය පන්තියෙන්

I. ස්වභාව ධර්මය ආශ්‍රයෙන් සහෘදයා තුළ සංකල්ප රූප මැවීමේ දක්ෂතාව

II. ගඟ ජීවිතයට සම්බන්ධ කරමින් ඉදිරිපත් කරන ජීවන දර්ශනය

උදාහරණ දෙක බැගින්වත් දෙමින් විස්තර කරන්න.

5. ඒ ඒ අවස්ථාවට ගැළපෙන ලෙස විරිත වෙනස් කිරීමට කතුවරයා තුළ වූ ප්‍රතිභාව "ගුත්තිල කාව්‍ය" වඩාත් රසවත් වීමට හේතු වී ඇත. උදාහරණ දෙක බැගින්වත් දෙමින් පැහැදිලි කරන්න.

6. ජන කවියේ ඇති සුවිශේෂ ලක්ෂණය උපදෙස් කවි තුළද දැකිය හැකිය. උදාහරණ දෙකක්වත් දෙමින් විස්තර කරන්න.

7. ගුරුළුගෝමි පඩිවරයා අමාවතුරේ භාවිතකොට ඇති භාෂා ශෛලිය පිළිබඳව විස්තරයක් අදාළ පාඩම ඇසුරින් නිදසුන් දෙකක්වත් දෙමින් විමසීමක් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

11 ශ්‍රේණිය - අනාවරණ පරීක්ෂණය 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II

නම/අංකය : ..... **කාලය : පැය 03 යි.**

සැලකිය යුතුයි:

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ **තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. මල්ලී සියල්ල **ඉස්පිල්ලක් පාපිල්ලක් නැර** අපට පැවසුවේ ය.
(1) සියලු ම ඉස්පිලි පාපිලි සහිත ව (2) කිසිවක් ම අත් නො හැර
(3) ඇතැම් කොටස් අමතක කර (4) සෑම දෙනා පිළිබඳ ව ම

02. නැන්දම්මාගේ **කුම්මැහිකම** ගැන ඈ නො සතුටෙන් පසු වූවා ය.
(1) දරුණුකම (2) කුසීතකම (3) මසුරුකම (4) නූගත්කම

03. ඔහුගේ රෝගය **නිට්ටාවට** සුව වෙතැයි දරුවන් තුළ වූ බලාපොරොත්තුව සපල විය.
(1) සම්පූර්ණයෙන් ම (2) ඉක්මනින් ම (3) හොඳින් ම (4) හෙදකමින් ම

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. වෙස්සන්තර ජාතක කාව්‍යය ..... සාහිත්‍ය ධාරාවෙන් බැහැර වූ කෘතියක් ය යන්න විචාරක මතයයි.
(1) ප්‍රබුද්ධ (2) විශිෂ්ට (3) උත්කෘෂ්ට (4) විදග්ධ

05. කවිත්වය ..... පහළ වන්නක් නොව නිතර පුරුදු පුහුණු කිරීමෙන් සකසා ගත යුත්තකි.
(1) එක වර (2) නිරායාසයෙන් (3) පරිකල්පනයෙන් (4) අභිමානයෙන්

06. සාහිත්‍යකරුවා ව්‍යංගාර්ථවලින් ..... වාං මාලාවක් යොදා ගැනීම නිසා නිර්මාණයේ රසය තීව්‍ර වේ.
(1) පරිපෝෂිත (2) සම්පිණ්ඩිත (3) ප්‍රවිකසිත (4) සමන්විත

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) සනාතන, ආශිංසන, උද්ධමනය, ආන්දෝළනය
(2) ජනගහණය, අද්‍යතන, පරිවර්තන, ගුරුතුමානණි
(3) වෛවර්ණ, මුරණ්ඩු, ලතෝනිය, ස්තම්භය
(4) උද්ඝෝෂණ. ප්‍රශස්ත, කෙළවර, පිරිවෙන

08. අපූරු, උතුර, විනීත, පාතාලය යන වචනවල **දෙවෙනි අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල
(2) කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල,ඇලපිල්ල
(3) දීර්ඝ පාපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, ඇලපිල්ල
(4) කෙටි පාපිල්ල, ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල

09. 'රළ' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,
(1) මූර්ධජ ය. (2) දන්තජ ය. (3) ඕෂ්ඨජ ය. (4) කණ්ඨජ ය.

10. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) රඹුක්කන, මාතලේ, පඬුවස්නුවර, වස්කඩුව
(2) හම්බන්තොට, ගම්පහ, යටියන්තොට, කෑගල්ල
(3) කතරගම, ගන්නෝරුව, රත්නපුර, ජයන්තිපුර
(4) ගාල්ල, තවලම, නුවරඑළිය,ලංකාපුර

11. අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) මිනිසෙක්, වඳුරකු, වවන්නන්, සතුරන්
(2) තොප, කුරුල්ලන්, කාන්තාවක, දිළින්දන්
(3) මා, ඔවුහු, අප, සිංහයන්
(4) ඌරකු, දැරියක, පින්වත්තු, දක්ෂයෝ

12. 'හේන් ගොවියාගේ මිහිරි පැල්කවි අප දෙසවන් පිනවයි.' යන වාක්‍යයේ **'ගොවියාගේ'** යන්නෙහි විභක්තිය කුමක් ද?
(1) ආධාර (2) ප්‍රථමා (3) සම්බන්ධ (4) කරණ

13. 'සුපිරිසිදු' යන්න අයත් වන්නේ,
(1) අව්‍ය සමාසයට ය. (2) අන්‍යාර්ථ සමාසයට ය.
(3) විභක්ති සමාසයට ය. (4) විශේෂණ සමාසයට ය.

14. 'ප්‍රදේශ + ඊය' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) ප්‍රදේශීය (2) ප්‍රදේශයීය (3) ප්‍රාදේශයීය (4) ප්‍රාදේශීය

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) විධි ක්‍රියා- කරව, අසාපන්, වඩිනු මැනවි, සිනාසෙවු
(2) සන්ධි - මෑත, නොයෙක්, උපනුපන්, දුප්පත්
(3) තද්ධිත - නිපුණතා, පුතණුවෝ, සිසිලස්, කරටි
(4) සමාස - අනුබල, නිල්අහස, තුරුලතා, රැකුම්

16. **අසම්භාව්‍ය ක්‍රියාවක්** යෙදී නැති වාක්‍යය කුමක් ද?
(1) දරුවන් දිනද්දී දෙමාපියෝ සතුටින් උදම් ඇනූහ.
(2) කුරුලු රැන රන්වන් අහස් ගැබ මැනවින් සරසති.
(3) නොකඩවා වැසි වැටුණොත් නාය යාම් සිදුවේවි.
(4) සුළං හමන විට සරුංගලය ඉහළ අහස කරා ඇදුණි.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

17. අපේ සංස්කෘතිකාංග ශ්‍රී ලාංකේය **අනන්‍යතාව** පෙන්වන කදිම කැඩපතකි.
(1) තමාට ම අයත් බව (2) විශිෂ්ට බව
(3) වෙනස් බව (4) ස්වාධීන බව

18. විවිධ පුෂ්ප ඵල පල්ලවයන්ගෙන් සමන්විත **පාදප ශ්‍රේණි** වනය විචිත්‍රවත් කරයි.
(1) කඳු පන්ති (2) දිය ඇලි (3) ගස් පේළි (4) තුරු ලතා

19. සිබිල් වෙත්තසිංහ මහත්මිය ළමා සාහිත්‍යයට **පුරෝගාමී මෙහෙවරක් කළ** මාතාවකි.
(1) මුල්වී කටයුතු කළ (2) විශිෂ්ට සේවාවක් කළ
(3) අමිල සේවාවක් කළ (4) එකමුතු ව කටයුතු කළ

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී **නොපවත්නා** පද පේළිය තෝරන්න.
(1) වඩදිය, මරක්කලාහේ, මාරියාව, වල්ලම
(2) කුරුලු පාළුව, මාප්පිඩ, ඉපනැල්ල, වප්පැන
(3) යතුකැටය, කියත, නියන, අතකොළුව
(4) පිදුම, පෙරවදන, පටුන, අකාරාදිය

21. එක් එක් පද පේළියේ **සමානාර්ථ යෙදුම් පමණක්** ඇතුළත් පද පේළිය තෝරන්න.

(1)	අනල - ගින්න,	ඓශ්වර්යය - පුදුමය,	කලල - මඩ,	ළකල - සිත්ගන්නාසුලු
(2)	මුඛ්‍ය - ප්‍රධාන,	පරිහාසය - අවනම්බුව,	ප්‍රාසාදය - මන්දිරය,	රජත - රිදී
(3)	භූෂණ - රජු,	සමණ - සැමියා,	වාරණ - වැළැක්වීම,	වැහැර - කෙට්ටු
(4)	කුලල - බෙල්ල,	උරණ - තරහ,	උදාන - උදෑසන,	දිනිසුරු - හිරු

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අඹ - ජලය, ස්ත්‍රිය, වලාකුළ, කුලුපග
(2) දිය - ලෝකය, වතුර, දෙන්න, ජයග්‍රහණය
(3) දන - දැවිල්ල, මිනිස්සු, දානය, ඉපදීම
(4) දද - කුෂ්ඨ, කුරුල්ලා, දිශාව, බමුණා

23.**විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) ප්‍රබුද්ධ - මුග්ධ (2) නිශ්‍රීක - සශ්‍රීක
(3) ස්වයංක්‍රීය - නිෂ්ක්‍රීය, (4) ස්ව - පර

24.**වැරදි** අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) 'ඓ' , 'ඖ' ස්වර සංයුක්ත ස්වර ලෙස හැඳින්වේ.
(2) 'ලැබුණෙහි'යන්න ප්‍රථම පුරුෂ ඒකවචන අතීතකාල කර්මකාරක ආඛ්‍යාතයකි.
(3) ප්‍රකෘති ව්‍යඤ්ජනයකට ස්වර එකතු කළ බව පෙන්වීමට යෙදෙන විශේෂ ලකුණු පිල්ලම් වේ.
(4) 'මහ + ඊශ්වර' යන්න සන්ධි වනුයේ 'මහේශ්වර' යනුවෙනි.

25.පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් මනා පද ගැළපීමෙන් යුක්ත, අර්ථාන්විත වාක්‍යය තෝරන්න.
(1) හරවත් දේශනයකට සවන්දීමට ලැබීම ඔහු මහත් භාග්‍යයක් කොට සැලකුවේ ය.
(2) දරුවන්ට පවත්නා කෙටි කාලය තුළ විභාගයට සූදානම් වීමට සිදුවීම අභියෝගයකි.
(3) දූ පුතුන්ගේ දැනුමෙන් පෝෂණය කරන්නට විවේකය දෙමාපියෝ උත්සාහ කළහ.
(4) කාගේත් අවධානය වසංගත තත්ත්වයෙන් මිදීමට අවශ්‍ය ඔසු නව්‍ය උපකරණ පිළිබඳ යොමු විය.

- අංක 26, 27 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.

26. 'උත්සාහයෙන් තොර ජයක් නැත.'
(1) උපාය දන්නෝ අපායේ නො වැටෙති. (2) උඩ පැන්නොත් බිම වැටේ.
(3) අඩන්න එපා යැ කිරි එරෙන්න. (4) දැන කතරගම නොදැන අතරමග

27.‘ බුද්ධිමතුන් නැති තැන අඩු උගත්කම් ඇත්තෝ ඉස්මතු වෙති.’
(1) හඳුන් වනෙත් ඇත උරුලෑවෝ (2) ලූලා නැති වළට කනයා පණ්ඩිතයාලු.
(3) රිළවුන්ට මොන මල්වඩම් ද? (4) පැසුණු හිසින් බුහුමන් ලබව.

28. ස්වරාදේශ සන්ධියට හා පරරූප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,
(1) ගොක්කොළ, දැවුරුදු (2) දැවුරුදු, ගොක්කොළ
(3) වටොර, සන්නස (4) සන්නස, වටොර

- අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) අද ළමයින් පාසලට පැමිණ ඇත.
(2) වෛද්‍යවරු සේවයට එති’යි රෝගීහු සිතූහ.
(3) ඇතින්නක පැටවා සමඟ ගම්මානයට ආවා ය.
(4) ඔහු ගුණගරුක දරුවෙක් සේ ප්‍රසිද්ධ විය.

30. (1) තාත්තා හෝ අම්මා හෙට අප බැලීමට එන්නේ ය.
(2) මහ සුළඟින් වටිනා ගස් ද වැල් ද විනාශ වූහ.
(3) එහි සිටි සියලු ළමයි දක්ෂයෝලු.
(4) ඈ වියත් ලේඛිකාවක වූවා ය.

31. - මිනිසුන් ආත්මාර්ථය ගැන ම ..... පොදු යහපත ගැන නො සලකන්නේ ඇයි?
- සුදු කොඩි කෙටිකතා සංග්‍රහය 1983 වසරේ දී හොඳ ම කෙටිකතා සංග්‍රහය ..... සම්මානයට පාත්‍ර විය.
- භාෂාව ..... ඊ ළඟ පරම්පරාවට සංස්කෘතිය රැගෙන යයි.
- කලාකරුවන් ..... විශ්‍රාම වැටුපක් ලබා දීමේ අවශ්‍යතාව එහි දී අවධාරණය විය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත අනුපිළිවෙළ කුමක් ද?
(1) මගින්, සඳහා, ලෙස, මිස (2) මිස, ලෙස, සඳහා, මගින්
(3) මිස, ලෙස, මගින්, සඳහා (4) මගින්, ලෙස, සඳහා, මිස

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
“කවුරුවත් ඒ ගැන මුකුත් කිව්වෙ නෑ.
(1) කිසිවෙක් ඒ පිළිබඳ කිසිවක් නො පැවසූහ.
(2) කිසිවෙක් ඒ පිළිබඳ කිසිවක් නො පැවසුවේ ය.
(3) කිසිවෙකු ඒ පිළිබඳ කිසිවක් නො පැවසූහ.
(4) කිසිවෙකු ඒ පිළිබඳ කිසිවක් නො පැවසුවේ ය.

33. ‘නවකතා කලාව’ නම් කෘතියේ කතුවරයා වන්නේ,
(1) මාර්ටින් වික්‍රමසිංහ (2) කේ. ජයතිලක (3) එදිරිවීර සරච්චන්ද්‍ර (4) ජී.බී. සේනානායක

34. සමුද්‍රඝෝෂ විරිතට අදාළ කවි පදය ඇතුළත් වරණය තෝරන්න.
(1) ළඟ ළඟවා උනුනට කර වාදය
(2) විදෙන ලෙළෙන නරුබර පුළුලුකුළ රැඳී
(3) රිවි බිම්බා'යුරු රිවිකුල කමලකර
(4) සාර පලය අඹ දඹ රඹ ද වල්පිට

35. “එකල්හි බුද්හු ඉදුහ බලයෙන් ඔවුන් පිළිබහා සඟුන් අතුරෙහි සිටුවූහ.” යන පාඨයෙහි **‘පිළිබහා’** යන්නෙහි අර්ථය කුමක් ද?
(1) ඔසවා (2) රැගෙන (3) වළක්වා (4) පසු කර

36. පහත කවියෙහි දෙවෙනි පදය තෝරන්න.

නන්නාඳුනන මෙනුවර තනි වුන අපට

.....

වන් දෝ බිළින්දෝ නාඩා නැළවෙන්න

යම් දෝ හෙට උදේ අපි ආපසු ගමට

(1) ඉන්නේ කවුද රැකවරණෙට බැල්මකට
(2) අම්මා ඇවිල්ලා හීනෙන් දොරකඩට
(3) දරුවොත් එක්ක මම වැටිලා ඉන්නකොට
(4) ඇහුවා මගෙ පුතේ කිරි ඕනැද උඹට

37. සිලිලාරෙක හෙල්මැලී
පෙති අතරින් සැලි සැලී
කනට නො යන සිතට දැනෙන
සිලි සිලියක පැටලිලා

(1) කුමාරතුංග මුනිදාස (2) චන්ද්‍රරත්න මානවසිංහ
(3) මහගමසේකර (4) එස්. මහින්ද හිමි

38. දිගාමඩුලු උපභාෂා ව්‍යවහාරයෙහි 'පුක්කා' යනු,

(1) ජටාව ය. (2) මහලු කත ය. (3) පිරිමි ළමයා ය. (4) කිරිබත් ය.

39. සිදාදියට එන්නට මට
බුද්ධිය නුඹ තමයි එදා
පාර කියා දුන්නේ
ගමෙන් උරුම වූ වස්තුව
පොදියක් බැඳ කර තියාන
උඹේ බහට රැවටීලයි
සිදාදියට ආවේ

යන පද්‍ය ඛණ්ඩයෙන් කියැවෙන්නේ,

(1) බුද්ධිමත්කම යටපත් කොට රැවටී නගරයෙන් ආ අයකු ගැන ය.
(2) බුද්ධිය වර්ධනය කර ගැනීමට නගරයට ආ අයකු ගැන ය.
(3) බුද්ධියට වහල් වී නගරයට ආ අයකු ගැන ය.
(4) ගමේ වස්තුව විකුණා දමා නගරයට ආ අයකු ගැන ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.

එක ම සංසිද්ධිය ප්‍රතිභා සම්පන්න ලේඛකයන් කිහිප දෙනෙකු අත පත් වූ කල්හි අපූර්ව විවිධත්වයක් වන ආකාරයේ රචනා බිහි වන්නේ සිංහල භාෂාවේ ඇති අතිශය විචිත්‍රත්වය නිසා ය.

(1) විචිත්‍රවත් ලෙස භාෂාව භාවිත කරමින් ප්‍රතිභා සම්පන්න ලේඛකයෝ අපූර්ව විවිධත්වයක් ඇති නිර්මාණ බිහි කරති.

(2) ප්‍රතිභා සම්පන්න ලේඛකයෝ සිංහල භාෂාවේ ඇති අතිශය විචිත්‍රත්වය නිසා එක ම සිදුවීම වුවත් අපූර්ව විවිධත්වයක් පළ වන ආකාරයෙන් රචනා කරති.

(3) එක ම සිදු වීම වුවත් ප්‍රතිභා සම්පන්න ලේඛකයන් කිහිප දෙනෙකු අතට ගිය විට අපූර්ව විවිධත්වයක් ඇති වන අයුරින් විචිත්‍ර නිර්මාණ බිහි වේ.

(4) විචිත්‍රවත් සිංහල භාෂාව යොදා ගනිමින් අපූර්ව දක්ෂතා ඇති ලේඛකයෝ විශිෂ්ට නිර්මාණ බිහි කරති.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

11 ශ්‍රේණිය - අනාවරණ පරීක්ෂණය 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය II

නම/අංකය : .....

1. I සිට x තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.
(අ) කල (ආ) කළ

ii. පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. ඒම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
මහා පණ්ඩිත්‍යය ප්‍රඥා බල මහිමය අභිමුව උගතුන් යැ'යි කියා ගන්නෝ ද වෙති.

iii. පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.
(අ) පොල්ලත්ත (ආ) සුරත

iv. පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් උපසර්ග පද **දෙකක්** උපුටා දක්වන්න.
මොහොතක නිහඬතාවට පසු ලෙනේ ඇත අන්තයෙන් ප්‍රතිචාරයක් ලැබිණි.

v. පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේද ලියන්න.
(අ) දසබල (අ) ඉරහඳතරු

vi. පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.
(අ) දුරදිග බලා කටයුතු කරන (ආ) කිසිම ප්‍රයෝජනයකට නැති

vii. පහත දැක්වෙන යෙදුම් සඳහා කමත් ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.
(අ) දැකැත්ත (ආ) කුල්ල

viii. පහත දැක්වෙන වාක්‍ය සදොස් නම්, ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) ගුරුවරු කල් ඇතිව පාසලට පැමිණෙනු ඇත.
(ආ) සොරුන් දෙදෙනෙක් අත් අඩංගුවට පත්වුහ.

ix. පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) දරුවෙනි, රට දැය සමය ගැන **සිතන්න.**
(ආ) අක්කා හෙට **පැමිණියොත්** ගමට යා හැකිය.

x. පහත සඳහන් (අ) සහ (ආ) යෙදුම්වල පළමුවැනි වචනය සමඟ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) කලණ මිත්‍රයා (ආ) ඇමති මණ්ඩලය

(ලකුණු 2 x 10 = 20යි.)

2. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර ඇතුරෙන් **ඒකක්** තෝරා ගෙන **වචන 250කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.**

(අ) මිනිසා ප්‍රයෝජනයට ගෙන පරිසරයට මුදාහරින විවිධ අපද්‍රව්‍ය නිසා පරිසර පද්ධතියට සිදුවන්නේ විශාල හානියකි. පරිසරයේ ඇති සමතුලිත බව බිඳීයාම තුළින් ගසට, කොළට, මෙන්ම ජීවීන්ගේ පැවැත්මට ද තර්ජනයක් ව ඇත. කසළ නිසි ලෙස බැහැර කිරීම කාලීන ප්‍රශ්නයට විසඳුමකි.

(ආ) රජෙක් වුවත් ලෙඩෙක් වුවොත් ඉන් පළක් නොමැත. සමාජය තුළ මේ වන විට වසංගත රෝග ව්‍යාප්තියක වර්ධනයක් දැකිය හැක. මෙයින් මිදීමට නම් මිනිසා විසින් ම කළ යුතු දෑ බොහෝ ය. මෙයට විවිධ හේතු සාධක බලපාන අතර ඒ පිළිබඳ සැලකිලිමත් වීම අවශ්‍යය.

(ඉ) අලුත් අලුත් දෑ නොතනන ජාතියක් සමඟ ලෝකයක් දිනිය නොහැක. ඒසේ වුවහොත් සිදුවන්නේ ජාතියක් ලෙස අනාගතය ජය ගැනීමට වඩා තාක්ෂණ ලොව ඉදිරියේ පසුබෑමකි. පාසල් දරුවන් පවා තාක්ෂණික දැනුම උපයෝගී කරගෙන නව නිපැයුම් කිරීම සතුටට කරුණකි. මෙතුළින් සාර්ථක ඉදිරි පියවරක් ගැන සිතමු.

(ඊ) පෙරදිග ධාන්‍යාගාරය යන විරුදාවලිය ලත් ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටකි. සාම්ප්‍රදායික කෘෂි ආර්ථිකයක් තුළ හැඩ ගැසුණු අප තාක්ෂණයේ. දියුණුවත් සමග නවීන ශිල්ප ක්‍රම. රසායනික පොහොර භාවිතය, වෙත නැඹුරුව බොහෝ සෙයින් සිදුකරයි. මෙය ශරීර සෞඛ්‍යයට බලපෑමකි. කාබනික පොහොර භාවිතයට නැඹුරු වී කටයුතු කිරීම කාලෝචිතය.

(ලකුණු 25 යි.)

3. පහත දැක්වෙන පාඨය වචන 55 – 65 අතර වනසේ **සාරංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

භාෂාව යනු ඉතාමත් වැදගත් සංකේත සමූහයක එකතුවක් ලෙස හැඳින්විය හැකිය. මිනිසා විසින් භාෂාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ, අදහස් ප්‍රකාශ කිරීමට හා අන්‍යයන්ගේ අදහස් හා හැඟීම් පිළිබඳ සන්නිවේදනයන් ග්‍රහණය කර ගැනීමට යොදා ගනු ලබන විධිමත් භාවිතයකටයි. අපගේ අදහස්, ඇගයුම්, විශ්වාස, දැනුම වැනි දෑ පතුරුවා හැරීමට, ප්‍රකාශ කිරීමට හා අන්‍යෝන්‍ය වශයෙන් බෙදා හදා ගැනීමට හැකි වන්නේ භාෂාවේ මාර්ගයෙනි. සංගීතය, කලාව, නාට්‍ය ආදී වශයෙන් වූ අනෙකුත් මාධ්‍යයන් ද සන්නිවේදන ක්‍රියාවලියෙහිලා ඉතාමත් වැදගත් වේ. එහෙත් ඒ අතර අද්විතීය නම්‍යශීලී මෙන් ම නිරවද්‍යතාවක් ඇත්තේ භාෂාවට පමණි. අතීත හා වර්තමාන අත්දැකීම් හුවමාරු කර ගැනීමට මෙන් ම, අපගේ අභිලාෂයන් අනාගත පරපුර වෙත යොමු කිරීම සඳහා අවස්ථාව සලසා දෙනු ලබන්නේ ද භාෂාවයි. යථාර්ථයට අල්ප වශයෙන් සමානත්වයක් නැතහොත් සබැඳියාවක් ඇති සිහින සහ මනෝ ලෝකය ප්‍රකාශ කිරීමෙහිලා උපකාරි වන්නේ ද භාෂාවයි. භාෂාවකින් තොරව සිතීමට පවා හැකිවන්නේ දැයි ඇතැම් විද්‍යාඥයින් විසින් ප්‍රශ්න කරනු ලැබේ. භාෂාව සාවද්‍ය ලෙස භාවිත කිරීමට හැකි වෙතැයි ද, ඒහෙයින් එය තේරුම් ගැනීමට අපහසු වෙතැයි ද පෙනී ගිය හැකිය. ඒ කෙසේ වුව ද මිනිසාට සිය සංස්කෘතිය, විසරණය කිරීම සඳහා ඉඩ සලසා දෙනු ලබන ප්‍රධානතම සාධකය වන්නේ ද භාෂාවයි.

(ලකුණු = 10 යි.)

4. පහත දැක්වෙන **ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට** උත්තර සපයන්න.

කිසිවෙකුගේ සිත තුළ පහළ වන ඔහුට ම විශේෂ වූ සිතුවිල්ලක් අන්‍යයන්ගේ සිත්වලට දැනවීම සඳහා මෙම පුද්ගලයාටත් ඔහුගේ සිතුවිල්ල දැනවීමට අවශ්‍ය වන අන්‍යයන්ටත් පොදු වූ මාධ්‍යයකට එම සිතුවිල්ල පරිවර්තනය කළ යුතු වේ. එම පොදු මාධ්‍ය භාෂාවයි. භාෂාවෙන් හැර ඉඟි - බිඟි මගිනුත් ඇතැම් සිතුවිලි හුවමාරු කරගත හැකිය. එහෙත් එසේ හුවමාරු කරගත හැක්කේ ඉතා සීමා සහිත සිතුවිලි සංඛ්‍යාවක් පමණි. එම සිතුවිලි ද ඉතා දළ වශයෙන් මිස සියුම් අන්දමින් ඉඟි මගින් ප්‍රකාශ කළ හැකි නොවේ. මෙසේ භාෂාව ජන සමූහයක් විසින් පොදුවේ පරිහරණය කෙරෙන මාධ්‍යයක් බව පැහැදිලි වේ. කිසියම් භාෂාවක් පොදුවේ පරිහරණය කරන හෙයින් ජන සමූහයන් එකමුතුකමක් දරන බව ලෝකයේ විවිධ දේශයන් විවිධ ජන සමූහයන් පරීක්ෂා කිරීමේදී දිස් වන කරුණකි. අප දිවයිනේ වෙසෙන ජනතාව පරීක්ෂා කළහොත් පොදු භාෂාව නිසා සිංහල හා දෙමළ වශයෙන් ජන සමූහ දෙකක් පවත්නා අයුරු අපට පෙනේ. මෙසේ පොදු භාෂාවක් නිසා එකමුතු බව ලැබූ ජන සමූහයකට භාෂා ප්‍රජාව යැයි නම් කළ හැකිය. මෙසේ ලංකාවේ සිංහල භාෂා ප්‍රජාව හා දෙමළ භාෂා ප්‍රජාව යනුවෙන් ප්‍රධාන භාෂා ප්‍රජාවන් දෙකක් දක්නට ලැබේ. භාෂා ප්‍රජාව භූගෝලීය වශයෙන් හෝ රාජ්‍ය වශයෙන් හෝ අඛණ්ඩව එක ප්‍රදේශයකට පමණක් සීමාවී පැවතිය යුතු නොවේ.

I. පොදු මාධ්‍යයක් අවශ්‍ය වනුයේ කුමක් සඳහා ද?

II. සිතුවිලි හුවමාරු කරගත හැකි මාධ්‍යයක් ලෙස ඉඟි බිඟිවල කාර්ය භාරය දක්වන්න.

III. ජනසමූහයක එකමුතු බවට හේතුව කුමක් ද?

IV. භාෂා ප්‍රජාව යනු කුමක් ද?

V. භාෂා ප්‍රජාවේ ව්‍යාප්තිය පිළිබඳව ලේඛකයාගේ අදහස කුමක් දැ'යි දක්වන්න.

(ලකුණු 10 යි.)

5. පොළොන්නරුව, 'සඳගිරි ගම' ප්‍රදේශයේ පසුගිය දිනවල ඇදහැළුණු වර්ෂාවෙන් අනතුරුව ජලය රැඳී ඇති ස්ථාන හේතුවෙන් ඩෙංගු රෝගය පැතිර යෑමේ අවදානමක් ගොඩනැගී ඇත. මේ තත්ත්වය හමුවේ ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් ලේ පරීක්ෂා කිරීමේ වැඩසටහනක් හා ඩෙංගු රෝගය වළක්වා ගැනීමට කටයුතු කළයුතු අන්දම පිළිබඳ ව දැනුවත් කිරීමක් සිදුකරනු ලෙස ඉල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට යැවෙන ලිපිය සකස් කරන්න. ඔබ සඳගිරිගම 'එකමුතු සමාජයේ' ලේකම් සුදම් රත්නායක යැයි සිතන්න.

නැතහොත්

රාජාංගණය රාහුල මධ්‍ය මහා විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය සැප්තැම්බර් 28 වන දින විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට තීරණය කර ඇත. ප්‍රධාන ආරාධිතයා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වන අතර සම්භාවනීය ආරාධිත අමුත්තන් රැසක් සහභාගී විමට නියමිතය. ත්‍යාග ප්‍රදානය ප්‍රාථමික, කනිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ වශයෙන් කොටස් තුනකට ලබාදීමට තීරණය කර ඇත. සෞන්දර්යාත්මක අංග තුනක් ද ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. උත්සවය උදය වරුවේ පැය දෙකකට සීමා කිරීමට සංවිධායක මණ්ඩලය සාකච්ඡා කර ඇත. මෙම උත්සවය සඳහා අවශ්‍ය න්‍යාය පත්‍රය සකස් කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

11 ශ්‍රේණිය - අනාවරණ පරීක්ෂණය 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය III

නම/අංකය : ..... **කාලය : පැය 02 යි.**

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.
- **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු ගණන 80කි.

---

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර **නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "වහන්සෙ, තොප පියෙ කවර? මවු කවර?" යි පිළිවිත.
(අ) මෙහි 'වහන්සෙ'යන ඇමතුම ලැබුවෝ කවරහු ද?
(ආ) මෙහි සඳහන් පියා හා මව් නම් කරන්න.

(ii) එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම
.....
.....

(අ) මෙම කවියේ ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙම ජනකවිය කෙබඳු වර්ගයකට අයත් ද?

(iii) පවසන්නට තතු හද සංසලා
නැති වේ ද සෙනෙ හැර යා ද ලෙනෙ නොදැනා
වළකන්ට බැරි දේට පිහිටා
වනු දෙවියනේ මා අසරණේ නොහැරා

(අ) හද චංචල යැයි මෙහි සඳහන් වන්නේ කුමක් පැවසීම පිළිබඳ ව ද?
(ආ) මෙහි සඳහන් වන පරිදි ලෙන හැර යති' යි සිතන්නේ කවුරුන් ද?

(iv) "නුවණින් සියලු දඹදිව තමන්ට දෙවන කෙනෙකුන් නැති. සිරිවඩ්ඪන සිටාණන් පුතණුවෝ මහෞෂධ පණ්ඩිතයෝ නම් මොහු යැ."
(අ) මෙසේ සිතුවෝ කවරහු ද?
(ආ) මෙසේ සිතුවේ කුමන අවස්ථාවක දී ද?

(v) "අන්තිමට ඈ විමසූයේ අලුත් මුලාදැනියා වූ පුංචිරාළ වෙදරාළගෙනි."

(අ) මෙහි 'ඈ' යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් ද?
(ආ) ඈ පුංචිරාළගෙන් විමසූයේ කවුරුන් පිළිබඳ ව ද?

(vi) (අ) කුණාටුව, එකෝමත් එක රටක, සංවාදය වැනි කාව්‍ය ග්‍රන්ථ රචකයා කවුරුන් ද?
(ආ) එම කවියාගේ සමකාලීන කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(vii) (අ) සද්ධර්මරත්නාවලිය සඳහා මූලාශ්‍රය කර ගත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය කුමන කෘතියක් සඳහා ලියන ලද අටුවා ග්‍රන්ථයක් ද?

(viii)(අ) සිංහල සාහිත්‍ය වංශයෙහි දැනට දක්නට ඇති පැරණිතම සන්දේශය කුමක් ද?
(ආ) පරෙවි සන්දේශය, කාව්‍යශේඛරය, පංචිකා ප්‍රදීපය ආදී කෘති කාගේ නිර්මාණයන් ද?

(ix) තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ

(අ) මෙම පද්‍ය ඛණ්ඩය ඇතුළත් පාඩම කුමක් ද?
(ආ) මෙම පද්‍ය කවියා රචනා කළේ කුමන තේමාවක් උදෙසා ද?

(x) ළඟ ළඟ වා උනුනට කර වාදය
නොවරදවා වීණා පද වාදය
රඟ අඟ වා සුර - නරඟන ඛේදය
සෙද කරවා රජ සඛය පඛෝදය

(අ) මෙම පද්‍යය උපුටාගත් මුල් කෘතිය කිනම් සාහිත්‍ය යුගයක ලියැවිණි ද?
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදයේ අදහස ලියන්න.

(ලකුණු 02x10 =20යි

2. පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) " මහරජ, දෙසේනාව සටන් නොකොට මැනව.රජ දරුවන් දෙදෙනාගේ පණ්ඩිත දෙදෙන එක තැනකට එද්ද, ඉන් එක් කෙනෙක් වැන්දවූ, නම් වැදි පක්ෂයේ රජ හට පරාජය වන්නේ ය."
(අ) මෙසේ වැදීම නිසා ජය - පරාජය තීරණය කිරීම හැඳින්වූයේ කෙසේ ද?
(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

(ii) නොයෙක් තැන ම පිපි මල් පිරුණු පොකුණුය
ගෙයක් කන ම සැදැහෙන් දෙවන **දකුණුය**
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය
සියක් අය කෙරෙති වැඳ පුද **පැදකුණුය**

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙ මගින් කියැවෙන ස්ථානයෙහි ස්වභාවය විස්තර කරන්න.

(iii) "මහ තෙරුන් දැක මිනිස්හු බා පලති. ඔහු කෙණෙසි අහර නො ලදින් ක්ලාන්ත වැ මහණුවම් කරන්නට නො නිස්සහ. මෙ සෙ වන්නා හා "දැන් අඟුල්මල් මහ තෙරහු මෙත් සිත් පිළ ලදින් සස් කොටැ මිනිස්නට සෙත් කෙරෙති'යි මිනිස්හු නො බා එළැබියටි වෙති.
(අ) අඟුල්මල් තෙරුන්ට පළමුව මහණදම් රැකීමට නොහැකි වූයේ කුමන කරුණක් නිසා ද?
(ආ) මෙහි සඳහන් පරිදි පසු ව මිනිසුන්ට අඟුල්මල් තෙර කරා එළඹිය හැකි වන්නේ කෙසේ ද?

(iv) වන සිරි පියුම්රා බඳ රන'බරණ යුරු
වට පිරි සුපුල් දුනුකේ මල් මුරුත' තුරු
බිඟු පිරි වැරූ **ඔලු'පුලැ'ඹුල**වල තඹුරු
හිම සරි සිහිල් දිය හෙබ දැක යන් මිතුරු
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අදහස ලියන්න.
(ආ) පද්‍යයේ සඳහන් උපමාව කුමක් ද?

(v) සමණෝ ද "එසේ නො කියව" යි නො කියා "එ සේ සැටි ය" යි කියා, උන් කීවා ම ගිවිස ගෙන නික්මුණාවු ය. මේ උන් දෙන්නා කළ කී කටයුතු ය.

(අ) උග්ගසේන හා විද්දත් දියණිය පෙර භවයේ කළ කී කටයුතු මොනවාද?

(ආ) මෙකී කටයුතු නිසා පසු භවයේ ඔවුන්ට සිදු වූයේ කුමක් ද?

(ලකුණු 04x05 = 20යි)

3. (i) උග්ගසේන සිටුපුත් චරිතයේ ත්

(ii) විද්දත් දියණියගේ චරිතයේ ත්

දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ කෙබඳු දැයි උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව ඇසුරින් එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(i) නිර්දිෂ්ට කොටසින් උදාහරණ **දෙකක්** බැගින් දක්වමින්

(ii) කාව්‍යාලංකාර භාවිතයත්

උපයුක්ත බස් වහරත්

මඟ විසිතුරු විශිෂ්ට සාහිත්‍යාංගයක් වීමට බලපා ඇති ආකාරය විමසන්න.

(ලකුණු 15යි)

4. (i) උතුරා යන මා පිය සෙනෙහසත්

(ii) තම උරුමය සොයා යන පුතකු පිළිබඳවත්

සිංහබාහු නාට්‍යයෙන් විශද කෙරේ. නියමිත කොටසින් එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(i) කාව්‍යෝපක්‍රම භාවිතයත්

(ii) කාලීන සමාජ අවශ්‍යතාව මතු කර දැක්වීමත්

නිසා මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තිය සහෘද සිත් දිනා ගැනීමට සමත් ව ඇත. එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි)

5. තමාට කොතරම් දුෂ්කරතාවලට මුහුණදීමට සිදු වුවත් කුරහන් වගාවෙන් ගොවියා ලද තෘප්තිය කුරහන් ඉසිමුව කළුවර බලාලා පැදි පෙළෙන් කියැවේ. සුදුසු නිදසුන් තුනක් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 10යි)

6. සොබා දහමින් පමණක් නො ව තම සමාජ පරිසරයෙන් ද රැකවරණයක් නො ලද අසරණ මිනිසුන්ගේ ශෝකාලාපයකි බැද්දේගම නවකතාව. සුදුසු නිදසුන් තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

7. අදූරදර්ශී උපදේශකයකු නිසා නොමඟ යන නායකයකු පිළිබඳ ව සතර කන් මන්ත්‍රණයේ චූලනී රජුගේ චරිතයෙන් කියැවේ. සුදුසු නිදසුන් තුනක් දක්වමින් විමසන්න.

(ලකුණු 10යි)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S I

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ..... සිංහල භාෂාව හා සාහිත්‍යය- I කාලය : පැය 01 යි.

වැදගත් :

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.

✳ 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

✳ **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) ඔවුන් අප ව <u>අතපල්ලෙන් වැටුණ</u> දරුවන් සේ සැලකීම සාධාරණය
(1) දුප්පත් (2) අත යටින්
(3) කාත් කවුරුත් නැති (4) ඇතමෙකුගෙන් සරණක් නැති

(02) ''එදා පාන්දර යාමයේ ඇසුණු බිහිසුණු වෙඩි හඬින් මුළු කඳවුරම <u>ගල් ගැසී ගියේ ය.''</u>
(1) ගල් මෙන් විය. (2) මහත් සේ බිය විය.
(3) දෙදරා ගියේ ය. (4) සුනු විසුණු විය.

(03) අසනීපය <u>නිට්ටාවට ම</u> සුව කළ නොහැකි බව වෛද්‍යවරයා පැවසුවේ ය.
(1) සම්පූර්ණයෙන් ම (2) සාමාන්‍යයෙන්
(3) බාගයක් (4) බෙහෙතෙන්

✳ **අංක 04 සිට 06 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) එම නගරය පිරිසිදු කිරීම සඳහා ගම් වැසියෝ ..... ඉදිරිපත් වූහ.
(1) නිරායාසයෙන් (2) අනිවාර්යෙන් (3) ස්වයංක්‍රීය ව (4) ස්වෙච්ඡාවෙන්

(05) සමහර භාණ්ඩවල මිල ගණන් අධික නිසා ..... භාණ්ඩ පරිහරණයට මිනිස්සු පුරුදු වී සිටිති.
(1) ආදේශක (2) පරිපූරක (3) සුලභ (4) ලාභ

(06) ඕස්ට්‍රේලියාවේ ජාතික ඖෂධ ..... මණ්ඩලයේ නියමු දොස් හාටි 1993 දී ලංකාවට පැමිණ මෙසේ කීහ.
(1) නියමු (2) මිල (3) ප්‍රතිපත්ති (4) තේමා

(07) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ක්ෂණිකව, පිළිබඳව, වළාකුල, පෘෂ්ඨය
(2) ප්‍රවීණ, ඝණ්ටාර, ප්‍රත්‍යාර්ථ, ගෘහස්ථ
(3) විශේෂණ, රාජාභිෂේකය, විනිශ්චය, අධ්‍යාපනය
(4) දේශගුණික, ලේඛනය, කළමණාකරණය, සාර්ථක

(08) පිහිය, වතුර, වික්‍රමය, නිහාල් යන වචනවල දෙවන අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) කෙටි පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල හා රකාරාංශය
(2) කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, රකාරාංශය හා ඇලපිල්ල
(3) රකාරාංශය, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල හා කෙටි පාපිල්ල
(4) ඇලපිල්ල, රකාරාංශය, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල

(09) 'දත' යන පදයේ අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,
(1) තාලුජ (2) දන්තජ (3) ඕෂ්ඨජ (4) කණ්ඨජ

(10) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අනුරාධපුරය, අවිස්සාවේල්ල, නුගේගොඩ, පන්නිපිටිය
(2) පැණි කුරුල්ලා, රාජාලියා, උකුස්සා, මාවව්ලා
(3) ගම්පෙරළිය, කලියුගය, යුගාන්තය, විරාගය
(4) නවසීලන්තය, ඩෙන්මාර්කය, තායිලන්තය, නෙදර්ලන්තය

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ළමයෙක්, ඔවුන්, මම, කුමාරවරු (2) තාත්තෙක්, නරියෙක්, සේවිකාවක, ගිහියෝ
(3) තා, කම්කරුවෝ, ඔවුහු, නාවිකයෝ (4) කම්කරුවෝ, තොපි, වෙළෙන්දෝ, කටුස්සෙක්

(12) නංගී නැටුමක් ''නටයි'' මෙහි නටයි යන ක්‍රියා පදයේ අතීත කාල උත්තම පුරුෂ ඒක වචන ක්‍රියා පදය ලියන්න.
(1) නැටුවා ය. (2) නැටුවෙමි. (3) නැටුවෙමු. (4) නැටූහ.

(13) ''මිහින්තලා'' යන පද අයත් වන්නේ,
(1) පූර්වස්වර ලෝප සන්ධිය (2) ස්වරාදේශ සන්ධිය
(3) ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය (4) ද්විත්ව රූප සන්ධිය

(14) අවස්ථෝචිත යන පදය නිවැරදිව විසන්ධි කර ඇති වරණය තෝරන්න.
(1) අවස්ථා + ඕචිත (2) අවස්ථා + උචිත (3) අවස්ථෝ + චිත (4) අවස් + ථෝචිත

(15) සන්ධි නොවූ පදයක් දැක්වෙන වරණය තෝරන්න.
(1) බළල්ලු (2) සූර්යෝදය (3) පිළියම් (4) පාපියුම්

(16) මිශ්‍ර ක්‍රියාවක් යෙදී නැති වාක්‍ය කුමක් ද?
(1) ඔහු දුවද්දී වැටුණි. (2) නංගී අඬ අඬා පාර පනියි.
(3) කම්කරුවෝ හකුරු කකා තේ බොති. (4) කුරුල්ලා කුඩුව සාදමින් සිටියි.

*** අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(17) ඔහු <u>**උපකල්පනය**</u> කළ දේ නිවැරදි ය.
(1) ආකල්ප (2) අනුමාන (3) නිශ්චිත (4) තීරණය

(18) බුද්ධිමත් වූ තරමට යමක <u>**යථාර්ථය**</u> දැකිය හැකිය.
(1) සැබෑ තත්වය (2) තේරුම (3) ස්වරූපය (4) යටි අර්ථය

(19) ලංකාවට **උවම්** කළ හැකි රටක් මෙලොව නැත.
(1) සමාන (2) එක් කළ (3) උපමා (4) සමීප කළ

(20) සමානාර්ථ පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) ද්වාරය - දොරටුව, මධුර - මිහිරි, ශ්‍රැති ගෝචර - දර්ශනීය, ශ්වේත - සුදු
(2) ගාම්භීර - ගැඹුරු, කමලකර - විල, ව්‍යසනය - විපත, අධිවාසනා - ඉවසීම
(3) අනුන - අඩු නැති, ප්‍රහර්ෂය - අධි සතුට, පරිශීලනය - හැදෑරීම, සුක්ෂ්ම - සියුම්
(4) ලකළ - අලංකාර, ළපලු - ළා දලු, ප්‍රවිෂ්ට වීම -පැමිණීම විලිකුන් - ඉදුණු

(21) විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන වරණය තෝරන්න.
(1) රුචිය - අභිරුචිය (2) කුලීන - කුලහීන
(3) සමීපස්ථ - දූරස්ථ (4) ප්‍රචීන - ප්‍රතිචීන

(22) ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් සහිත වරණය කුමක් ද?
(1) තරුණයෝ පරිසරය පිරිසිදු කර විසිර ගියහ.
(2) දෙමව්පියන්ගෙන් අවසර ලැබුණොත් මම ගමනට සහභාගි වෙමි.
(3) මව දරුවා ලවා අකුරු ලියවයි.
(4) ගායකයා වේදිකාවට නැගෙද්දී රසිකයෝ අත්පොළසන් දුන්හ.

(23) වැරදි අදහස සහිත වරණය කුමක් ද?
(1) ධාතු ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක් වී ක්‍රියා පදයක් සෑදෙයි.
(2) කර්මකාරක වාක්‍යයක කර්තෘ උක්ත රූප ගනියි.
(3) ''දරුවන් පාසලට පැමිණ ඇත'' යන්න නිවැරදි වාක්‍යයකි.
(4) ශ, ෂ යන අක්ෂර මහාප්‍රාණ අක්ෂර නොවේ.

(24) සෑම පදයකම අන්තඃස්ථාක්ෂරයක් යෙදී ඇති පද සහිත වරණය තෝරන්න.
(1) සතුන්, වමත, නරනිඳු, සුමුදු
(2) පාසල, පමණ, පුටුපෙළ, නිවාස
(3) තීරණය, දුහද, රථය, අනුකම්පා
(4) පරගැති, වතුපිටි, ලක්බිම, ප්‍රදීපය

(25) පරස්වරලෝප සන්ධියට උදාහරණයක් නොවන පදය කුමක් ද?
(1) සදානුස්මරණීය
(2) ශාලාධිපති
(3) සුරඟන
(4) අතිනැද

✳ **අංක 26, 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

(26) වාසි පැත්තට කවුරුත් හිතවත් ව කතා කිරීම.
(1) දී කිරට බළල්ලුත් සාක්කිලු.
(2) කලකදි වහලු කලකදි රස වෙනවාලු.
(3) කිතුල් ගහේ ගිය මිනිහාටත් කියන්න දෙයක් තිබුණලු.
(4) දෙයියන්ගේ හාල් කැවිල වගේ.

(27) අසීරුතාවයෙන් යමක් කිරීම
(1) අඬුව තියෙද්දී අත පුච්චාගන්නේ මොකට ද?
(2) කකුළුවා පැටවුන්ට කෙලින් යන්න කීවා වගේ.
(3) දැලි පිහියෙන් කිරි කන්නා වගේ.
(4) අතු කඩා මොරකන්නා සේ

(28) මුලින් දී ඇති පදයේ අර්ථය වැරදි ලෙස දී ඇති පිළිතුර තෝරන්න.
(1) වල - වනාන්තරය
(2) දළ - දැඩි
(3) සරණ - හැසිරෙන
(4) නල - සුළඟ

✳ **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවලට ව්‍යාකාරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

(29) (1) ලෝකවාසීන් ගෝලීය උෂ්ණත්වයට මුහුණ දී සිටිති.
(2) වර්තමානයේ තරුණයන් යහමඟට පැමිණෙති'යි බොහෝ දෙනා කියති.
(3) නව ග්‍රන්ථ නව මුහුණුවරකින් ප්‍රකාශයට පත් වෙති.
(4) දරුවන් සහ වැඩිහිටියෝ ශ්‍රමදානයට එක් වූහ.

(30) (1) ඔවුහු ආගන්තුක මිනිස්සු මෙන් හැසිරෙති.
(2) මවක විසින් ඔවුහු යහමඟ යවනු ලබති.
(3) ගම්වාසීන්ට නියඟයෙන් නිවාස අහිමි වූහ.
(4) සතුරෝ පැමිණෙද්දී ගෙහිමියෝ බිය වූහ.

(31) A - මෙරට සංවර්ධනය ..... නව ව්‍යාපෘති සැලසුම් කළ යුතු ය.
B - නව යෝජනා ගෙන ආ ..... සම්මත නොවී ය.
C - ඇතින්න පැටවා ..... නොපෙනී ගියා ය.
D - කාලගුණය අයහපත් ..... බලධාරීහු කියති.
E - බව F - උදෙසා G - නමුත් H - සමඟ
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) E, F, G, H
(2) G, H, F, H
(3) F, H, E, G
(4) F, G, H, E

(32) පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට නිවැරදි ව දැක්වෙන පිළිතුර තේරන්න.
කුරුල්ලෝ පියාඹද්දී කුඩා දරුවෝ සතුට පළ කළා.
(1) කුරුල්ලන් පියාඹද්දී කුඩා දරුවෝ සතුට පළ කළහ.
(2) කුරුල්ලෝ පියාඹද්දී දරුවෝ සතුට පළ කළහ.
(3) කුරුල්ලන් පියාඹද්දී දරුවන් සතුට පළ කළහ.
(4) කුරුල්ලෝ පියාඹද්දී දරුවන් සතුට පළ කළහ.

(33) ''සාහිත්‍ය විද්‍යාව'' කෘතිය රචනා කළේ කවු ද?
(1) මාර්ටින් වික්‍රමසිංහ මහතා
(2) ජී. බී. සේනානායක මහතා
(3) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
(4) කේ. ජයතිලක මහතා

(34) උපමාවක් යෙදී නැති පද්‍ය පාදය කුමක් ද?
(1) දිසෙයි වෙහෙර එහි සුරවිමනක් ලෙසට
(2) පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර
(3) සැළෙන පහන සිළු වැනි රඟන ලිය සැදී
(4) රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනූ පා තබ තබා

(35) වන විනාශය සිදු කරන මිනිසුන් පිළිබඳ ව අපගේ <u>**නිරන්තර**</u> අවධානය යොමු කළ යුතු ය.
ඉහත වාක්‍යයේ ''නිරන්තර'' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) නිතර
(2) ඉඳහිට හෝ
(3) දිනපතා
(4) වරින් වර

(36) පහත පද්‍යයේ හතර වෙනි පදය තෝරන්න.
වෙර වීරිය ඇතත් හිතේ
පියකරු බව ඇතත් වතේ
දහදිය නොම සැලෙන ගතේ
.....
(1) සුරුවිරුකම් ඔබට ඇතේ
(2) ඔබ පොළොවට බරකි පුතේ
(3) මව් බිම දෙස බලනු පුතේ
(4) ඒ මහ වැව් බැඳුණෙ පුතේ

(37) ළා තඹ පත් ලියලන සඳ
දඹ රන්වන් කැටයමක්ය
ඒ තඹපත් මෝරන මඳ
පලා පැහැය මහිමයක්ය
මේ පද්‍ය ඇතුළත් නිර්මාණ සංග්‍රහය කුමක් ද?
(1) සෙංකොට්ටං
(2) නිර්මාණ පසුබිම
(3) ප්‍රබද්ධ
(4) සක්වාලිහිණි

(38) ''ඉක්බිති උදැල්ල තබාලා ඇවිත් ගොනුන් නොදැක මහත් දොම්නසට පැමිණෙන්නේ ඔවුන් සොයමින් වනයෙහි ඈත මෑත ඇවිදින්නේ''
මෙම පාඨය උපුටා ගත්තේ,
(1) සද්ධර්මරත්නාවලියෙනි.
(2) රාජාවලියෙනි.
(3) මහා කපි ජාතකයෙනි.
(4) සද්ධර්මාලංකාරයෙනි.

(39) මොනරාගල වැසියන් ''කුදහච්චා'' යනුවෙන් ව්‍යවහාර කළේ කුමකට ද?
(1) නිදාගත්තා යන්නට ය.
(2) වාඩිවුණා යන්නට ය.
(3) අවදි වුණා යන්නට ය.
(4) අසනීප වුණා යන්නට ය.

(40) පහත පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
''රචනා රීතිය යනු භාෂා භාවිතයේ දී විශිෂ්ට ලෙස කෙරෙන පද ගැළපීමයි. එය ලේඛකයාගේ වචන තෝරා ගැනීම හා වචන ගැළපීමත් කථන ක්‍රමයත් යන දෙකෙහි ම සංකලනයෙන් සකස් වන ප්‍රකාශන උපක්‍රමයකි.''
(1) විශිෂ්ට පද ගැළපීමේත්, වචන තෝරාගෙන කථන ක්‍රමයක් සාදා ගැනීමේත් ඵලය ප්‍රකාශන උපක්‍රමයක් වේ.
(2) වචන තෝරා ගැනීම හා වචන ගැළපීමේ ද කථන ක්‍රමයේ ද සංකලනයෙන් විශිෂ්ට පද ගළපීමක් වන රචනා රීතිය නමැති ප්‍රකාශන උපක්‍රමය සැකසේ.
(3) රචනා රීතිය වචන ගැළපීමේ හා තෝරා ගැනීමේ සංකලනයෙන් සකස් කර ගන්නා පද ප්‍රකාශන උපක්‍රමයක විශිෂ්ට ප්‍රතිඵලයකි.
(4) විශිෂ්ට වචන තෝරා ගැනීම හා ඒවා ගැළපීමේ සංකලනය ලේඛකයා සලකන්නේ රචනා රීතිය නම් ප්‍රකාශන උපක්‍රමය ලෙස ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 | S | II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ..... සිංහල භාෂාව හා සාහිත්‍යය- II කාලය : පැය 02 යි.

✳ ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල හෝඩියේ ඇතුළත්,
(අ) නාසික්‍ය (ආ) හ්‍රස්ව ස්වර අක්ෂරය බැගින් ලියන්න.

(ii) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.
(අ) වනෞෂධ (ආ) පූජෝපහාර

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
''පසුගිය වසරේ සහල් නිශ්පාදනය කොතරම් ඉහළ ගියේ ද යත් එයට සරිලන වෙලඳපොළ සොයා ගැනීම දුෂ්කර විය.

(iv) පහත දැක්වෙන පදවලට විරුද්ධ පදය බැගින් ලියන්න.
(අ) ආගන්තුක (ආ) අවම

(v) පහත දැක්වෙන පදවල ප්‍රකෘතිය වෙන් කර ලියන්න.
(අ) වැද්දෝ (ආ) ගැමියා

(vi) පහත සඳහන් (අ) සහ (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) දුම්රිය සේවකයෝ වැඩ වර්ජනය කරති යි මගීහු සැක පහළ කළහ.
(ආ) දක්ෂ ශිෂ්‍යාවක් වන්නේ කෙසේ ද?

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාත පදයක් හා අනුක්ත පදයක් ලියන්න.
''කෙළිසෙල්ලමින් මා වැළැක්වීමට තාත්තා වැරවෑයම් කරන්නේ කුමක් නිසා දැයි මට නො වැටහිණි.''

(viii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) දුරදිග බලා කටයුතු කරන (ආ) අවුරුද්දක් පාසා පැවැත්වෙන

(ix) පහත සඳහන් වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.
(අ) සාහිත්‍යකරුවෝ රසිකයන් අපූරු ලොවකට ගෙන යති.
(ආ) ගොවියෝ කල් යල් බලා කුඹුරු වපුරති.

(x) පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාරයන් සඳහා භාවිතා වන සාමාන්‍ය ව්‍යවහාර ලියා දක්වන්න.
(අ) අත්තප්පා (ආ) ඔයනවා (ලකුණු 2x10=20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර ඇසුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වනසේ රචනයක් ලියන්න. රචනය සඳහා යෝග්‍ය සුදුසු මාතෘකාවක් ද යොදන්න. (ලකුණු 25)

(අ) වර්තමානය වන විට දිනකට රිය අනතුරුවලින් සිදු වන මරණ සංඛ්‍යාව අටක් පමණ වන බව හෙළිදරව් වී ඇත. මාර්ග නීති නොපිළිපැදීම, අධික වේගය, බීමත්කමින් රිය පැදවීම, මාර්ග පටු වීම, අධික වාහන ප්‍රමාණය, රියදුරන් හට නිද්ද යාම ආදිය තුළින් රිය අනතුරු සිදු වී මිය යෑම්, සදාකාලික පූර්ණ අකර්මන්‍යතාවයට පත් වීම් බහුලය. ඒ තුළින් වැඩි වශයෙන් ම යතුරු පැදි භාවිතා කරන්නන් මිය යන අතර, ඔවුහු තරුණයෝ වෙති. රකට ජීවනාලිය බඳු තරුණයන් මිය යාම රටට මහත් පාඩුවකි. පවුල් පවා අසරණ තත්ත්වයට පත් වෙයි. එමෙන් ම රජයට ප්‍රතිකාර සඳහා වැය බරක් දැරීමට ද සිදුව ඇත.

(ආ) රටක පුරවැසියන්ගේ නිරෝගීකම එම රටේ සංවර්ධනයේ දී ඉතා වැදගත් වේ. ශ්‍රී ලාංකික ජන සමාජය මේ වන විට විවිධ බෝ නොවන රෝගීන්ගෙන් බහුල රටක් බවට පත් වී ඇත. දියවැඩියාව, පිළිකා, හෘදයාබාධ, අධික රුධිර පීඩනය ආදී බෝ නොවන රෝගයන් සඳහා ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව ඉතා ඉහළ ය. මේ සම්බන්ධව සෞඛ්‍යය විශේෂඥයෝ විවිධ මත පළ කරති. ව්‍යායාම ප්‍රමාණවත් නොවීම, වස විසෙන් යුත් ආහාර ගැනීම, අධික ලෙස ආහාර ගැනීම, අවිධිමත් ලෙස ආහාර ගැනීම, මානසික ආතතිය හා ජානමය වශයෙන් බලපාන විවිධ හේතු ගෙන හැර දක්වයි.

(ඉ) ජංගම දුරකථන, රූපවාහිනිය, අන්තර්ජාලය, පරිගණකය ආදියේ ඇතැම් බලපෑම් නිසා ද අපේ ළමයින් වෙතින් කියවීමේ පුරුද්ද ටිකෙන් ටික ඈත් වන බවක් පෙනේ. ළමයින් තුළ කියවීමේ පුරුද්ද ඇති කිරීම පාසලටත්, ගෙදරටත්, රජයටත්, පැවරෙන විශාල වගකීමකි. කියවීමේ පුරුද්ද කුඩා කල සිට ම ඇති කළ යුත්තේ එය සාර්ථක ජීවිතයකට ජය මඟ වන බැවිනි. 'කියවීම සම්පූර්ණ මිනිසෙකු කරයි' යන කියමන අප අනිවාර්යයෙන් ම වැළඳ ගත යුතු ය.

(ඊ) මිනිසාගේ වැඩ පහසු කර ගැනීම අනාදිමත් කාලයක සිට විවිධ සොයා ගැනීම් හා නිපදවීම් කිරීමට මිනිසා පෙළඹිණි. වාෂ්ප යන්ත්‍රය සොයා ගැනීමත් සමඟ කාර්මික විප්ලවය ඇරඹී වර්තමානය දක්වා ආ ගමනේ මිනිසා සොබාදහමට අභියෝග කරමින් විවිධ ජයග්‍රහණ ලබා ගැනීමට උත්සුක වෙමින් සිටියි. කාර්මික විප්ලවයත් සමඟ ඇති වූ වායු දූෂණය තුළින් හරිතාගාර වායු පරිසරයට මුදා හැරීම, වනාන්තර විනාශය ආදිය නිසා ගෝලීය උෂ්ණත්වය ඉහළ ගොස් නාය යෑම, භූමිකම්පා, සුළි සුළං, සුනාමි, ළැව්ගිනි, ගං වතුර ගිනි කඳු පිපිරීම ආදී කාලගුණ විපර්යාසයන් නිසා නොනවතින අරගලයකට මුහුණ දීම ලෝකවාසීන්ට සිදු වී ඇත.

(03) පහත දැක්වෙන පාඨය වචන 50 - 60 ත් අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

වංශ කතා අනුව ථූපාරාමයට දීර්ඝ ඉතිහාසයක් ඇති බව වටහා ගත හැකිය. සර්වඥ ධාතු තැන්පත් කොට ස්ථූපයක් තැනීම ගැන මිහිඳු මාහිමියන්ගේ සිතේ බලපැවැත් වූ අදහස දැන ගත් දෙවන පෑතිස් රජු සර්වඥ ධාතු ලබා ගැනීමට මිහිඳු මාහිමියන්ගේ මග පෙන්වීම යටතේ සුමන සාමණේරයන්ගේ සහය ලබා ගත් බව මහාවංශයේ සඳහන් වේ.

සුමන සාමණේරයන් වහන්සේ වැඩම කර වූ අකු ධාතුව ඇතුළු සර්වඥ ධාතුන් වහන්සේලා ශ්‍රද්ධාවෙන් පිළිගත් රජු එම ධාතුන් වහන්සේලා ඇතෙකු පිට තබා වැඩමවා ඇතා නගරයේ පෙරදිග දොරටුවෙන් පුරයට ඇතුළු වී දකුණු දොරටුවෙන් නික්ම ථූපාරාම ස්ථූපය කළ තැනින් පිටුපස තැන වූ ප්‍රමෝජවස්තු නම් තැනට ගොස් පෙරදිග බලා නතර වූ බව සඳහන් වේ. මිහිඳු මාහිමියන්ගේ උපදෙස් අනුව අභය වැවේ දිය සිඳුණු මැටි ගුලි ගෙන්වා ඇතාගේ කුම්භස්තල ප්‍රමාණ මැටි ගොඩ ගැසීමෙන් පසු ඒ මතුපිට ධාතුන් වහන්සේලා තැන්පත් කොට දින කීපයකට පසු ගඩොල් අල්ලා මැටි ගොඩැල්ල ශක්තිමත් කළ බව සඳහන් වේ. මෙම විස්තරයට අනුව මුල් ම ථූපාරාම ස්ථූපය ක්‍රමවත් සැලැස්මකට අනුව ගොඩනඟන ලද්දක් නොවන බව සිතිය හැකි ය. 13 වන සියවසේ රචිත සාහිත්‍ය කෘතියක් වන ථූපවංශයේ සඳහන් වන්නේ ස්ථූපය වී ගොඩක අනුරුවට කර වූ බවයි. සමන්ත පාසාදිකාවේ හා සිංහල බෝධිවංශයේ සඳහන් වන්නේ ථූපාරාමය ධාන්‍ය ගොඩකට සමාන වන ලෙස ගොඩනඟන ලද බවයි. මේ කරුණු විමසා බලන විට පැහැදිලි වනුයේ ථූපාරාමය මැටි ගොඩක් වටකොට ගඩොල් අල්ලා කිසිම සැලැස්මකින් තොරව ගොඩනඟන ලද බව නොව, කිසියම් නිශ්චිත ආකාරයකට තැන වූ බව ය. (ලකුණු 10)

(04) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

යථාර්ථය නිරූපණය යනු සත්‍ය නිරූපණයක් නොවන සත්‍ය ගවේෂණයකි. මතුපිට වාර්තා කිරීම, යථාර්ථය නොවේ. මතුපිට විනිවිද ගොස් අභ්‍යන්තරය දැකීම යථාර්ථය වේ. මේ සඳහා ලේඛකයාගේ නිරීක්ෂණ ශක්තියට හා පරිකල්ප ශක්තියට හිමි වන්නේ සුවිශේෂ තැනකි.

සමාජයෙහි ජීවත්වීමේ කාර්යයේ දී මිනිසා විසින් අත්‍යවශ්‍ය වූ නිශ්චිත සම්බන්ධතා ඇති කර ගනු ලැබේ. මේ සම්බන්ධතා ඇති කර ගැනීම ඔහුගේ කැමැත්තට අනුව ම සිදු වන්නේ නැත. මෙසේ ඇති කර ගනු ලබන සම්බන්ධතා වනාහි මිනිසාගේ භෞතික නිෂ්පාදන බලවේගයන්ගේ වැඩීමෙහි නිශ්චිත අවස්ථාවන්ට අනුකූල වන්නා වූ නිෂ්පාදනය මුල් කර ගත් සම්බන්ධතා වෙයි. මෙම නිෂ්පාදන සම්බන්ධතා සියල්ල එකතු වීමෙන් සමාජයේ ආර්ථික සංස්ථිතිය ඇති වෙයි. එසේ ම මෙම ආර්ථික සංස්ථිති සමඟ සමාජ විඥානයේ නිශ්චිත ස්වරූප ද සැසඳෙන්නේ ය. ජීවිතයේ නිෂ්පාදන මාර්ග සාමාන්‍ය වශයෙන් සාමාජික, දේශපාලනමය හා බුද්ධිමය ජීවන රටාව හැඩ ගන්වයි. මිනිසාගේ පැවැත්මට සකස් කෙරෙනුයේ ඔහුගේ විඥානය විසින් නොවේ. මිනිසාට හුදෙකලාව ජීවත් විය නොහැකි ය. මේ නිසා ජන සමාජයක චින්තන - චින්දන ශක්තිය නිරන්තරයෙන් ම වෙනස් වේ. ඒ වෙනස්වීම අනිවාර්ය ද වේ. තතු එසේ වුවත් ඒ වෙනස්වීම ජන සමාජයේ අර්ථ සිද්ධිය වෙතට යොමු කිරීම අවශ්‍යය. මේ සඳහා ශක්තිය ඇත්තේ සාහිත්‍ය කලාවන්ට ය. මිනිසාගේ ජීවන ධාරිතාව පෘථුල කොට ජීවිතය පිළිබඳ අර්ථවත් දැක්මක් ඉදිරිපත් කළ හැක්කේ ද සාහිත්‍ය කලාවන්ට ය.

සාහිත්‍යය කලා විචාරයේ දී ගුරු කොට ගත යුත්තේ මේ කල්පනයයි. එය සැබැවින් ම මිනිසාගේ චින්තනයට අදාළ දෙයකි. තතු එසේ නම් සාහිත්‍ය කලා අධ්‍යනය බුද්ධිමය ව්‍යාපාරයක් බව කිය යුතු නැත.

(i) මෙම ඡේදයට අනුව යථාර්ථය නොවන්නේ කුමක් ද?
(ii) යථාර්ථය දැකීම සඳහා ලේඛකයා සතු විය යුතු ගුණාංග කවරේ ද?
(iii) සමාජයේ ආර්ථික සංස්ථිතිය ඇති වීම කෙරෙහි බලපාන සම්බන්ධතා මොනවා ද?
(iv) 'මිනිසාට අර්ථවත් දැක්මක් ඇති වන්නේ කුමක් තුළින් ද?
(v) මෙම ඡේදයට අනුව එළඹිය හැකි අවසාන නිගමනය කුමක් ද? (ලකුණු 2x5=10)

(05) වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් තුන්වන වරටත් සංවිධානය කරන ජ්‍යෙෂ්ඨ පුරුවැසියන්ගේ ''විය සපිරි තරු සුපිරි'' සංගීතමය වැඩ සටහනේ අවසන් මහා තරගය සංවිධානය කර ඇත. එය 2020 මැයි මස 25 වන දින ප.ව. 6.00ට වයඹ පළාත් සභා 'ලිච්ඡවී'' ශ්‍රවණාගාරයේ පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහ මහතා පැමිණෙයි. මේ පිළිබඳව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ විසින් කුරුණෑගල දිසාපතිතුමා වෙත යවන ආරාධනා පත්‍රයක් සකසන්න. (ලකුණු 15)

නැතහොත්

ගම්පහ නගරයේ ඩෙංගු රෝගීන්ගේ වැඩිවීමේ ප්‍රවණතාවක් තිබෙන බව ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් ගම්පහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී හෙළිදරව් කළේ ය. නිවාසවල සහ පොදු ස්ථානවල ජලය රැඳෙන භාජන ස්ථානවල මදුරු කීටයන් බෝවීම තුළින් ඩෙංගු කීටයන් බෝවීම වැළැක්වීමට නගර වාසීන්, වෙළෙඳසැල් හිමියන් හා රාජ්‍ය ආයතන නිලධාරීන් දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 | S | III

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය : ..... සිංහල භාෂාව හා සාහිත්‍යය- III කාලය : පැය 02 යි.

වැදගත් :

✳ දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

✳ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු සංඛ්‍යාව ලකුණු 80කි.

(01) (i) සිට (x) තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ''ඒ බමුණා වහ වහා ම දිවගෙන ගොස් සේනාව මැදට පැන මෙසේ කියාලීය.''
(අ) ඉහත පාඨය ඇතුළත් වනුයේ සතර කන් මන්ත්‍රණයේ කුමන කොටසේ ද?
(ආ) ඒ බමුණා කියනු ලැබුයේ කුමක් ද?

(ii) ''යටත්නි, ම පුතු මා කෙරෙහි නොබිඳැ - පියටියාව'යි - නෙරැ-පීයැ.''
(අ) ඉහත ප්‍රකාශය ඇතුළත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියෙහි රචකයා නම් කරන්න.

(iii) (අ) සද්ධර්මරත්නාවලිය කෘතියෙහි රචකයා නම් කරන්න.
(ආ) සද්ධර්මරත්නාවලිය ලියූ යුගය කුමක් ද?

(iv) යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කැර එකසී
.....
.....
ඉහත පද්‍යයේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
(අ)
(ආ)

(v) (අ) සිංහල ජන ජීවිතය පිළිබඳ ව ඉංග්‍රීසි භාෂාවෙන් ලියැ වූ ඔබට නියමිත නවකතාව කුමක් ද?
(ආ) එම සුවිශේෂී නවකතාවේ කතුවරයා කවුරුන් ද?

(vi) (අ) ජාතික තොටිල්ල පද්‍ය නිර්මාණයේ රචකයා නම් කරන්න.
(ආ) එම රචකයාගේ මුල් ම කාව්‍ය කෘතිය කුමක් ද?

(vii) (අ) ''සිංහල ෂෙලී'' යන විරුදාවලිය ලත් කවියා කවුරුන් ද?
(ආ) එම කවියා හා සමකාලීන කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(viii) අසිරිමත් වූ දේකි මෙලොව
ප්‍රේමය නමිනා
වැනූ පොරණ කිවිඳුන් සොඳ
රස මුසු බසිනා....
(අ) ඉහත ගීත කොටස ඇතුළත් නිර්මාණය කුමක් ද?
(ආ) එම නිර්මාණය රචනා කිරීමට තේමා කර ගනු ලැබූ කතා පුවත ඇතුළත් කෘතිය කුමක් ද?

(ix) රන් විමනේ සිටිමුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩගිනි නැද්ද
.....
.....
ඉහත පද්‍යයේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(අ)
(ආ)

(x) (අ) සද්ධර්මරත්නාවලිය ලිවීමට පාදක කරගත් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය ලියූ රචකයා නම් කරන්න.

(ලකුණු 2X10=20යි)

(02) (i)''රජ්ජුරුවන්ට පටහැනි වීම නම් යුක්ත නොවෙයි. - සිතා, රජ්ජුරුවන් හා සමඟ නික්මුණාහ.''

(අ) මෙහි සඳහන් රජතුමා කවුරුන් ද? රජතුමා සමඟ නික්මුණු තැනැත්තා කවරහු ද?

(ආ) මෙම කොටස හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) වෙසෙසින් යන නද **දිගත** පුරායා
අසමින් **තුරු හිස** රඳන ගිරායා
උමුවෙන් ගත් මී අඹ මියුරායා
දැමුවෙන් වෙණ නද ම ය මියුරායා

(අ) අංකිත පදවල අරුත් ලියන්න.

(ආ) මුළු කවියේ ම අර්ථය ලියන්න.

(iii)''කිම, මහරජ, තට බිම්සර මහරජ කුපිත වියැ හො? විසාලා මහනුවර වැසි ලිච්ඡවි රජහු කුපිත වූහ හො? සෙසු ප්‍රතිපක්ෂ රජ කෙනෙක් කුපිත වූහ හො? යි''

(අ) මෙසේ ප්‍රකාශ කරනු ලබන්නේ කවරහු ද? කා හාට ද?

(ආ) ඉහත ප්‍රකාශය අවසානයේ ලැබෙන පිළිතුර කුමක් ද?

(iv) ''සත් වන දවස් බොහෝ දෙනෙක් රැස්ව මැසි මත්තේ මැසිලා ගත්හ.''

(අ) ''මැසි මත්තේ මැසිලා ගත්හ.'' යන්නෙහි අදහස කුමක් ද?

(ආ) මැසි මත්තේ මැසිලා ගනු ලැබුවේ කුමක් සඳහා ද?

(v) අපල ගෙන දෙන අසුබ නිමිති ඇත්තේ යයි ද **අවතාර** **අඩිකෝඩවලින්** පිරුණේ යයි ද ප්‍රසිද්ධව ගිය මේ ගෙයි වාසයට ඒමට තරම් **සැහැසිවූ** කිසිවෙක් ගමේ නොවූහ.

(අ) අංකිත පදවල අරුත් ලියන්න.

(ආ) ඉහත කොටසෙහි සඳහන් නිවසෙහි හිමිකරු කවුරුන් ද? (ලකුණු 4 x 5 = 20යි)

(03) (i) මිනිස් දහසක් මරන්නට ''අහිංසක'' පෙළඹුණ ආකාරයත්,

(ii) බුදුහිමි සතු පුරිසදම්ම සාරථි ගුණය ඉස්තු වන ආකාරයත්,

මනා ලෙස නිරූපණය කිරීමට කතුවරයා සමත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් විමසන්න.

නැතහොත්

(i) අවස්ථෝචිතව විරිත් වෙනස් කිරීමත්

(ii) අවට රැස්වූවන්ගේ ස්වභාවය වර්ණනා කිරීමත් නිසා ගුත්තිල කාව්‍ය රසවත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න. (ලකුණු 15යි)

(04) (i) උග්ගසේන සිටුපුත්‍රයා ජීවිතයේ අභියෝග ජය ගත් ආකාරයත්,

(ii) කතා පුවත ඉදිරිපත් කිරීමේ දී ඒ ඒ චරිත හා අවස්ථාවට අනුකූලව භාෂාව හසුරුවා ඇති අයුරුත් ඉතා විශිෂ්ට ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

නැතහොත්,

(i) වනය විසින් ගම යටකර ගැනීමත්,

(ii) පුංචි මැණිකාගේ චරිතය නිරූපණය කර ඇති ආකාරයත්, නිර්දිෂ්ට පාඩමෙන් උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න. (ලකුණු 15යි)

(05) උචිත රූපකාර්ථ යොදා ගනිමින් ජාතික හැඟීම් පාඨකයා තුළ ජනිත කිරීම ජාතික තොටිල්ල පද්‍ය පන්තියෙන් පෙන්වා දෙයි. උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(06) ''හානාහීය පානා අඬහැරෙන් දැනේ.'' කවි පෙළ රසවත් කිරීම සඳහා කවියා යොදා ඇති කාව්‍යාලංකාර උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(07) සිංහබාහු නව ලොවක් අපේක්ෂා කළ තරුණයකි. උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாந்தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	11	විෂයය / பாடம் / Subject	සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය / வினாத்தாள் / Paper	I	පැය / மணித்தியாலம் / Hours	01

සැලකියයුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු **40කි.**

(ii) අංක 01 සිට40 තෙක් ප්‍රශ්නවල දී ඇති **1 , 2 , 3 , 4** යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (***x***) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා,ඒවාද පිළිපදින්න.

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) **යල් පැන ගිය** තීන්දු තීරණ ඇතැම් විට යහපත් ඒවා වන්නට ද පුළුවන.

(1) කාලයට නොගැළපෙන (2) යල මහ ඉක්මවා ගිය
(3) නවීකරණය වූ (4) කිසිසේත් ක්‍රියාත්මක කළ නොහැකි

(02) කෙසේ හෝ **ජාං බේරා ගැනීමට**සමහරු සූරයෝ ය.

(1) චරිතය සුරැකීමට (2) විශාල මුදලක් ලබා ගැනීමට
(3) පාඩුවක් නොලබා ගැලවීමට (4)ගත් ණයෙන් නිදහස්වීමට

(03) **ජේත්තුවට** රැවටෙන දරුවෝ වර්තමානයේ විරල වෙති.

(1) දක්ෂතාවට (2) බාහිරඅලංකාරයට
(3) රූපයට (4) මුදලට

- **අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) උපදේශකවරයා ..... සාහිත්‍යයේ ඇතැම් තැන් දක්ෂ ලෙස සිය කථාවට යොදා ගත්තේ ය.

(1) සම්මාන (2) සංක්‍රාන්ති (3) සංස්ථිතික (4) සම්භාව්‍ය

(05) 'ස්ටීවන් හෝකින්', ඉතා ඉහළ අලෙවි වාර්තා තැබූ පොත් ..... ඉල්ලීම මත නැවත මුද්‍රණය කිරීමට යුහුසුලු විය.

(1) ශ්‍රාවකයන්ගේ (2) පාඨකයන්ගේ (3) සහෘදයන්ගේ (4) දේශකයන්ගේ

(06) කලාප කාර්යාලය මගින් පාසල් ..... කිරීම සඳහා දිනයන් වෙන් කෙරිණි.

(1) අධීක්ෂණය (2) ප්‍රේක්ෂණය (3) පුනරීක්ෂණය (4) නිරීක්ෂණය

(07) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) මාවරමණ්ඩිය,මාතලේ,මාමඩුව,මාරස්සන.

(2) කාගම,කාපිරිගම,කාදිල්ගම,කාලියම්මහර

(3) ආරච්චිකට්ටුව,ආනමඩුව,ආනවිලුන්දෑව,ආඩියාගම

(4) රාගම,රාජගිරිය,රාජාංගනය,රාවතාවත්ත

(08) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) ප්‍රබෝධනය,අර්ථ ධ්වනි,සංඝටනය,වනෝද්‍යානය

(2) ජ්‍යෝතිර් විද්‍යාව,විශ්වකෝශය,ඓතිහාසික,පිල්ලම

(3) දුර්භික්සය,උත්කෘෂ්ඨ,දෘශ්‍යාධාර,පෝළිම

(4) සංශෝධනය,හෘදයාබාද,හිරමණය,විදුහල්පතිණිය

(09) එක් එක් වචනයේ දෙවෙනි අකුරෙහි දික් ඇදපිල්ල,දීර්ඝ පාපිල්ල,ඉස්පිල්ල හා ගැට ඇලපිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

(1) අමාව,අපූරුව,අමිහිරි,කෘදන්ත (2) කැලෑඋණ,අමූලික,ගිලිහෙනවා,ආකෘතිය

(2) කෘදර,සමූලඝාතනය,සිපිරිගෙය,ඍජුකෝණ (4) ඇසෑම්,අසූව,කතිරය,ව්‍යාපාරය

(10) "සලකුණ" යන්න,

(1) උපසර්ගයකි (2) නිපාතයකි (3) තද්ධිතයකි (4) විශේෂණයකි

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ගැහැනිය,අයෙකු,බුදුහු,මාර්ගයෝ (2) ගංගාවෝ,පියාණන්,රියදුරා,ඔව්හු

(3) ඕතොමෝ,යමෙක්,මෑණියන් දෑ,ඇතැම්හු (4)තෙරණුවෝ,රීතීන්,ඇතුන්,ගුරුවරු

(12) නාම ප්‍රකෘති හා ධාතු ප්‍රකෘති නිවැරදිව යෙදී නැති වරණය තෝරන්න.

(1) දරු,ගිරා,මිනිස්,නට (2)පිහිට,බල,ගව,මාළු

(3) ලිය,මල්,ගස්,බෑවුම් (4)නැගිටී,මොනරු,බලා,කකා

(13) පහත පදවල සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) ඓක්‍යය,කර්තෘ,සූර්යයා,ප්‍රාසංගික (2)දූරස්ත,විද්‍යමාන,මෛත්‍රී,කල්‍යාණ

(3) රිද්මයාණුකූල,ප්‍රත්‍යාර්ථ,විද්‍යුත්,ස්තුතී (4)අවස්ථෝචිත,ව්‍යංගාර්ථ ,අත්‍යවශ්‍ය,සාමර්ථ්‍යය

- **අංක 14 , 15ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(14) චිරන්තන සාහිත්‍යික **උක්තීන්** භාවිතයට ගන්නා නූතන සාහිත්‍යකරුවා උත්සාහ ගන්නේ චමත්කාරයක් දැනවීමට ය.

(1) පොත් පත් (2) කියමන් (3) මූලධර්ම (4) උක්ත පද

(15) ජාතික ආදායම කීපදෙනෙක් අත බෙදී යන විට **දරිද්‍රතාව** වැඩිවන බව අමුතුවෙන් කිව යුතු නොවේ.

(1) දුප්පත්කම (2) පොහොසත්කම (3) විරක්ෂාව (4) නූගත්කම

(16) ඓ,ඖ අක්ෂර දෙක ,

(1) ඝෝෂ ව්‍යංජන ය (2) අන්තඃස්ථ ය (3) වර්ගාන්ත අනුනාසික ය (4) සංයුක්ත ස්වර ය

(17) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) තද්ධිත - දිරිමත්,තොටියා, ස්වර්ණමය, පුදසුන

(2) සන්ධි - බුදුකුරු,මැදැඟිල්ල,ගිනියම්,හෙළයෝ

(3) නිපාත - වූකලී,පිණිස,උදෙසා,හෙයින්

(4) පූර්ව ක්‍රියා - නැගිට,ගොස්,බලා,සෝදා

(18) " ළා සුළඟට සැලෙන ළපලු
ඇසට කනට ගීතයක් ය .
මී දේ දුව ඉසට නැඟුව
ඉඳු නිල්මිණි සේසතක් ය."

ඉහත පද්‍යයෙහි අඩංගු රූපකයක් හා තද්භව වචනයක් යෙදුණු පේළිය තෝරන්න.

(1) ඇසට,ඉඳු නිල් මිණි (2) ළපලු,සේසත (3)මී දේ දුව,සේසත (4) සුළඟ,දේ දුව

(19) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමඟ බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.

(1) ශුක්ල සාරිවා,කෘෂ්ණ සාරිවා,ඉරරාජ,සඳරාජ
(2) රකාරංශය,රේඵය,යංශය,හ්‍රස්වය
(3) මහගමසේකර,ගුණදාස අමරසේකර,රත්න ශ්‍රී විජේසිංහ,විමල් දිසානායක
(4) පොල්,පුවක්,තල්,කිතුල්

(20) එක් එක් පද පේළියේ දී ඇති පද වලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) විද්‍යමාන - පෙනෙන , සාවද්‍ය - නිවැරදි ,මධුර - මිහිරි ,ලඹදෙන - එල්ලෙන
(2) අනුභූතිය - අත්දැකීම , ප්‍රාකාරය - පවුර,මංජරිය - පොකුර , චේතිය ඝර - සෑ ගෙය
(3) විපර්යාස - වෙනස්කම්, පෙදෙහි - කවියෙහි, පෙඳ - වත,රියසක - කරත්ත රෝදය
(4) මැදිරිය - කූඩුව,බුද දින - බදාදා දවස, කමලකර - සූර්යයා,පැමිණීම - සම්ප්‍රාප්තිය

(21) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සුදු - ශ්වේත,ධවල,හෙළ,එළ
(2) භික්ෂුව - යතිවරයා,හාමුදුරුවෝ,ස්ථවිර,සංඝ
(3) දෙක - යුගල,කුට්ටම,ජෝඩුව,විශද
(4) අනංගයා - මල්සරා,මින්දද,කම්පස,මන්මථ

(22) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) ජ් + ඤ අකුරු දෙක සම්මිශ්‍රණයෙන් සෑදුණු බැඳී අකුරක් වන්නේ 'ඥ' ය.
(2) ඍ,ර්,ෂ්, යන මූර්ධජ අකුරුවලට පරව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරයයි.
(3) ඌෂ්මාක්ෂර ඝර්ෂ නමින් ද හඳුන්වනු ලැබේ.
(4) ශ,ෂ,ස යන ඌෂ්මන් ශබ්ද ඝෝෂ ගණයට අයත් වේ.

(23) A ලකුණෙන් B දුං කොළ C කවියා D සත්තු

ඉහත ප්‍රකාශ අතුරින් පූර්ව ස්වර ලෝප හා ආගම සන්ධිවලට අයත් පද සහිත පිළිතුර තෝරන්න.

. (1) A හා C ය. (2) A හා D ය. (3) B හා D ය. (4) B හා C

(24) යුගලඋඩුකොමා,කොමාවනිවැරදිවයෙදීඇතිවරණයතෝරන්න.

(1) "ළමයෝ" උඹට, පිස්සු ද?ආච්චි බෙරිහන් දුන්නා ය.
(2) "ළමයෝ,උඹට පිස්සු ද"?ආච්චි බෙරිහන් දුන්නා ය.
(3) ළමයෝ?උඹට,"පිස්සු ද"ආච්චි බෙරිහන් දුන්නා ය.
(4) "ළමයෝ උඹට පිස්සු ද?ආච්චි,බෙරිහන් දුන්නා ය."

(25) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ග්‍රන්ථ කර්තෘ නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) සිපිදා රි න ය සේ ස (2) ස මා කු ග තු නි දා රං මු ව
(3) හ ම ක ම න ග සේ ර (4) ද න් ර හ ත න වී න සිං ග

- **අංක 26 හා 27 ප්‍රශ්න යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.**

(26) ඔරුව පෙරළෙන කොට,පෙරළුණු පැත්ත හොඳයි කිව්ව ලු.

(1) දක්ෂ අයට කොතනත් එක වගේ ය.

(2) ඔරුවක යන විට ප්‍රවේශමෙන් ගමන් කළ යුතු බව.

(3) තම අවශ්‍යතා අනුව බුද්ධිමතුන් තීරණ ගැනීම සිදු කරයි.

(4) කළහැකි අනෙක් කිසිවක් නැතිවිට ලැබුණු දේ බාරගැනීම.

(27) ඕනෑකමට කබරගොයත් තලගොයා වෙනව ලු.

(1) අවශ්‍යතාව ඉක්මවා කටයුතු කරයි.

(2) තම ලාභයපිණිස අඩුපාඩු අමතක කරයි.

(3)සමාන ලෙස ප්‍රයෝජනයට ගැනීම ඉතා වැදගත් බව.

(4) යමක් අවශ්‍ය වූ විට කෙසේ හෝ ඉටුකරගැනීම

(28) අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.

(1) නුවරු දන මන බඳිමින් ගායකයෝ ගී ගයති.

(2) පුංචි පුතා වැටී වැටී ඇවිදියි.

(3) පියාණෙනි අප දෙදෙනා වැඳ සමුගත් බව කියන්න.

(4) ඔබ සිටියා නම් කොතරම් හොඳදැයි මට සිතුණි

(29) A - සිංහලයා ඉතා විනීතය.ආගන්තුක සත්කාරයෙහි තත්පරය.ස්වදේශිකයන් හට මෙන්ම කරුණාවෙන් විදේශීන් හටත් සලකන්නේ ය .-රොබට්නොක්ස්-

B - කල දේ වෙනස් කරන මිනිහෙක් නෙමෙයි මම!එහෙම කළොත් මේ රටේ නීතිය පවත්වන්නේ කොහොම ද ? -මං තනන්නෝ-

C - තා දැන් ෂෂ්ටි පුරුෂ මානව වූ වළකින් ගොඩ නැගීම්,තෝ දැන් ඊට වඩා ගැඹුරු මිත්‍ර ද්‍රෝහි නැමැති වළෙක්හි වැටුණේ -මහා කපි ජාතකය-

D - නානාවිධ විහඟ ගණයාගේ මධුර ඣංකාර කුහකුහාරව ගුමුගුමාරවාදීන්. -රාජාවලිය

ඉහත A,B,C,D යන යෙදුම් අතුරෙන් නිවැරදි යෙදුම් වන්නේ,

(1) A,B හා D ය. (2) B හා C ය. (3) A හා C ය. (4) B,C,D ය.

අංක 30 හා 31 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

(30) (1) අක්කා ද අම්මා ද මම ද වෙළඳ ප්‍රදර්ශනයට සහභාගී වූහ.

(2) මහගමසේකර ඇති දක්ෂ ගීත රචකයෙකු මෙන්ම ප්‍රකට චිත්‍ර ශිල්පියෙක් ද විය.

(3) ගොවීහු ගොවි ණය ඉල්ලති'යි නිලධාරීහු සිනාසුනහ.

(4) සුළි සුළඟින් ගෙවල් ද විදුලි කණු ද කඩා වැටුණෝ ය

(31) (1) බල්ලෝ කැටුව ගැහැණු මහපාරේ ඇවිදිති.

(2) මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ ව්‍යාපාරිකයෝ හොදින් කා බී සතුටුවෙති.

(3) ඇය මවක් මෙන් කරුණාවන්තය.

(4) ගුරුවරුන් ඒ කටයුත්තට සම්බන්ධ නැත.

(32) A - ගන්න වැටුප ..... වත් සේවය කරන්න.

B - කරන අපරාධවලට ඉර හඳ ..... කම්පා වන්නේ ය.

C - දියුණු වෙමින් තිබුණු ආයතනය නිලධාරීන් ..... කඩා වැටිණි.

D - යහපතක් සිදුවන ..... සටන් කළ යුතු ය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීමට සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E තුරු F තකා G පවා H නිසා

(1) HFEG (2) HGFE (3) FGEH (4) FGHE

(33) මුල් පදයේ පමණක් අර්ථ ඇති යුගල පද සහිත වරණය තෝරන්න.

(1) අකාමකා,ආතබූත,ආටකනාටක,හාවක්හූවක්

(2) උදව්පදව්,ඉඟිබිඟි,තරහමරහ,වැඩකිඩ

(3)අනවින,කැඩුම්බිඳුම්,හට්ටිමුට්ටි,පවුල්පන්සල්

(4) බොරුබේගල්,මළඉලව්,ගුටිබැට,උයාපිහා

(34) 'පැණි කොමඩු' පද්‍ය පන්තිය,

(1) රුවන් බන්දුජීවගේ ය. (2) ඒ.වී.සුරවීරගේ ය.

(3) රත්න ශ්‍රී විජේසිංහගේ ය. (4) ඩබ්ලිව්.ඒ.අබේසිංහගේ ය.

(35) උපමාවක් සහිත වරණය තෝරන්න.

(1) රසෙයි අමා රසමය ඒ පියස දුට (2) විලිබර ය මගෙ රන්වන් මනාලිය

(3) රිවිබිම්බා සුරු රිවි කුල කමලකර (4) සිටුවා දොර දොර රඹතුරු

(36) සතර දේවාලයන්හි දේවාභරණ වැඩමවන වාහන කුඹල් පෙරහැර ආරම්භ වී පස්වන දිනයෙහි පෙරහැර අගට එක් කෙරෙයි.මේ පෙරහැර හඳුන්වන්නේ,

(1) දවල් පෙරහැර (2) කුඹල් පෙරහැර (3) සිවු දේවාල පෙරහැර (4) රන්දෝලි පෙරහැර

(37) පහත සඳහන් කවියේ තුන්වැනි පදය තෝරන්න.

කුඹුයොන් සයුර බොත එහි මිණි සේ අනත
නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
.....
ඉසි වැනි නිමල් මලි ගිය මල් සිය දිමුත

(1) උදය ගරුක සඳමල් කැනක සිරි ගත (2) පහන් බැවින් පිටතට සස ලෙසින් වත

(3) තර පතරින් සඳදර තර පහර දෙත (4) සැදෑ සඳුට සදමින් මග නිසා කත

(38) ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරයේ දී පියාගේ වැඩිමහල් සහෝදරයා හඳුන්වන නමක් නොවන්නේ කුමක්ද?

(1) ලොකු තාත්තා (2) බක්කම්මා (3) බක්කප්පච්චි (4) මහප්පා

(39) දුද නොද බිඳ බඳ තෙද කඳ... යන කාව්‍යයේ ආකෘතිය වන්නේ,

(1) ගී කාව්‍ය ආකෘතිය යි. (2) සිවු පද කාව්‍ය ආකෘතිය යි.

(3) නිසදැස් කාව්‍ය ආකෘතියයි. (4) සැහැලි කාව්‍ය ආකෘතිය යි.

(40) යම් කතා පුවතක් හෝ සිදුවීමක් ඇසුරෙන් නාට්‍ය පෙළක් නිර්මාණය කිරීමේදී එම කතා පුවතේ හෝ සිදුවීමෙහි ඇති සෑම අවස්ථාවක් ම හෝ සිද්ධියක් ම යොදා ගැනීම සුදුසු නොවන අතර උචිත අවස්ථා පමණක් තෝරා ගත යුතු ය.

(1) නාට්‍ය පෙළක් නිර්මාණය කිරීමේදී එහි අන්තර්ගතය පමණක් යොදා ගත යුතු ය.

(2) නාට්‍ය පෙළට සිදුවීම් අවස්ථා ගැළපෙන ලෙස තෝරා ගත යුතු අතර සෑම අවස්ථාවන්ට සිද්ධීයක් ම යොදා ගත යුතු යැයි නියමයක් නැත.

(3) නාට්‍ය රචකයාට තම සිතැගී පරිදි ගැළපෙන අවස්ථා යොදා ගනිමින් සාර්ථක නාට්‍ය නිර්මාණයට නිදහස ඇත.

(4) නාට්‍ය පෙළ නිමැවුමේ දී එහි සෑම අවස්ථා හා සිද්ධි යොදා ගැනීම අවශ්‍ය නොවන අතර ගැළපෙන අවස්ථා යොදා ගැනීම සුදුසු ය. (ල.1 *40=40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாந்தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11	විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය / வினாத்தாள் / Paper: II	පැය / மணித்தியாலம் / Hours: 02

සැලකිය යුතුයි:

♦ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

(01)අංක(i)සිට (x) දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i)සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් වන පහත අක්ෂර කාණ්ඩ දෙක ව්‍යඤ්ජන වර්ගීකරණය අනුව නම් කරන්න.

අ) ඟ , ඡ , ඩ , ද , ඹ (ආ) ඛ , ඡ , ඨ , ඨ , ඵ

(ii)පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය.එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

විශ්වයේ ප්‍රභවය පිළිබඳව ඇතැමුන් ඉදිරිපත් කළ ප්‍රහන්ධ ප්‍රතික්ෂේප වූ නිසා ඔවුන්ගේ ප්‍රයත්න නිෂ්පල වූ බවට ප්‍රවෘත්ති පළ විය.

(අ) ..... (ආ) .....

(iii) පහත සඳහන් වාක්‍යයේ නාම විශේෂණ පදය හා ක්‍රියා විශේෂණ පදය පිළිවෙළින් ලියන්න.

♦ දක්ෂ දරුවෝ විභාගයෙන් විශිෂ්ට ලෙස සමත් වෙති.

(අ) ..... (ආ) .....

(iv) පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.

(අ) නිල් + උපුල් (ආ) මිණි + අබරණ

(v) පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම්,ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) ශිෂ්‍යයෝ විවාද තරගයෙන් ජය ගනිති'යි ගුරුවරු සිතූහ.

(ආ) ආරෝග්‍යශාලාවට රෝගීහු පැමිණෙනු ඇත.

(vi) පහත සඳහන් වචනවල අනුක්ත රූප ලියන්න.

(අ) පුරාවිද්‍යාඥයෝ (ආ) ළමයෙක්

(vii) "අතිදක්ෂ ලෙස ධර්මය දෙසූ අනුනාහිමියන්ට දායකයෝ දහම් පඬුරු පූජා කළහ." යන වාක්‍යයේ ඇතුළත් උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.

(අ) .....(ආ) .....

(viii) දරුවාගේ,ගසෙන් යන පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන්කර ලියන්න.

(අ) දරුවාගේ (ආ) ගසින්

(ix) පහත දැක්වෙන කර්මකාරක වාක්‍ය, කර්තෘකාරක වාක්‍ය බවට හරවා ලියන්න.

(අ) දරුවන් විසින් දෙමාපියෝ නමදිනු ලබති.

(ආ) ගායකයන් විසින් රසිකයෝ සතුටට පත් කරන ලදහ.

(x) ඉරි ඇඳි පදවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

කෙටි කතාවක් නිර්මාණය කිරීම <u>ආකස්මික</u> ව කළ හැකි දෙයක් නොවේ.ඒ සඳහා <u>සතතාභ්‍යාසය</u> අවශ්‍ය ය.

(අ) ..... (ආ) .....

(ල: 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ),(ආ),(ඉ),(ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන **250** කට නොඅඩු වන සේ රචනයක්ලියන්න.එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති අකුර ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පත්‍රයේ ලියාරචනය ලිවීම ආරම්භ කරන්න.රචනය සඳහා සුදුසු **මාතෘකාවක්** ද යොදන්න.

(අ) ජංගම දුරකථන භාවිතය මේ වන විට බෙහෙවින් ව්‍යාප්ත වී ඇත.ගෝලීයකරණය සමඟ ඇති වී තිබෙන නව විපර්යාස හමුවේ සන්නිවේදන කාර්යය පහසු කිරීමේ ලා මෙවැනි නව තාක්ෂණික මෙවලම් මහෝපකාරී වේ.එහෙත් ඒවා තුළින් අසන්නට දකින්නට ලැබෙන දේවල් කිසිදු තහනමකින් හෝ සීමාවකින් තොරව ලබා ගැනීමට හැකි වීම ඉතාම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි.එබැවින් මෙවැනි විද්‍යුත් මෙවලම් අවිචාරයෙන් පරිහරණය කිරීමෙන් වැළකී මැනවින් තෝරා බේරා ක්‍රියාවට නැංවීමෙන් යහපත් ප්‍රතිඵල ලබා ගත හැකි වේ.

(ආ) කෘෂිකර්මාන්තය අප රටේ අතීතයේ සිට ම පවතින ප්‍රධාන ජීවන ක්‍රමයකි.එය නංවාලීම ජාතික අවශ්‍යතාවකි.එහෙත් අද වන විට කෘෂිභෝග නිෂ්පාදනයේ දී ගොවියාට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති බැවින් කෘෂි නිෂ්පාදන දිනෙන් දින පහතට වැටෙමින් පවතී.මේ නිසා වර්තමානයේ සිදු වී ඇත්තේ ආනයනය මගින් ආහාර අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමයි.එහෙයින් කෘෂිකර්මාන්තය දියුණු කර ගොවීන්ගේ ගැටලු අවම කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සලසා ගොවීන් දිරි ගැන්විය යුතු කාලය එළඹී තිබේ.

(ඉ) වත්මන් සමාජයේ සිසු දරුවන් තුළ කියවීමේ රුචිය ක්‍රමයෙන් ගිලිහී යන බව අද සමස්ත සමාජයම පිළිගත් මතයකි.ඊට හේතුව කැසට්,වීඩියෝපට,රූපවාහිනිය ඔවුන්ට සමීප වීමයි.දැනුම වේගයෙන් වැඩෙන,පැතිරෙන වර්තමානයේ සෙසු රටවල් හා ඉදිරියට යෑමටත්,විවේකය විනෝදයෙන් හා ඵලදායි අන්දමින් ගත කිරීමටත් පොතපතින් ලැබෙන උපකාරය අතිවිශාල ය.පාසල් අවධියේ සිටම වර්ධනය කර ගත යුතු කියවීමේ රුචිය වැඩි දියුණු කිරීම සඳහා උනන්දු කරවීම ගෙදරටත්,පාසලටත්,රජය ඇතුළු විවිධ සංවිධානවලටත් පැවරෙන මහා වගකීමකි.

(ඊ) ශ්‍රී ලංකාව යනු සංවර්ධනය වෙමින් පවතින රටකි.මෙරට මූල ධනයෙන් වැඩි කොටසක් නිදහස් අධ්‍යාපනය වෙනුවන් වැය කරයි.පෙළපොත්,ඇඳුම්,පැළඳුම් නොමිලයේ ම ලැබෙන අතර සමහරුන්ට ශිෂ්‍යාධාර ද ලැබේ.අපේ පාසල්වලට අවශ්‍ය ලී බඩු,විද්‍යා උපකරණ,පුස්තකාල පොත්,ගොඩනැගිලි ආදිය මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවලින් ලැබේ.මේ සම්පත් උපයෝගී කරගෙන උගතුන්වන බොහෝ දෙනා අපේ මව්බිමට සේවය නොකර විදේශ රටවලට ගොස් තම දැනුම ඒ රටවලට බෙදා දෙති.එය රටේ සංවර්ධනයට මහත් බාධාවකි. (ල . 25)

(03) පහත දැක්වෙන ඡේද වචන **50 – 55 අතර** වන සේ සාරංශ කොට ලියන්න.ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ලෝකයේ ඕනෑම භාෂා සාහිත්‍යයක විදග්ධ කවිය පහළ වීමට පෙර ජනකවිය සමාරම්භ වී තිබෙන බව පැහැදිලි ය.ඈත අතීතයේ සිටම අප රටේ ද ජනකවි සාහිත්‍යයක් තිබූ බව ඇල් ගෙවිලියක ගැයූ ගීයක් අසා සැටක් පමණ භික්ෂූන් වහන්සේලා රහත් වූ බව බුද්ධඝෝෂ හිමියන්ගේ සමන්ත පාසාදිකා අටුවාවේ සඳහන්ව තිබීමෙන් පැහැදිලි වෙයි.ජනකවි ලිඛිත සාහිත්‍යයක් වශයෙන් නොපැවතී අතර ඒවා ජනතාවගේ මතකය මත මුඛ පරම්පරාගතව පැවතී බව කිව යුතුය.කාලයෙන් කාලයට භාෂාව හා සාහිත්‍යය වෙනස් වන ආකාරයට ජනකවියද වෙනස් විය.දැනට මුද්‍රිතව පවත්නා ජනකවි එයට පෙරාතුව කෙසේ පැවතියේ ද යන්න නිගමනය කිරීම දුෂ්කර කරුණක් වී තිබේ. කෙසේ වුවත් ජනකවිය විවිධ ප්‍රදේශවල විවිධාකාරයෙන් පැවතීම ස්වාභාවිකය.කෙසේ වෙතත් ජනකවිය නිර්මාණය කළ කවීන් අපට කිසි දිනක දැකිය නොහැක.

කිසියම් වෘත්තියක් පදනම් කොට ගෙන ජනකවිය නිර්මාණය වීමද එහි විශේෂ ලක්ෂණයකි.ජනකවිය නිතරම තර්කයට,බුද්ධියට නොව හදවතට,ශක්තියට සමීප වූයේ ය.තම ජීවිතයේ හද ගැස්ම කවියට නගා ඔහු මිමිණුවේ ය. නිසඟයෙන් අනායාසයෙන් ඔහුගේ මුවින් පිටවුණු ඒ පදවැල් අතර ඔහුගේ දුක,සතුට,සෙනෙහස,කෝපය,හාස්‍යය උපහාසය,බලාපොරොත්තුව ආදී සියලුම හැඟීම් ගැබ්ව තිබිණි.ජනකවියා ජනකවි නිර්මාණය කළේ අනාගත පරපුරකට දැනගැනීම උදෙසා හෝ පදවැල් රචනා කිරීමෙන් තමාට ගෞරවයක් ලැබේ යැයි කියා හෝ නොවේ සිය චිත්තාභ්‍යන්තරයේ ජනිත ව කැකෑරෙන යම් හැඟීමක් නිසා යම් අපහසුතාවයකින් මිදී සැහැල්ලු වීම සඳහා ය.

(ල . 10)

(04) පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භාෂාව මගින් අසන්නාගේ හෝ කියවන්නාගේ සිතෙහි රසයක් හා චමත්කාරයක් ඇති කරන නිර්මාණ සාහිත්‍ය යනුවෙන් හැඳින් වේ.ඒ අනුව චිරන්තන මෙන්ම නූතන ගද්‍ය,පද්‍ය,නවකතා,කෙටිකතා,නාට්‍ය ආදී නිර්මාණාත්මක කෘති සියල්ල සඳහා පොදුවේ සාහිත්‍ය යන නාමය යෙදේ.

සාහිත්‍ය පරාර්ථය උදෙසා කැපවූවකි.සාහිත්‍යකරුවා තම අදහස් තමා තුළ ම තබා නොගෙන අන්‍යයන් වෙත පමුණුවන්නේ එහෙයිනි.මේ කාර්යයෙහි ලා තිදෙනෙක් දායක වෙති. ඒ ලේඛකයා ,පාඨකයා හා විචාරකයා ය.ලේඛකයා තම මනසට එන අදහස් අපූර්වත්වයෙන් ලේඛන ගත කරයි.එම කාර්යයෙහි ලා ඔහු සතුව පවතින සියුම් බව හා පරිණත බව මත සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලිත්වය පිවිසේ.පාඨකයා සතු රුචිය හෝ පළපුරුද්ද අනුව කියවයි.විචාරකයා කෘතියේ අන්තර්ගතය ගැන විමසා බලයි.එහිදී ඊට අයත් විෂය ක්ෂේත්‍රය , භාෂාව , ශෛලිය හා ආකෘතිය වැනි ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙයි.

(1) ඡේදයට අනුව සාහිත්‍යය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

(2) සාහිත්‍ය පරාර්ථය උදෙසා කැපවූවක් බව ලේඛකයා පවසන්නේ කුමක් නිසාද?

(3) සාහිත්‍යකරණය උදෙසා දායකත්වය සපයන පුද්ගලයෝ කවරහු ද?
(4) මෙම ඡේදයේ සඳහන් පරිදි සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලිත්වය පිවිසෙන්නේ ලේඛකයා සතු කවර ගුණාංග නිසාද?
(5) ලේඛකයා පවසන පරිදි කෘතියක් විචාරයට ලක්කිරිමේදී විශේෂ අවධානය යොමු කෙරෙන කරුණු මොනවාද?

(05) පහත දැක්වෙන්නේ කිසියම් වෙළඳ දැන්වීමකින් උපුටාගත් කොටස් කීපයකි.

*අප්‍රේල් මාසය තුල 15% වට්ටම් සහිතව ලබාගත හැක.

* ඉංග්‍රීසි , සිංහල ,දෙමළ පාලි සංස්කෘත ආදී විවිධ පොත්

*සතියේ දිනවල උදේ 8.30 සිට සවස 5.30 දක්වා විවෘතයි.

*සෑම ඉරු දිනකම , පොහෝ දිනවල හා වෙළඳ නිවාඩු දිනකම වසා ඇත.

*පොත්වල මිල දර්ශනය ලබා ගන්න.

මේ තොරතුරු ඇසුරු කරගෙන යටිනුවර නගරයේ දෙවන හරස් වීදියෙහි ''බුවනෙක'' පොත්හල 2019 මාර්තු මාසයේ ප්‍රචාරක කටයුතු සඳහා පිළියෙළ කරන දැන්වීම වචන **100කින්** පමණ ලියන්න.

නැතහොත්

මොනර වැව '' සෙත්පුර '' විද්‍යාලයට වසර 100 ක් පිරිම නිමිත්තෙන් පාසල් පරිසර සංගමය පාසලේ රුක්රෝපණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට තීරණය කරගෙන ඇත.ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන මෙන් ඉල්ලමින් මොනර වැව කෘෂි ව්‍යාපෘති නිලධාරිතුමාට යවන ලිපිය ලියන්න.අපේක්ෂිත ශාඛා වර්ග හා උපදෙස් ලිපියේ සඳහන් කරන්න.පාසල් පරිසර සංගමයේ ලේකම් ඔබ යයි සිතන්න

(වචන 100ක් පමණ සෑහේ.)

(ල . 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11	විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය / வினாத்தாள் / Paper: 111	පැය / மணித்தியாலம் / Hours: 02

සැලකිය යුතුයි:

*උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

*1, 2, 3, 4ප්‍රශ්නවලටත්, 5, 6, 7ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න

* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

---

01). (i) සිට (x) තෙක් ඇති **සියලුම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේනම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) පන්සිය පනස් ජාතක පොත සිංහලයට නගා ඇත්තේ කී වන සියවසෙහි ද?
(ආ) ජාතක කතා අතර දීර්ඝතම කතාව නම් කරන්න.

(ii) (අ) කමත් කවි අයත් වන්නේ කුමන ජනකවි විශේෂයකට ද?
(ආ) කෙළි සෙල්ලම් ඇසුරෙන් නිර්මාණය වූ ජනකවි වර්ගයක් නම් කරන්න.

(iii) (අ) 'වන සරණ','සුදු ගෝනා' යන ග්‍රන්ථවල පරිවර්තකයා කවරෙක්ද?
(ආ) කර්ලිනාහාමි, බබුන් යන චරිත ඇතුළත් වන්නේ කුමන නවකතාවේද?

(iv) (අ) එච්. එම්. කුඩලිගම කවියාගේ ජනප්‍රිය පද්‍ය ග්‍රන්ථය කුමක් ද?
(ආ) සුවඳ, දේදුන්න, මී වදය යනුවෙන් හඳුන්වා ඇත්තේ මොනවා ද?

(v) " දිවි හිමියෙන් මා ඒ වේදනාවෙන් පෙළෙන බව දනිමි."
(අ) මෙහි **මා** යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන්ව ද ?
(ආ) 'ඒ වේදනාවෙන්' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(vi)(අ) ජාතිකාභිමානය හා දේශානුරාගය දැනවීමට ඇස්. මහින්ද හිමි රචනා කළ ග්‍රන්ථයක්දක්වන්න.
(ආ) 'ඔවා මුතු' කාව්‍ය කෘතියෙහි විශේෂත්වය කුමක්ද?

(vii)(අ) ගුරුළුගෝමීන් විසින් රචිත'අමාවතුර' ග්‍රන්ථයෙහි අන්තර්ගත පරිච්ඡේදගණනකොපමණද?

(ආ) අමාවතුර රචනා කොට ඇත්තේ කුමන බුදු ගුණයක් මුල් කොට ගෙනද?

(viii) "මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ"
(අ) මේ ප්‍රකාශය කවුරුන් සඳහා කරන ලද්දක් ද?
(ආ) මේ පාඨයේ ඇතුළත් '**ඔය ගැන**' යනුවෙන් කියවෙන්නේ කුමක් ගැනද?

(ix) (අ) සද්ධර්මරත්නාවලිය රචනා වූයේ කිනම් රජ දවස ද?
(ආ) උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව සද්ධර්මරත්නාවලියේ එන කී වන කතාවද?

(x) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

තත මතු ද	සින්දේ
පිළිමල් දප ද	සින්දේ

(අ) .....
(ආ) .....

(ලකුණු 2 x 10 = 20 යි.)

02). පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා ඇසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) අඟුල් මල් නම් සොරෙකැ, දරුණැ, ලෙමුඩුඅත් ඇත්තෙ යැ,සතුන් කෙරෙහි කුළුණු නැත්තේයැ ගම් නොගම් කෙළෙ, නියම් ගම් නොනියම් ගම්කෙළෙ, දනවු නොදනවු කෙළෙ, මිනිසුන් මරා ඇඟිලි විදැ මාලා කොටැ ධරයි.
(අ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කා හටද?
(ආ) මේපාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) මැගේ මේ අභිමානය මැට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පතක් නිසාත් නොවෙයි තමා ජාති සම්පන්න නො වන හෙයින් ජාතියක් නිසාත් නොවෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය.
(අ) මෙම පාඨයෙහි ඇතුළත් අවස්ථාව කෙටියෙන් ලියන්න.
(ආ) මෙහි දැක්වෙන තැනැත්තියගේ අභිමානයට හේතු වූ කරුණු **දෙකක්** දක්වන්න.

(iii)

ජාතික රණ දෙරණ	මතේ
ගැටී වැටී මළ	මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ	අතේ
නැළවෙන බව සිතනු	පුතේ

(අ) ඉහත කවියේ සඳහන් ශබ්දාලංකාර **දෙකක්** දක්වන්න.
(ආ) සමස්ත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iv)

යටැසින් ලන බැල්මෙන් සුර	**විලසී**
වෙසෙසින් දන මන මත් කැර	**එකසී**
අහසින් බැස රඟ ගත් රඟ	කෙලෙසී
දිසි මෙන් විය විදුලිය සිය	දහසී

(අ) අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ) විශේෂයෙන් ජනතාවගේ සිත මත් වූයේ කුමක් දැකීමෙන් ද?

(v) ... බෙර ගසව; ගී කියව; **එළුසන්, ඔල්වරසන්**, අසුරුසන් දෙව. සියල්ලක් නැති කෙනෙකුට මාගෙන් දෙමි.
(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) ඉහත විධානයන් කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ලකුණු 4 x 5 = 20 යි.)

❖ **03,04 ප්‍රශ්නවලට වචන 150 -200 අතර විය යුතු ය.**

03). (i) අවස්ථා හා සිද්ධි නිරූපණයත්
(ii) භාෂාව රසවත් ලෙස යොදා ගැනීමත්

සද්ධර්මරත්නාවලියේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

නැතහොත් (ලකුණු15 යි.)

(i) වර්තමාන සරල වහර
(ii) කාව්‍යමය වියත් වහර

මනාව ගළපා ගන්නනට ගුත්තිල කාව්‍ය කතුවරයා සමත්වී ඇත. එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු15 යි.)

04). (i) සරල ජීවන රටාව හා බැඳීමත්
(ii) සංයමයත්

ජන කවියේ විශේෂ ලක්ෂණ වේ. 'හානාහීය පානා අඩහැරෙන් දැනේ' පද්‍ය පන්තිය ඇසුරෙන් එක් කරුණකට නිදසුන් **දෙකක්වත්** දෙමින් පැහැදිලි කරන්න.

නැතහොත් (ලකුණු15 යි.)

(i)දරු සෙනෙහස රැඳි සිංහයාගේ චරිතයත්
(ii)තරුණයෙකුගේ අදහස් හා ක්‍රියාකාරීත්වය පිළිබිඹු කරන සිංහබාහුගේ චරිතයත්

නිරූපණයට සරච්චන්ද්‍රයන් දැක් වූ දක්ෂතාව එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු15 යි.)

05) '.අඟුල්මල් දමනය පාඩමෙහි එන **අහිංසක** ගුරු සිත දිනූ ශිෂ්‍යයෙකි'. ඒ සඳහා ඔහු සතු වූ චරිත ලක්ෂණ **තුනක්වත්** දක්වමින් මේ අදහස පැහැදිලි කරන්න.

(ලකුණු10 යි.)

06).'ගංගාවේ සංගීතය සාර්ථක පද්‍ය පංතියකි.' කුඩලිගම කවියා එහි රස නිෂ්පත්තිය සඳහා යොදාගත් කාව්‍යෝපක්‍රම **තුනක්වත්** දක්වමින් මේ අදහස සනාථ කරන්න.

(ලකුණු10 යි.)

07).මහෞෂධ පණ්ඩිතයන්ගේ මහානුභාව සම්පන්න ගුණය වේදේහ රාජ්‍යයේ ආරක්ෂාවට හේතු වූ බව නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු10 යි.)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	11	විෂයය / பாடம் / Subject	සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය / வினாத்தாள் / Paper	I	පැය / மணித்தியாலம் / Hours	01

සැලකිය යුතුය.

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති **1,2,3,4** යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
iv. එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ,ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. **ඉවක් බවක් නැති ව** කැලෑ එළි කිරීම අනාගත මහා විනාශයකට අත වැනීමකි.
   (1) සම්පූර්ණයෙන් ම (2) අපරික්ෂාකාරී ව (3) නොසැලකිල්ලෙන් (4) අධික වේගයකින්

2. අසාධාරණයෙන් ලබා ගන්නා දෙයින් කිසිම **වගතුවක්** නොවන බව උන් වහන්සේ වදාළ සේක.
   (1) වගකීමක් (2) නිරෝගිභාවයක් (3) ප්‍රතිඵලයක් (4) යහපතක්

3. හිතවතුන්ට **ආඩපාළි කීම** දැන්වත් නැවැත්විය යුතු බව පක්ෂ නායකයෝ තීරණය කළහ.
   (1) දොස් කීම (2) වෛර කිරීම (3) බොරු කීම (4) කලහ කිරීම

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස් තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

4. විවිධ පොතපත මෙන් ම විවිධ විෂය කරුණු සොයා ගැනීමට ද පාඨකයන්ට විශ්වකෝෂවලින් මහත් .....සැපයේ.
   (1) පිටුවහලක් (2) පරිශ්‍රමයක් (3) පරිහරණයක් (4) පිටුබලයක්

5. ලක්දිව සිටි ..... ලේඛකයකු වූ සෙනරත් පරණවිතාන මහතා ශ්‍රේෂ්ඨ පුරාවිද්‍යාඥයෙකි.
   (1) චතුර (2) කාර්යක්ෂම (3) චිරන්තන (4) විදග්ධ

6. සාහිත්‍ය රස වින්දනයට උචිත භාෂා ශෛලියක් යොදා ගැනීමේ ..... මෙකල ලේඛකයන් හමුවේ පවතී.
   (1) අභිරූපණය (2) අභියාචනය (3) අභියෝගය (4) අභිලේඛනය

7. අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න
   (1) මරුවැල්,මාවතේ ගීතය, මායාකාරී,මාගේ දේශය
   (2) ගලිවරගේ චාරිකා, ගැටවර විය, ගැහැනියක්, ගොඩ මණ්ඩිය
   (3) රටවට, රුවන්වැකි, රාජාවලිය, රාමායනය
   (4) සිරිගීය, සෙවණැලි ඇද මිනිස්සු, සේරි වාණිජ, සේතුහාමි

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) උත්කෘෂ්ට,විශිෂ්ට, සාමර්ථ්‍යය, කනගාටු
   (2) සංකලණ, මැතිණිය,ඖචිත්‍යය, කල්‍යාණ
   (3) බළතල, පිලිසඳර, පාපිෂ්ට, ආභාසය
   (4) පරිගණකය, ලේකම්, යථාර්තය, විහිළු තහළු

9. පා පිල්ල, ගැට ඇලපිල්ල, රකාරාංශය, ඇලපිල්ල, අනුපිළිවෙළින් යෙදී ඇති උත්තරය තෝරන්න.
   (1) රුවන, කෘදන්ත, සත්‍යය, තිර
   (2) නුවණ,කූඩය, ග්‍රහයා, කාසිය
   (3) මුහුද, ඍතුව, ක්‍රමය, රැහැන,
   (4) රුවල, දෘඪ, ප්‍රවර, සාධක

10. උපසර්ග පද පමණක් යෙදී ඇති පිළිතුර තෝරන්න.
   (1) අරහයා, උදෙසා, අගුණ,ඉමිහිරි
   (2) නිස්සාර, විස්මය, සුදන, උදුල
   (3) අත්‍යවශ්‍ය, අනුකම්පා, පිළිගනි, උපමාන
   (4) ඉක්බිති, අභ්‍යවකාශ,අභිමාන, අනුභාව

11. "මෙන රම්බා හිමි රූ සිරිනි මනහර " යන පද්‍ය පාදයේ 'මෙන' යනු
   (1) නාම පදයකි (2) නිපාත පදයකි (3) ක්‍රියා පදයකි (4) උපසර්ග පදයකි

12. කාන්තාවට,කුරුල්ලෝ,ගස,රිළවුන්, යන නාම පදවල ප්‍රකෘති වන්නේ
   (1) කාන්තාව, කුරුල්, ගස, රිළවා
   (2) කාන්තා, කුරුලු, ගස්, රිළා
   (3) කාන්තාව, කුරුලු,ගස්,රිළා
   (4) කාන්තා, කුරුල්ලා,ගස,රිළවා

13. තත්සම වචන පමණක් ඇති පිළිතුර තෝරන්න
   (1) චාතුර්ය, තාරුණ්‍යය,අන්ත,කල්පාන්ත
   (2) සඳ, අඳුර,පොළෝ, ත්‍රිපිටක දහම
   (3) මුග්ධ, පැරකුම්බා,ශ්වේත චත්‍ර, මිග
   (4) සත්ව උද්‍යානය, ගන අඳුර, පිරිත් දේශනය, පොත්

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

14. **ක්ෂුධාවෙන්** පීඩිත ව වැතිරී සිටි මගියා දෙස ඔහු හැරී බැලුවේ ය.
   (1) මහන්සියෙන් (2) දුකෙන් (3) බඩගින්නෙන් (4) ඊර්ෂ්‍යාවෙන්

15. ජලයට විවිධ අපද්‍රව්‍ය දැමීම **ආපත්ති** කාරණයක් බව ධර්මයෙහි සඳහන් වේ.
   (1) විපත් ගෙන දෙන (2) වර්ණ වෙනස් වීමේ (3) නො කළ යුතු (4) දඬුවම් ලැබිය යුතු

16. ලේඛකයාගේ නිර්මාණාත්මක **කෞශල්‍යය** සිය කෘතිය කෙරේ නොමද බලපෑමක් කරයි.
(1) කුතුහලය (2) කෞතුකය (3) කුසලතාව (4) උද්‍යෝගය

17. "උදෙන් ම කා බී පරිසර සිරි විඳිමින් පාසලට එන්න"ඉහත වාක්‍යයේ ඇති ක්‍රියා පද පිළිවෙළින් දැක්වෙන උත්තරය තෝරන්න.
(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා , අසම්භාව්‍ය ක්‍රියා , අවසාන ක්‍රියා
(2) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා
(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා

18. කප,දුව,නට යන පද **අයත් වන** ව්‍යාකරණ ප්‍රවර්ගය තෝරන්න.
(1) නාම ප්‍රකෘති (2) ධාතු ප්‍රකෘති (3) නිපාත (4) උපසර්ග

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.
(1) ප්‍රහර්ෂය -සතුට, ආගමනය- පැමිණීම, සූක්ෂ්ම -සියුම් , ස්මරණය -සිහිකිරීම
(2) මනෝසිලා -රත්හිරියල්, කූට ප්‍රාප්තිය-ඉහළම අවස්ථාව, ඕෂධී තාරකා -දවහත් තරු, ප්‍රකාශන විලාසය-ලේඛන ශෛලිය
(3) අසේව - වෙහෙසව, වෙහෙල් -මුව , චුම්බිත-සිඹිනා ලද,ගොන්ගේ -හරක් බාන
(4) පදප ශ්‍රේණි - ගස් පංති, ලොලය-ආශාව, පුන්කුඹු -පිරුණු කළගෙඩි,සිලිලාර-ශීතල සුළඟ

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** මින් කුමක් ද?
(1) ප්‍රතිගාමී-ප්‍රගතිශීලි
(2) ආකාර-විකාර
(3) ශෘංගාර -විප්‍රලම්ඛ
(4) උත්තීරණ-විස්තීරණ

21. ''එයින් වර්ගෝන්නතිය ද වැඩේ මැයි'' යන්නෙහි 'වර්ගෝන්නතිය' , යන්න වෙනුවට යෙදිය හැකි වඩාත් ම යෝග්‍ය පදය කුමක් ද?
(1) වර්ගයාගේ පිරිහීම (2) ජාතියේ දියුණුව (3) ජාතික අභිමානය (4) විවිධ වර්ගවලට අයත්

22. වැරදි අදහස දෙන වාක්‍යය තෝරන්න.
(1) 'එපා' යන පදය නිපාතයකි.
(2) හිරු බසිත සඳ නැග එයි, යන්නෙහි 'බසිත' යනු අසම්භාව්‍ය ක්‍රියා පදයකි.
(3) 'හිරමනය' යන්නෙහි නාම ප්‍රකෘතිය'හිරම' යන්නයි.
(4) නුඹ, ගැහැනියක්,කෙනෙක්,ළමයි, යන්න උක්ත පද වේ.

23. දුටා, කියහං ,කන්ට,පොල් පොත්ත යන ජන වහර භාවිත වන ප්‍රදේශ වන්නේ
(1) මොනරාගල,දකුණ,උඩරට,මොනරාගල
(2) උඩරට,මොනරාගල,දකුණ,උඩරට
(3) උඩරට,නුවර කලාවිය,දකුණ,මොනරාගල
(4) මොනරාගල,දකුණ,උඩරට,දකුණ

24. **'සිතින් මවා ගත්'** යන්නට යෙදිය හැකි තනි වචනය තෝරන්න.
(1) අයස්කාන්ත (2) මනස්කාන්ත (3) මනඃකල්පිත (4) ආකල්පිත

25. **සන්ධි නොවූ පදයක්** ඇති වරණය තෝරන්න.
(1) දැත,මාර්ගෝපදේශක,ජීවිතාශාව,ගෙනාවා
(2) විද්‍යායතනය,මිතුරෙක්,නෙතගින්,ඉඳුනිල්
(3) ප්‍රීත්‍යුත්සවය,උනුන්,වීරෝදාර,සුළැගිල්ල
(4) පුනරුච්චාරණ,ඉෂ්ටානිෂ්ට,නාට්‍යෝචිත,ජාතිකෝත්සවය

- අංක 26 ,27 යටතේ දී ඇති අදහසට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. යමක ප්‍රමාණය ඉක්මවීමෙන් නරක ප්‍රතිඵල ලැබේ.
(1) බඩේ ඉන්න දරුවට හඳහන් හදන්නා වගේ
(2) කොස් ඇති තැනටම ලු දෙලුත් කිව්ව ලු
(3) ආතාට අටුකොස් දුන්නා වගේ
(4) අතිරසත් තිත්ත වෙනවා ලු

27. තද අකමැත්තෙන් යමක් දීම
(1) කිඹුල් පැටවුන්ට පීනන්න උගන්වනවා වගෙයි.
(2) ඇඟෙන් ඇටයක් ගියා වගේ
(3) කූඩැල්ලා මෙට්ටේ තියන්ඩ බෑ වගේ
(4) ගොඩ ඉඳන් නැව් පෙරළන්නා වගේ

- පහත ප්‍රකාශ අතුරින් **නිවැරදි** පිළිතුරු තෝරන්න.

28. 'නටති' යනු
(1) ප්‍රථම පුරුෂ,බහුවචන,කර්තෘ කාරක,වර්තමාන කාල,ක්‍රියා පදයකි.
(2) මධ්‍යම පුරුෂ, ඒක වචන,භාව කාරක,වර්තමාන කාල, ක්‍රියා පදයකි.
(3) උත්තම පුරුෂ, බහුවචන,කර්ම කාරක,අතීත කාල,ක්‍රියා පදයකි.
(4) ප්‍රථම පුරුෂ, බහු වචන,කර්ම කාරක,වර්තමාන කාල,ක්‍රියා පදයකි.

29. මුල් පදයේ **පමණක්** අර්ථය ඇති යුගල පද සහිත වරණය තෝරන්න.
(1) ගඩා ගෙඩි,ආටක නාටක,භාවක් හූවක්, අලා මුළා
(2) හදා වඩා,ඇන කොටා, තෝරා බේරා,තළා පෙළා
(3) පැල පදියන්, රණ්ඩු සරුවල්, කතා බතා
(4) ගුණ දොස් , යුතු අයුතු, අතන මෙතන, ඇවතුම් පැවතුම්

30. A ගම අමතකයි - මහගමසේකර
B ඔපනැලි - කුරහන් කැපූ පසු ඉතිරිවන කොටස්
C ඉර රාජ පැළෑටිය - වැවෙන්නේ ලංකාවේ පමණි
D" පියුමම්බා නිතොර ව රැඳි උර මැදුර " - මෙහි රූපකයක් යෙදී තිබේ.

A,B,C,D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) A,C හා D ය. (2) B,C හා D ය . (3) A,B හා C ය . (4) A, B හා D ය.

- අංක 31 ,32 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව **නිවැරදි** වාක්‍ය තෝරන්න.

31. 1) මා නොහොත් නුඹ ගී කියන්නෙහි.
2) බාල දක්ෂිකාවෝ සමඟ ගුරුවරු ද උත්සවයට සහභාගි වෙති.
3) පක්ෂ නායකයෝ ද සභාපතිවරු ද රැස්වීමට ආහ.
4) ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ප්‍රේක්ෂකාගාරයට එති'යි අපි බිය වීමු.

32. 1) අප සිංහයෝ සේ එඩිතර වෙමු.
2) කුරුල්ලෝ හෙවත් පක්ෂීහු වනාන්තරවල සැරිසරති.
3) ගුරුවරුන් හොඳින් විෂය කරුණු උගන්වති.
4) රැස්වීමට සියලු දරුවෝ පැමිණ නැත.

33. පහත දී ඇති කර්ම කාරක වාක්‍යවලින් **නිවැරදි** වරණය තෝරන්න.
1) A අම්මා විසින් මා නළවන ලදි.
2) B ගුරුවරුන් විසින් පොත් ලියැවෙයි.
3) C බැතිමතුන් විසින් දේව පූජාවෝ කෙරෙති.
4) D සොරුන් විසින් දැරියක් පැහැර ගැනුණා ය.

1) ABC 2) ACD 3) ABD 4) BCD

34. ළමයා, මම,කිඹුලා, තෝ යන වචනවල බහුවචන අනුක්ත පදය තෝරන්න.
1) ළමයි,මම,කිඹුලා,තා
2) ළමයින්, මා,කිඹුලන්,තොප
3) ළමයින්,අප,කිඹුලන්,තොප
4) ළමා,අපි,කිඹුල්ලු,තොපි

35. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන ග්‍රන්ථයක නිවැරදි නාමය තෝරන්න.
1) යණිහිසවක් 2) තවිමීගමීළ 3) ත්‍රාකනේසු 4) පනේවසාස්

36. "මං ඒ අය එක්ක යාළු වුණා " යන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය තෝරන්න.
1) මම ඔව්හු හා මිත්‍ර වීමි.
2) මා ඔවුන් හා යාළු වුණෙමු.
3) මම ඔවුන් හා මිත්‍ර වීමි.
4) මම ඔවුන් හා මිත්‍ර වූවෝ ය.

37. සුනේත්‍රා, කාව්‍යශේඛරය,වක්කඩ බඳිමු, බුත්සරණ යන ග්‍රන්ථයන්හි කතුවරුන් අනුපිළිවෙළින් යෙදුණු පිළිතුර තෝරන්න.
1) ඩබ්.ඒ.සිල්වා,ශ්‍රී රාහුල හිමි,ගුණදාස අමරසේකර,විද්‍යාචක්‍රවර්ති
2) මාර්ටින් වික්‍රමසිංහ,වීදාගම හිමි, මහගමසේකර,ගුරුළුගෝමී
3) ඇරැව්වල නන්දිමිත්‍ර, වෑත්තෑවේ හිමි, සිරි ගුණසිංහ, මයුරපාද පරිවේණාධිපති හිමි
4) ඩබ්.ඒ.සිල්වා, වීදාගම හිමි ,ගුණදාස අමරසේකර,දෙවන පණ්ඩිත පරාක්‍රම බාහු

38. 1) පහත සඳහන් කවියේ හතරවැනි පදය තෝරන්න

" පැසෙයි නිබඳ සුවඳැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
...."

1) සැලළිහිණිය වදු කැලණිය පුරවරට
2) කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට
3) රසෙයි අමා රසමය ඒ පියස දුට
4) කුරහන් පැහී මොකටද උඹ නැති දාට

39. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

''සාහිත්‍ය කෘතියේ අන්තර්ගතය නිර්මාණකරුවාගේ අත්දැකීම් මත පදනම් වෙයි. ඔහු අසා,දැක, කියවා,විඳ ඇති දේ ඇසුරෙන් පරිකල්පනය මගින් ගොඩ නැගූ යථාර්ථය නිර්මාණයේ අන්තර්ගතය වෙයි.

1) සාහිත්‍ය කෘතියක් නිර්මාණය කරන්නාගේ අත්දැකීම් හා අසා කියවා විඳ ඇති දේ පරිකල්පනය කොට ගොඩ නැගූ යථාර්ථයේ අන්තර්ගතය වෙයි.
2) අත්දැකීම් මෙන් ම අසා,දැක,කියවා,විඳි දේ මුල්කරගෙන ගොඩ නැගූ යථාර්ථය නිර්මාණයක අන්තර්ගත වෙයි.
3) පරිකල්පනය මගින් අත්දැකීම් ද අසා ,දැක,විඳ ඇති දේ මඟින් කෘතියක අන්තර්ගතය ද ඇති වේ.
4) කෘතියක් නිර්මාණය වන්නේ අත්දැකීම් හා පරිකල්පනය යන ක්‍රම දෙක මඟිනි.

40. 'බෝ' ශාකය විවිධ භාෂාවල විවිධ නම්වලින් හඳුන්වා තිබේ.ඊට අයත් නොවන වචනයක් සහිත වරණය තෝරන්න.

1) අශ්වත්ත 2) අරවු 3) පිපල් 4) ඉරමුසු

(ලකුණු 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	11	විෂයය / பாடம் / Subject	සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය / வினாத்தாள் / Paper	II	පැය / மணித்தியாலம் / Hours	02

- සැලකිය යුතුයි.
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (I) සිට (x) තෙක් ඇති සියලු ම ප්‍රශ්නවල අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් ,එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල වර්ණ මාලාවේ ඇතුළත් සංයුක්ත ස්වර දෙක ලියා දක්වන්න.

(අ) (ආ)

(ii) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.

(අ) සිවුරහ (ආ) පන්දහස්

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

" න්‍යෂ්ඨික බලයෙන් ක්‍රියා කරන ප්‍රථම සබ්මැරීනයට උත්තර ද්‍රවයේ හිම තට්ටුව යටින් ගොස් අනෙක් පසින් මතු වීමට හැකි විය."

(iv) පහත පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) කුලීන (ආ) විරල

(v) පහත දැක්වෙන පදවල අර්ථය පහදන්න.

(අ) පිරි කුඹු (ආ) මෙරමා

(vi) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය.ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) මම හෝ ළමයා වැඩ කරමි.
(ආ) අපි සුවසේ වෙසෙති'යි සොයුරිය ලියා යැවුවා ය.

(vii) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) මග සලකුණු නිවැරදි ව **බලතොත්** ගමන සාර්ථක වන්නේ ය.
(ආ) **සැරද** සුලකළ'කුරු -මියුරු තෙපලෙන් රඳනා

(viii) මෙහි (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) කළ වරද ගැන කනගාටු වීම
(ආ) යම් කෙනෙකු වෙනුවට පෙනී සිටින්නා

(ix) පහත සඳහන් වාක්‍ය දෙක කර්තෘ කාරකයට හරවා ලියන්න.

(අ) ධර්මසේන හිමියන් විසින් සද්ධර්මරත්නාවලිය ලියැවිණි.
(ආ) දෙමාපියන් විසින් අපි රැකුණෙමු.

(x) පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමු වැනි වචනය සමග දෙවෙනි වචනයේ නොගැළපීමක් ඇත.ගැළපෙන සේ පළමුවෙනි වචනය හෝ දෙවෙනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) බ්‍රාහ්මණ ගම (ආ) දෙටු පුත්‍රයා

(ලකුණු 2x10=20)

02. පහත දැක්වෙන (අ) , (ආ) ,(ඉ) ,(ඊ) , යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- යොදන මාතෘකාව ; ආදිය පිළිබඳව මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) පරිසරය සමග එක්ව බැඳී ජීවත් වූ අපේ අතීත මුතුන්මිත්තන්ගේ ජීවන පැවැත්ම මෙන් ම ගති පැවතුම් හා ජීවිත අපේක්ෂාවන් සරල විය. සිතෙහි උපදින කාව්‍යයේ හැඟුම් සරල සුගම පද හතරක් බවට පෙරළී, කට වහරින් පාරම්පරිකව පැවැත ඒම ජනකවියේ ප්‍රධාන ලක්ෂණයකි. කවර අරමුණක් පාදක ව ජනකවිය බිහි වුව ද එහි සන්නිවේදන ලක්ෂණය කැපී පෙනෙයි.

(ආ) සන්නිවේදන තාක්ෂණය දියුණු වීම ලෝකය කුඩා කර මිනිස් වර්ගයා අතර,අන්‍යෝන්‍ය බැඳියාව ළං කිරීමට හේතු වී ඇත. පුවත්පත .ගුවන් විදුලිය, රූපවාහිනිය .අන්තර්ජාලය හා ජංගම දුරකථනය ප්‍රධාන වශයෙන් සන්නිවේදන මාධ්‍ය ලෙස හැඳින්වෙන අතර, මේවා අධ්‍යාපනය කෙරේ බලපාන ආකාර විචාරවත් ව විමසීමට ලක් විය යුත්තකි. දෙපැත්ත කැපෙන ආයුධයකින් වැඩ කිරීම පරිස්සමෙන් කළ යුත්තක් මෙනි.

(ඉ) දැනුමෙන් ,හැකියාවෙන් ,කායික ශක්තියෙන් , මානසික ශක්තියෙන් පිරිපුන් පිරිස තරුණ හෙවත් යෞවන වදනින් අරුත් වේ. ළමා වියේ කඩඉම් සීමාව පසු කොට එළඹෙන තාරුණ්‍යය මුහුණ දෙන කායික,මානසික,සංස්කෘතික , ආර්ථික හා සාමාජික ගැටලු දෙස දයාර්ද්‍ර ඇසකින් බැලීමට රටක වැඩිහිටි පරම්පරාවට අවබෝධයක් තිබිය යුතු ය. එවිට ඔවුන්ට වඩා යහපත් හෙටක් උදා වනු ඇත.

(ඊ) සමබර පෞරුෂයක් ඇති කර ගැනීමට ක්‍රීඩාව මඟින් ඉටු කෙරන මෙහෙවර අපමණ ය. එමඟින් ශාරීරික,මානසික හා සමාජීය වර්ධනයෙන් යුත් ජනකායක් බිහි කරයි.ලොව පුරා විවිධාකාර ක්‍රීඩා උත්සව පැවැත්වෙන අතර, අප රටේ ක්‍රීඩකයෝ ද ජයග්‍රහණ රැසක් ලබා සිටිති.මේ පිළිබඳ සැමගේ අවධානය යොමු කිරීම සිදු විය යුත්තකි.

(ලකුණු 25)

03. පහත දැක්වෙන ඡේදය වචන 50 – 55 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ලෝකයේ බිහි වූ සෑම සුභග ගණිතඥයන්ට ,විද්‍යාඥයන්ට මෙන් ම දර්ශනවාදීන්ට ද භාෂාව තරම් ප්‍රයෝජන වූවක් තවත් නැත.තමාගේ සිතිවිලි පැවැත්ම ඇති වීමට ,අවබෝධය ලබා ගැනීමට,තමා අවබෝධ කරගත් දේ ප්‍රකාශ කිරීමට ප්‍රධානතම මාධ්‍ය වන්නේ භාෂාව යි . අයින්ස්ටයින් තමාගේ දැනීම සොයා ගත්තේ භාෂාව මඟිනි. එම දැනුම පැතිරවීමට යොදා ගත්තේ ද භාෂාව යි. යම් කිසිවෙකු භාෂාවකට විශිෂ්ට දක්ෂතාවක් දක්වතොත් එය බුද්ධිමත් භාවයේ ලකුණක් හැටියට මනෝවිද්‍යාඥයෝ පිළිගනිති. බුද්ධිමත් භාවය මැනීමට යොදා ගන්නා සාධකය භාෂාව යි. එම පිළිගැනීමට අනුව යම් කිසිවෙකු විද්‍යා අංශයට හෝ වෛද්‍ය අංශයට හෝ තෝරා ගැනෙන්නේ ඔහු භාෂාව පිළිබඳ දක්වන දක්ෂතා අනුව ය. බුද්ධි පරීක්ෂණයක ප්‍රධාන අංගය භාෂාව සම්බන්ධිත ප්‍රශ්න වනුයේ ඒ නිසා ය. සාධක විග්‍රහ කිරීමේ විද්‍යානුකූල ක්‍රමය අනුව භාෂාවක දක්ෂතාව උසස් බුද්ධියක ලක්ෂණයක් බැව් විද්‍යාත්මක ලෙස මනෝ විද්‍යාඥයෝ පෙන්වා දෙති. භාෂාවට දක්ෂ දරුවා ගණිතයට ද දක්ෂයෙක් වෙයි. විද්‍යාවට දක්ෂ පුද්ගලයා භාෂාවට ඉතා ම දක්ෂයෙකු විය යුතුම ය. විද්‍යාඥයා භාෂාව පිළිබඳ දක්ෂතාව පෙන්වීමට සාහිත්‍ය කෘති නො ලියයි. එහෙත් අදහස් පැහැදිලිව ම අවබෝධ කර ගැනීමටත් තමා සකසා ගත් සංකීර්ණ වූත් ,ගැටලු සහිත වූත් න්‍යායක් ඉදිරිපත් කිරීමටත්, ඔහුට ආධාර වන්නේ භාෂාව යි.

(ලකුණු 10)

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

තොටගමුවේ සිරි විජයබාහු පිරුවන කෝට්ටේ යුගය විදු එළියෙන් බැබළවූ ප්‍රධානතම අධ්‍යාපන ආයතනය විය.දක්ෂිණ ලංකාවෙහි තොටගම ගමෙහි වූ තොටගම වෙහෙරෙහි මහා විජයබාහු රජු විසින් ඇරඹුණු පිරිවෙන විජයබාහු පිරිවෙන නමින් හැඳින්විණි. මෙය ආරම්භ කෙරුණේ කෝට්ටේ යුගයෙහි නොවේ. කුරුණෑගල යුගයෙහි විසූ මහා විජයබාහු නොහෙත් විජයබාහු රජු විසිනි. ඒ බව තොටගමු වෙහෙර පිළිබඳ ව මහා වංශයෙහි වන තොරතුරු සාක්ෂ්‍ය දරයි. නොයෙක් සංදේශ කාව්‍යයන්හි තොටගමුවේ විජයබාහු පිරිවෙන පිළිබඳ ව ද , ශ්‍රී රාහුල මහා හිමියන් පිළිබඳව ද සඳහන් ය. තොටගමුවේ විජයබා පිරිවෙන පිළිබඳ ව සඳහන් වන පළමුවැනි සංදේශ තිසරය යි. කොවුල් සඳෙසෙහි තොටගමු පිරුවන් වෙහෙරෙහි වන නාථ දෙවියන්ගේ පිළිමය “ඉතා ගන නිල් පිළිමය “ පොරණ ලකුණු යුතු දාගැබ” පිළිබඳව ද සඳහන් වේ. එම යුගයෙහි සමාජයෙහි පැවැති දැඩි දේව විශ්වාසය මෙයින් පැහැදිලි වේ. ගිරා සඳෙස තොටගමු වෙහෙර ගැන ද, පිරුවන ගැන ද විසිතුරුව වර්ණනා කරයි. එය අබිදහම ,විනය වේදාර්ථ, ග්‍රහ ගණිතය,වෛද්‍ය ශාස්ත්‍රය,වියරණය අර්ථ ශාස්ත්‍රය හෙවත් නීති ශාස්ත්‍රය ,ඡන්දාලංකාර,සංස්කෘත, මාගධ,සිංහල ,දෙමළ ,කාව්‍ය,නාටක ආදී විෂයයන් එහි ඉගැන්විණි. මේ විෂය ධාරාව පිළිබිඹු කරන්නේ එකල පැවැති අධ්‍යාපන ක්‍රමයේ දේශීය, අනුරූප භාවයත්,විශිෂ්ටත්වයත් ය. එමඟින් බිහි කෙරුණේ සම්පූර්ණ පාණ්ඩිත්‍යයෙන් හෙබි ශිෂ්‍යයෝ ය.තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ස්වාමි ආදී ෂඩ්භාෂා පරමේශ්වරයෝ ය.

I. තොටගමුවේ විජයබා පිරිවෙන ආරම්භ කළ රජතුමා හා යුගය දක්වන්න .
II. තොටගමුවේ විජයබා පිරිවෙන පිළිබඳ ව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර දෙකක් දක්වන්න.
III. පිරිවෙනෙහි ඉගැන් වූ විෂයයන් දෙකක් ලියන්න .
IV. එවැනි විෂය ධාරාවකින් පිළිබිඹු කරන්නේ කිනම් කරුණු ද ?
V. අර්ථ පහදන්න
(අ) පොරණ (ආ) ෂඩ්භාෂා

(ලකුණු 2x5= 10)

05. පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න. මේ සඳහා වචන 100 ක් පමණ යොදා ගැනීම ප්‍රමාණවත් ය.

ඔබගේ ගම් ප්‍රදේශයේ පැවැත්වෙන සිංහල අලුත් අවුරුදු උලෙළට සහභාගී වන ලෙස ගම්වැසියන් දැනුම්වත් කරමින් දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න. වචන 125 ක් පමණ සෑහේ. දිනය,වේලාව.ස්ථානය,තරග සඳහා සුදුසුකම්, ත්‍යාග හා අලුත් අවුරුදු විශේෂාංග යන කරුණු ඇතුළත් විය යුතු ය.

- නැතහොත් -

හලාවත විජයකටුපොත මධ්‍ය මහා විද්‍යාලය තම 50 වන සංවත්සර උලෙළ නිමිත්තෙන් අධ්‍යාපන හා වෙළෙඳ ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සංවිධාන කොට ඇත. ඒ හා සම්බන්ධ තොරතුරු ඇසුරෙන් ප්‍රදේශවාසීන් දැනුම්වත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ පාසල් සංවර්ධන කමිටුවේ ලේකම් යැයි සිතන්න.

දිනය - 2018.05.10
වේලාව - පෙ.ව.9.00 - ප.ව.6.00
ස්ථානය - හලාවත විජයකටුපොත ම. ම. වි.
ප්‍රදර්ශන කුටි - අධ්‍යාපනික (විද්‍යා ,සාහිත්‍ය ,කාර්මික.....)
වෙළෙඳ කුටි - ඇඳුම් ,විසිතුරු,පාවහන් ,ආහාර ...
ප්‍රධානත්වය - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා
සහභාගීත්වය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා
මෙහෙයවීම - විද්‍යාලයීය පාසල් සංවර්ධන කමිටුව

(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade: 11	විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය	පත්‍රය / வினாத்தாள் / Paper: 111	පැය / மணித்தியாலம் / Hours: 02

සැලකිය යුතුයි.

උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

1,2,3,4 ප්‍රශ්නවලටත් **5,6,7** ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නිශ්චිත ලකුණු ගණන **80**කි.

01) (i) සිට (x) තෙක් ඇති **සියලු ම** ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) " මිනිස්සු හිර ගෙදර උන්න හිටියෙ හැටියෙ මුල්ලකට ගිහින් වැටෙනවා.මැරෙනවා"

(අ) මෙම ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටා ගත් මුල් කෘතිය ලියූ ලේඛකයාගේ නම ලියන්න.

(ii) "අපටත් රක්ෂාව නම් ඌ ම වෙ ද"?

(අ) මෙහි "ඌ" යනුවෙන් කියවෙන අයගේ නම ලියන්න.
(ආ) මෙසේ කීමට හේතුව කුමක් ද?

(iii) (අ) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද නවකතාවක් නම් කරන්න.
(ආ) ඔහු වඩාත් ගුරුකොට ගන්නේ කුමන නාට්‍ය සම්ප්‍රදායක් ද?

(iv) " රන්තරු පිරිවරා ගත් සඳ මඬල යට "

(අ) මෙම පද්‍ය පාදය අයත් පද්‍ය පන්තියෙහි කතුවරයා සඳහන් කරන්න.
(ආ) ඔහු, "සිංහල ෂෙලී " යන පට බැඳි නාමයෙන් හැඳින්වූයේ ඇයි?

(v) "බැලුව මැනව දේවයන් වහන්ස, මෙබඳු ඇඹුල මලක් හා මේ සා දිග ඇඹුල දණ්ඩක් දුටු විරු දැ නැතැ"යි කී ය.
(අ) " දේවයන් වහන්ස "යනුවෙන් ආමන්ත්‍රණය කෙරුණු අයගේ නම සඳහන් කරන්න.
(ආ) මෙසේ ප්‍රකාශ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(vi) (අ) ගුත්තිල කාව්‍යය ලියැවුණු යුගය නම් කරන්න.
(ආ) මෙම කෘතිය රචනා කිරීමට ආරාධනා කළ අයගේ නම ලියන්න.

(vii) " වහන්සේ මට දැහැවි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති "

(අ) මෙසේ ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කිනම් ස්ථානයක දී ද?

(viii) (අ) " මුනි සිරිපා සිඹිමින්නේ " යන පද්‍ය පන්තිය උපුටා ගත් ග්‍රන්ථය සඳහන් කරන්න.

(ආ) මෙහි කතුවරයා විසින් රචනා කරන ලද ළමා නිර්මාණයක් නම් කරන්න.

(ix) (අ) ලංකාවේ බිහි වූ ජනකවි කිනම් යුගයක සිට ආරම්භ වී ඇතැයි සැලකේ ද?

(ආ) හානා හීය පානා අඬහැරෙන් දැනේ " යන පැදි පෙළෙහි අරමුණ කුමක් ද?

(x) (අ) "ධම්මපදට්ඨකථාව "ඇසුරෙන් ලියවුණු කෘතියෙහි නම ලියන්න.

(ආ) "අමා වතුර " කතුවරයා ලියූ වෙනත් කෘතියක් නම් කරන්න.

(ලකුණු 02 x 10= 20)

02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ඈ කෝරලේ මහත්තයාගෙන් තාවකාලික ව ඉල්ලා ගත් කරත්තයක තමා සතු බඩු මුට්ටු ටිකත් පටවා ගෙන ළමා ළපටිනුත් කැටුව කොටගොඩ බලා පිටත් වූවා ය.

(අ) මෙම වාක්‍යය රසවත් කිරීමට යොදා ගත් භාෂා උපක්‍රමය කුමක් ද?

(ආ) මෙහි සඳහන් තැනැත්තිය මෙසේ ගම අතහැර යාමට බල පෑ හේතු දෙකක් දක්වන්න.

(ii) පහත කවියෙහි ඉතිරි කවි පාද දෙක සම්පූර්ණ කරන්න.

පන්සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන වෙණ නදයෙන් තොස්වූ
(අ)
(ආ)

(iii) තව ද උගනිතත් නිරවද්‍ය ශිල්පයක් මුත් සාවද්‍ය ශිල්පයෙන් ***ඓහලෞකික*** ප්‍රයෝජනයක් මුත් ***පාරලෞකික*** ප්‍රයෝජන නැති නියාව හඟවන්නට උග්ගසේන නම් සිටු පුත්හුගේ වත කියමු.

(අ) අංකිත පදවල අදහස ලියන්න

(ආ) මෙම පාඨයෙන් ලබා දෙන උපදේශය කුමක් ද?

(iv) රජ එකල්හි " කිමෙක් වෙ ? "යි **පුළුවුත්තෙන් "**සොරෙක් වේ"යි කී යැ. "එක සොරෙක් වෙයි හො? බොහෝ සොරුන් ගෙනැ රට **පහරනට** නිසි සොරෙක් වෙයි හො? "යි කී යැ.

(අ) මෙම සංවාදය ඇති වූයේ කවුරුන් අතර ද?

(ආ) අංකිත පදවල තේරුම් ලියන්න.

(v) තුමුල ගතින් දා
බාහු බෙලෙන් දා
වෙමි සේ තිදසින් දා
කුරිරු ගිජින් දා
කුඹුතල සින් දා
ලමි සේ කෙසරින් දා
මා පිය මිගිදා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ

(අ) මෙම ගීත ඛණ්ඩයෙන් මතුවන සිංහබාහුගේ චරිත ලක්ෂණය කුමක් ද?
(ආ) මෙහි දැක්වෙන උපමා දෙක උපුටා ලියන්න.

(ලකුණු 04 x 05 = 20)

(03) අංගුලිමාල දමනය රසවත් කිරීමෙහි ලා
(i) කෙටි වැකි උපයුක්ත කොට ගැනීමත්
(ii) සජීවි සංවාද භාවිත කිරීමත්
යන භාෂා ප්‍රයෝග කෙතෙක් දුරට ගැළපේ දැ'යි එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ගෙන විමසීමක් කරන්න.

(ලකුණු 15)

නැතහොත්

ගුත්තිල කාව්‍යයෙහි එන ගුත්තිල පඬිතුමාගේ වීණා වාදනයේ දී

(i) දෙව්ලියන්ගේ රංගන විලාසයත්
(ii) මිනිසුන්ගේ වෙනස් වූ චර්යා රටාවත්

ප්‍රබල අවස්ථා නිරූපණයකට දායක වී ඇති අයුරු එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

04) උග්ගසේන වස්තුවෙහි එන
(i) උග්ගසේන සිටු පුත්‍රයාත්
(ii) විද්දත් දියණියත්

ඔවුන්ගේ ම ක්‍රියා කලාප හේතු කොට ගෙන අමිහිරි යුග දිවියකට මඟ පාදා ගත්හ. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ගෙන මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 15)

නැතහොත්

යටත් විජිත යුගයක දී ලාංකිකයන්ගේ

(i) දේශාභිමානය වඩවාලීමත්
(ii) චරිත සංවර්ධනය ඇති කරලීමත්
"මුනි සිරිපා සිඹිමින්නේ " යන පද්‍ය පන්තියෙන් නිරූපණය කෙරෙන අයුරු එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ගෙන විමසන්න.

(ලකුණු 15)

05) ''නිදහස් අදහස් දරන තරුණයකුගේ ස්වභාවය සිංහබාහු චරිතයෙන් විද්‍යමාන වෙයි.''
''ලෙන අතහැර යාම'' පාඩමෙන් උදාහරණ **තුනක්** ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 10)

06) විවිධ කාව්‍යෝපක්‍රම භාවිත කරමින් පාඨක මනස රසවත් හැඟුමින් පුරවාලීමට ''ගංගාවේ සංගීතය'' පද්‍ය පන්තියෙහි රචකයා සමත් වූ ආකාරය උදාහරණ **තුනක්** මඟින් විස්තර කරන්න.

(ලකුණු 10)

07) බැද්දේගම රසවත් නිර්මාණයක් වීමට එහි යොදා ගත් භාව පූර්ණ ගැමි ජනවහර හේතු වූ ආකාරය උදාහරණ **තුනක්** මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

පිළිතුරු

Answer

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමු වාර පරීක්ෂණය - 2020

11 - ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු

I කොටස

(01)	4	(11)	4	(21)	1	(31)	2
(02)	1	(12)	1	(22)	4	(32)	1
(03)	2	(13)	3	(23)	2	(33)	3
(04)	2	(14)	4	(24)	3	(34)	4
(05)	3	(15)	3	(25)	1	(35)	2
(06)	4	(16)	2	(26)	4	(36)	3
(07)	1	(17)	1	(27)	2	(37)	1
(08)	3	(18)	4	(28)	3	(38)	4
(09)	2	(19)	2	(29)	1	(39)	2
(10)	3	(20)	3	(30)	4	(40)	3

(ලකුණු 1 × 40 = 40)

II කොටස

(01) (i) (අ) තාලුජ (ඉ, ඊ, ච, ඡ, ජ, ඣ, ඤ, ඥ, ය, ශ)

(ආ) මූර්ධජ (ඍ, ඎ, ට, ඨ, ඩ, ණ, ඬ, ර, ෂ, ළ)

(ii) (අ) උත්තීර්ණ අවතීර්ණ

(ආ) විත්තිය - පැමිණිල්ල

(iii) (අ) මහලු (ආ) පිහි

(iv) නැවත, සඳහා, පසු, ය, ව

(v) (අ) කන්+මූල (ආ) ගුරුළු+ඉඳු

(vi) (අ) තාලය (ආ) හදවත

(vii) විශිෂ්ට, සරල

(viii) (අ) විදුලි ඉංජිනේරුවෝ නව විදුලි බලාගාරයක කටයුතු අරඹති.

(ආ) අපි ළමයින් හා පෙළ ට සිටියෙමු.

(ix) (අ) පඩි නඩි (ආ) ආවට ගියාට / එහෙන් මෙහෙන්

(x) (අ) තියෙන හකුරු රැක ගන්නේ

(ආ) කොට්ටෙ මාරු කරන්නා සේ (ලකුණු 2 x 10 = 20)

(02) කරුණුවල සාරවත්භාවයට (ලකුණු 08)

සංවිධානය නිර්මාණාත්මකභාවය හා ස්වාධීනත්වය (ලකුණු 12)

ශිල්පීය දක්ෂතා (ලකුණු 05)

(03) අන්තර්ගතය (ලකුණු 06)

වචන ගණන (ලකුණු 02)

ශිල්පීය දක්ෂතා (ලකුණු 02)

(04) (i) අලුත් බෝග වර්ග හඳුන්වා දීම.

අලුත් කර්මාන්ත හඳුන්වා දීම.

නව තාක්ෂණික ක්‍රම හා යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම. (මින් එක් කරුණක් ලියා තිබිය යුතු ය.)

(ii) ලන්දේසි පාලන කාලයේ දී ය.

(iii) වයඹ දිග හා උතුරු ප්‍රදේශවල

(iv) වගාවේ සාර්ථකත්වය / නිෂ්පාදනය වැඩිවීම

(v) අටවන සියවසේ මුල් භාගයේ දී ය. (ලකුණු 2 x 5 = 10)

(05) ආකෘතිය (ලකුණු 05)

අන්තර්ගතය (ලකුණු 07)

ශිල්පීය දක්ෂතා (ලකුණු 03)

III කොටස

(01) (i) (අ) පුංචි මැණිකාට හිර ගෙදර අසල දී හමු වූ මහල්ලා

(ආ) පුංචි මැණිකා

(ii) (අ) මේ දේ මැඩගෙන දස්කම්

පෑම තමයි සුරුවිරුකම්

(ආ) ඔවා මුතු

(iii) (අ) අමාවතුර

(ආ) අඟුල්මල් / අංගුලිමාල

(iv) (අ) වෑත්තෑවේ හිමි

(ආ) ශක්‍රයා

(v) (අ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර

(ආ) පිං ඇති සරසවි වරමක් දෙන්නේ

(vi) (අ) නිවන් දකිම්වා!

(ආ) පාලි ධම්මපදට්ඨ කථා

(vii) (අ) රබීන්ද්‍රනාත් තාගෝර්

(ආ) පී. බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්න, මාකඳුරේ ගුණවර්ධන, මීමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර

(viii)(අ) කේවට්ට බමුණා

(ආ) මියුලු නුවර වටලෑම

(ix) (අ) කෙළි ගී - මේවර කෙළිය, ඔළිඳ කෙළිය , ඔන්චිලි වාරම් , රබන් කවි , ලී කෙළි , කළගෙඩි නැටුම් ආදි...

(ආ) කෘෂි කර්මාන්තය හා බැඳුණු ජනකවි - කමත් කවි, නෙළුම් කවි, ගොයම් කවි, කුරහන් කවි, පැල් කවි ආදී...

(x) (අ) පුරිසදම්ම සාරථී

(ආ) සංක්ෂිප්ත රීතිය (ලකුණු 2 × 10 = 20)

(02) (1) (අ) මහා සිපී - මහා ශිල්පියා

දැපී - එඩිතරව

(ආ) මහා ශිල්පී ගුත්තිල සක්දෙව්ගේ වචනයෙන් සංතෘප්ත ව, 'මෙයින් දිනමි' යි එඩිතර ව පළමු කොට බමර තත සිඳ දැමී ය.

(2) (අ) උග්ගසේන සිටුපුත්ගේ දෙමාපියන් යාළුවාණන් මසු දහසක් දී තම මිතුරාට විද්දත් දියණිය පාවා දෙන ලෙස ඉල්ලීම

(ආ) විද්දත් දුවගේ දෙමාපියන් යැපෙන්නේත් ඇයගෙන් ම නිසා.

(3) (අ) වේදේහ රජුගේ චර පුරුෂයෙක් මියුලු නුවර අටලොස් අක්ෂෞහිණියක් පමණ සේනාව මියුලු නුවර වටලා සිටින විට ජයපැන් බීමට වේදේහ රජුට කුමාර කල දොළෙක් උපන් බවත්, දැන් ඒ සඳහා ජයපැන් බොන බවත් පැවසීම

(ආ) විෂ සහිත සර්පයකු

(4) (අ) වටාලා - නැවත

උපචාර - පූජාව, සත්කාරය

(ආ) අඟුල්මල් දමනයෙහි දිසාපාමොක් ඇදුරුගේ ශිෂ්‍යයන් අහිංසක හා ගුරුවරයා භේද කිරීමට පැවසූ වදන්වලින් පසුව තමා විසින් ම අහිංසක මැරුවහොත් සිදුවන හානිය පිළිබඳව දිසාපාමොක් සිතන අවස්ථාව

(5) (අ) මේ කළ දෙයින් වනුයේ බරපතල වරදකි. නියත වශයෙන් ම විනාශ මුඛයට පැමිණ ඇත. මේ අවස්ථාවේ කුමක් කරම්දැයි නොදනිමි. යනුවෙන් කම්පා වී සිතයි.

(ආ) ඔහුගේ අණට විරුද්ධ වීමට නොව ගැලවීමට වෙන මඟක් නොමැති නිසා

(ලකුණු 4 × 5 = 20 යි.)

(03) , (04) ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට,

නිදසුන් 4ක් සඳහා ලකුණු	04	
සමස්ත විස්තරයට	08	
මුළු ලකුණු	15	බැගින් 2 = 30

(05) , (06) , (07) ප්‍රශ්නවලින් එකක් සඳහා,

නිදසුන් 3ක් සඳහා ලකුණු	03
සමස්ත විස්තරයට	07
මුළු ලකුණු	10

සිංහල භාෂාව හා සාහිත්‍යය

I පත්‍රය

පිළිතුරු පත්‍රය

1-	2	21-	2
2-	3	22-	4
3-	1	23-	3
4-	4	24-	2
5-	2	25-	1
6-	1	26-	3
7-	4	27-	2
8-	3	28-	2
9-	1	29-	1
10-	4	30-	3
11-	2	31-	3
12-	3	32-	1
13-	1	33-	4
14-	4	34-	2
15-	4	35-	3
16-	2	36-	1
17-	1	37-	2
18-	3	38-	4
19-	1	39-	3
20-	4	40-	2

II පත්‍රය

පිළිතුරු පත්‍රය

1.

i. (අ) කාලය යන අදහස (ආ) කරන ලද හා කළගෙඩිය යන අර්ථය

ii. (අ) පාණ්ඩිත්‍යය (ආ) අබිමුව

iii. (අ) පොල් + අත්ත (ආ) සුරු + අත

iv. නි - නිහඬව ප්‍රති - ප්‍රතිවාරයක්

v. (අ) අන්‍යාර්ථ සමාසය (ආ) ද කාරාර්ථ සමාසය

vi. (අ) දූරදර්ශී (ආ) නිෂ්ප්‍රයෝජන

vii. (අ) ලියන්නාව (ආ) යතුර

viii. (අ) ගුරුවරුන් කල් ඇතිව පාසලට පැමිණෙනු ඇත.

(ආ) සොරු දෙදෙනෙක් අත් අඩංගුවට පත් වූහ.

ix. (අ) විධික්‍රියා.

(ආ) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා.

x. (අ) කල්‍යාණ මිත්‍රයා / කලණ මිතුරු.
(ආ) ඇමති මඩුල්ල / අමාත්‍ය මණ්ඩලය.

4.

i. සිතුවිල්ලක් වෙනත් අයෙකුට දැනවීම සඳහා

ii. සීමිත සිතිවිලි සංඛ්‍යාවක් දළ වශයෙන් ප්‍රකාශ කිරීම.

iii. භාෂාවක් පොදුවේ පරිහරණය කිරීම.

iv. භාෂාවක් නිසා එකමුතු බව ලැබූ ජන සමූහය.

v. භූගෝල වශයෙන් හෝ රාජ්‍ය වශයෙන් හෝ අඛණ්ඩව එක් ප්‍රදේශයකට සීමා විය යුතු නැත.

5. <u>රාජකාරී ලිපිය</u>

ආකෘතිය - ලකුණු 5යි.

යවන්නාගේ ලිපිනය දිනය	- 01
ලබන්නාගේ ලිපිනය	- 01
ආමන්ත්‍රණය	- 01
මාතෘකාව	- 01
අවසානය	- 01

අන්තර්ගතය - ලකුණු 07යි

පොළොන්නරුව සඳගිරි ග්‍රාමය	- 01
වර්ෂාවෙන් අනතුරුව ඩෙංගු උවදුර	- 01
මහජනතාව රෝගයෙන් අසීරුතාවට පත්වීම	- 01
ලේ පරීක්ෂා කිරීමේ වැඩ සටහන	- 01
වළක්වා ගැනීමට කළ යුතු දැනුවත් කිරීම	- 01
මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත දැනුවත් කිරීම	- 01
කටයුතු සම්පාදනය කිරීමට සඳහා ඉල්ලීම	- 01

ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ ආදිය සලකා ලකුණු පිරිනමන්න.

න්‍යාය පත්‍රය

අකෘතිය - ලකුණු 5යි

න්‍යාය පත්‍ර ශීර්ෂ පාඨය	- 02

(රාජාංගණ මහා විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය)

සකස් කරන ලද්දේ කවුද (සංවිධායක මණ්ඩලය)	- 01
කාල කළමනාකරණය	- 02

(එක් එක් අවස්ථා සඳහා ගතවන වේලාව දැක්වීම)

අන්තර්ගතය - ලකුණු 07

ආරාධිත අමුත්තන් අසුන් ගැන්වීම	- 01
සමාරම්භක අවස්ථාවට නර්තන හෝ ගායන අංගයක් දක්වා තිබීම	- 01

පිළිගැනීමේ හා අරමුණු පහදාදීම - 01

ආරාධිත අමුත්තාගේ කතාව යෙදීම - 01

ත්‍යාග ලබා දීමේ කාණ්ඩ තුනක් වෙන්ව යොදා තිබීම - 01

නර්තන වැනි සෞන්දර්ය අංක 03 දක්වා තිබීම - 01

ස්තුති කතාව දක්වා තිබීම - 01

ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි

අත් අකුරු පැහැදිලිබව, අක්ෂර වින්‍යාසය, පද බෙදීම, විරාම ලකුණු, පිළිවෙළ සඳහා ලකුණු පිරිනමන්න.

III පත්‍රය

<u>පිළිතුරු පත්‍රය</u>

1. (i) (අ) අඟුල්මල් තෙර
   (ආ) හර්ග පුරෝහිත, මන්තාණි බැමිණි
   (ii) (අ) ගොල්ල සමග එති ඌරෝ හැමදාම
   නිල්ල අඹති සත් දවසින් බැලුවාම
   (ආ) කුරක්කන් කවි
   (iii) (අ) තමා රජ කුමරියක බවත්, සිංහයකු සමග සරණ විත් තමා දරුවන් දෙදෙනෙකු ලැබූ බවත්
   (ආ) සිංහබාහු හා සිංහසීවලී
   (iv) (අ) එක් සියයක් රජ දරුවන්
   (ආ) මහෞෂධ පඬිතුමා ධර්ම යුද්ධ මණ්ඩලයට වැඩි අවස්ථාවේ
   (v) (අ) පුංචි මැණිකා
   (ආ) බබුන් පිළිබඳ ව
   (vi) (අ) එච්. එම්. කුඩලිගම
   (ආ) පී. බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්න, මාකඳුරේ ගුණවර්ධන, මීමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර ආදීන්
   (vii) (අ) පාලි ධම්ම පදට්ඨ කථාව
   (ආ) ධම්ම පද නම් ගාථා සංග්‍රහයට
   (viii) (අ) මයූර සන්දේශය
   (ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
   (ix) (අ) මුනි සිරිපා සිඹිමින්නේ
   (ආ) දේශාභිමාන හා දේශානුරාග කවි
   (x) (අ) කෝට්ටේ සාහිත්‍ය යුගය
   (ආ) වහා රාජ සභාව ප්‍රබෝධවත් කරවා

(ලකුණු 02x10 = 20යි)

2.(i) (අ) ධර්ම යුද්ධය
   (ආ) කේවට්ටයාගේ උපදෙස් අනුව චූලනී රජු මියුලු නුවර වැසියන්ට ඇතුළු නුවරට පැන්, වී සාල් හා දර නැවැත්වීම අසාර්ථක වන විට කේවට්ට චූලනී රජුට ධර්ම යුද්ධය පිළිබඳ පවසන අවස්ථාව
   (ii) (අ) දකුණු - දාන
   පැදකුණු - ප්‍රදක්ෂිණා
   (ආ) නොයෙක් තැන්වල පිපුණු මල් පිරුණු පොකුණු ය. මිදුල් හා මාර්ගවල කුණු කසළ ඉවත් කර පිරිසුදු සුදු පැහැයෙන් තිබේ.

(iii) (අ) පිණ්ඩපාත ආහාර නොලැබ ක්ලාන්ත වීම නිසා

(ආ) උන් වහන්සේ සත්‍ය ක්‍රියා කොට මෙත් සිත් පිළ ලැබීම නිසා

(iv) (අ) ඕලු, මානෙල්, එළ මානෙල්

(ආ) වනය නැමති සිරි දෙව්දුවගේ පද්මරාග මාණික්‍යයන් බඳනා ලද ආභරණ මෙන්

(v) (අ) සිඟා වැඩි රහතන් වහන්සේ සිනාසුණු විට විද්දත් දියණිය උන් වහන්සේට විද්දත් කමෙක් ඇති වී බව පැවසීමත්, සැමියා එය එසේ යයි පැවසීමත්

(ආ) සැමියා සිටු කුලයෙක ඉපිදත් විද්දත් කුලයේ කතක් හා විවාහ වීමට සිදුවීමත්, බරණැස් නුවර කුල දුවණිය විද්දත් කුලයක ඉපදීමත්

(ලකුණු 04x05 = 20යි)

3, 4 ප්‍රශ්න සඳහා උදාහරණ 4ක් සඳහා ලකුණු	=04
සමස්ත විස්තරයට ලකුණු	=11
මුළු ලකුණු	=15X2 = 30යි.
5/ 6/ 7 එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු	=10යි.

* * *

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21	S	I,II,III

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

First Term Test - Grade 11 - 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු පත්‍රය

I පත්‍රය

(1)	-	3	(11)	-	4	(21)	-	1	(31)	-	4
(2)	-	2	(12)	-	2	(22)	-	3	(32)	-	1
(3)	-	1	(13)	-	3	(23)	-	2	(33)	-	3
(4)	-	4	(14)	-	2	(24)	-	4	(34)	-	2
(5)	-	1	(15)	-	4	(25)	-	4	(35)	-	1
(6)	-	3	(16)	-	1	(26)	-	1	(36)	-	2
(7)	-	3	(17)	-	2	(27)	-	3	(37)	-	3
(8)	-	2	(18)	-	1	(28)	-	3	(38)	-	3
(9)	-	2	(19)	-	3	(29)	-	2	(39)	-	1
(10)	-	1	(20)	-	1	(30)	-	2	(40)	-	2

(ලකුණු 1 x 40 = 40)

II පත්‍රය

(01) (i) (අ) ඩ, ඤ, ණ, න , ම

(ආ) අ, ඇ, ඉ, උ, ඍ, ඎ, ඏ, ඔ

(ii) (අ) වන + ඖෂධ

(ආ) පූජ + උපහාර

(iii) නිෂ්පාදන, වෙළඳපොළ

(iv) නේවාසික, උපරිම

(v) (අ) වැදි + ඕ

(ආ) ගැමි + ආ

(vi) (අ) දුම්රිය සේවකයන් වැඩ වර්ජනය කරති යි මගීහු සැක පළ කළහ.

(ආ) දක්ෂ ක්‍රීඩිකාවක වන්නේ කෙසේ ද?

(vii) නිපාත - යි, නො, නිසා

අනුක්ත - මා, තාත්තා

(viii) (අ) දූරදර්ශී

(ආ) සාංවත්සරික

(ix) (අ) සාහිත්‍යකරුවන් විසින් රසිකයෝ අපූරු ලොවකට ගෙන යනු ලබති / ලැබෙති / යැවෙති.

(ආ) ගොවියන් විසින් කල් යල් බලා කුඹුරු වැපිරෙයි. /වපුරනු ලැබෙයි / ලබයි.

(x) (අ) කිරිඅත්තා

(ආ) ලෙලිගහනවා. (ලකුණු 2x10=20)

(02) සුදුසු ලෙස මාතෘකා පිළිගෙන සම්මත ක්‍රමය අනුව රචනයකට ලකුණු පිරිනමන්න.

(i) සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළුව
ලකුණු 08

(ii) සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය
ලකුණු 12

(iii) ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම
ලකුණු 05

(මුළු ලකුණු 25)

(03) සාරාංශය

(i) අන්තර්ගතය = ලකුණු 06

(ii) වචන ගණන = ලකුණු 02

(iii) ශිල්පීය දක්ෂතා = ලකුණු 02

(මුළු ලකුණු 10)

අන්තර්ගතය

* වංශකතා අනුව ථූපාරාමයට දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියයි.
* මිහිඳු හිමියන්ගේ අදහසට අනුව සර්වඥ ධාතූන් තැන්පත් කිරීම සඳහා දෙවන පෑ තිස් රජු සමඟ සාමනේරයන්ගේ සහය ලබා ගනියි.
* අභය වැවේ මැටිගෙන ධාතූන් වහන්සේලා තැන්පත් කොට සෑදූ මුල් ම ස්ථූපය ථූපාරාමයයි.
* එය ඇතුන්ගේ කුම්භස්තලය මෙන් මැටි ගොඩගසා ගඩොලින් බැඳීම ක්‍රමවත් සැලැස්මකට අනුව සිදු වූ බව සිතිය හැකි ය.

* නමුත් මූලාශ්‍රවල දැක්වෙන්නේ වී ගොඩක අනුරුවට හා ධාන්‍ය ගොඩකට සමානව ගොඩ ගසා ඇති බවයි.
* මේ අනුව පෙනී යන්නේ සැලැස්මකට අනුව ගොඩනගන ලද්දක් නොව කිසියම් නිශ්චිත ආකෘතියකට තැන වූ බවයි.

(ලකුණු 2x5=10)

(04) (i) මතුපිට වාර්තා කිරීම.
(ii) නිරීක්ෂණ ශක්තිය හා පරිකල්පන ශක්තිය
(iii) නිෂ්පාදන සම්බන්ධතා
(iv) සාහිත්‍ය කලාවන් තුළින්
(v) සාහිත්‍ය කලා අධ්‍යනය බුද්ධිමය ව්‍යාපාරයක් බවයි. (ලකුණු 2x5=10)

(05) ආකෘතිය	ලකුණු 05
අන්තර්ගතය	ලකුණු 07
ශිල්පීය දක්ෂතා	ලකුණු 03
	මුළු ලකුණු 15

III පත්‍රය

(01) (i) (අ) ධර්ම යුද්ධය කොටස
(ආ) ගොවියා පුතු නොවැන්ද බව / මහෞෂධ පණ්ඩිතයිනට නොවැන්ද බව
(ii) (අ) අමාවතුර
(ආ) ගුරුළුගෝමී පඬිතුමා
(iii) (අ) ධර්මසේන හිමි
(ආ) දඹදෙණි යුගය
(iv) (අ) අහසින් බැස රඟගත් රඟ කෙලෙසී
(ආ) දිසි මෙන් විය විදුලිය සිය දහසී
(v) (අ) Village in the jungle / විලේජ් ඉන් ද ජංගල්
(ආ) ලෙනාඩ් වුල්ෆ් මහතා
(vi) (අ) එස්. මහින්ද හිමි
(ආ) ඔවා මුතු
(vii) (අ) එච්. එච්. කුඩලිගම කවියා
(ආ) පී. බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්, මාකඳුරේ ගුණවර්ධන, මිමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර
(viii)(අ) සිංහබාහු නාට්‍යය
(ආ) මහාවංශය
(ix) (අ) මිණිබරනින් සැදූ මුත් ගත නොදිරද්ද
(ආ) පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද
(x) (අ) ධම්මපදට්ඨ කතාව
(ආ) බුද්ධඝෝෂ හිමි

(ලකුණු 2x10=20)

(02) (i) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජු, කේවට්ට බමුණා
(ආ) චුලනී බ්‍රහ්මදත්ත රජු මහත් සේ කෝපයට පත්ව මියුලු නුවර වැටලීමට අටළොස් අක්ෂෞහිනියක් සේනාව සමඟ නික්මෙන අවස්ථාවේ කේවට්ට බමුණා ඒ සමඟ නික්මෙන අවස්ථාව
(ii) (අ) දිගත - දිගන්තය / දස දෙස / දිශාවන්හි
තුරුහිස - ගස් මුදුන් / ගස් උඩ
(ආ) දිගන්තය පුරා / දස පුරා පැතිරී යන වීණා නාදය විශේෂයෙන් අසමින් ගස් මුදුන්වල සිටින ගිරවු ආශාවෙන් ගත් මියුරු මී අඹ ඉවත දමා ඉතා මියුරු වීණා නාදය ඇසුහ.
(iii) (අ) බුදුරජාණන් වහන්සේ
කොසොල් රජතුමාට
(ආ) වහන්සේ මට දැහැවි රජ කෙනෙක් ඇත්තාහු නොවෙති, / මා සමඟ කේන්තිගත්, කෝප වූ රජ කෙනෙක් නැත. මාගේ රට අගුල්මල් සොරෙකු සිටී ඔහු ගන්නට යන බවයි.
(iv) (අ) මැසි උඩ මැසි ගසා ගැනීම.
(ආ) උග්ගසේන සිටු පුත්‍රයාගේ නැටුම් ශිල්පය බැලීම / නැරඹීම සඳහා
(v) (අ) අවතාර අඩිකෝඩ - හොල්මන් ගැවසෙන කලබල / විකාර
සැහැසි - දරුණු වූ / සහාසික වූ / එඩිතරකමක් පෙන්වන
(ආ) ආරච්චි

(ලකුණු 4X5=20යි)

(03) (i) **මිනිස් දහසක් මරන්නට පෙළඹුණ ආකාරය**

✯ අහිංසක තක්ෂලාවේ ධර්මාන්හෙවාසිකව ශිල්ප උගනිමින් පරමාදර්ශී ශිෂ්‍යයෙකු ලෙස හැසිරෙයි.

''වත් සැපැනැ, කී කී දෙය වහා සපයයි, පෙම් වඩන න්‍යායෙන් බෙණෙයි.

✯ අනෙකුත් ශිෂ්‍යයෝ අහිංසක කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් ගුරුතුමාට කේලාම් කියා ඔහු සමඟ බිඳවීමට උත්සාහ කිරීම

''අහිංසක මානවකයා ආ තැන් පටන් ඇපි නොපෙනෙම්හ''

''ආචාර්යයා, අඹුව හා සසඟ ඇත්තේ යයි බිඳ පියමිවා.''

''තුන් රැසක් පළමු ඇතැම් කෙනෙක් ආචාර්යයා එළඹ වැද සිටියාහ!

''ආචාර්යා ඔවුන් තමා සනා ඇතිවැ බණන සෙ දැක.''

''පුතැ, මිනිස් දහසක් මැරුව මැනැවැ. එ සෙ වන්නා ශිල්පයට උපචාර කළා වෙ.''

(ii) **බුදුහිමි සතු පුරිසදම්ම සාරථී ගුණය ස්මතු වන ආකාරය**

✯ බුදුන් වහන්සේ දෙව්රම් වෙහෙරෙයි වැඩ සිටින විට ලොව බලද්දී අහිංසකගේ මව පුතු සොයා යන බව දැන අංගුලිමාල ආනන්තරිය පාපකර්මයෙන් මුදවා ගැනීම.

✯ එදවස් බුදුහු දෙව්රෙමෙහි වෙසෙමින් මා ගිය කළ ඔහුට සෙත්වෙයි.

✯ බුදුන් වහන්සේ අංගුලිමාල සොයා යද්දී ගොන් රක්නා මිනිසුන් සොරා පිළිබඳව විස්තර කිරීම.

''මහණ එමඟට නොයා ඒ මඟ අගුල්මල් නම්.... සොරුක .... බුදුහු ඔවුන් තුන් යලක් කියතුදු නොබැණ නැගී වැඩියෝ.

''මේ මහණ මැරුව මැනැවයි.''

''බුදුන් පස් පස් ලුහු බඳියි.''

''බුදුහු මම සිටියෙමි. තෝ ද සිටයි. වදාළො.

''මෙතැන් තැන් පටන් ගෙන පව් නොකරමි. තොපගේ මියුරු කථා අසා යැ'යි.''

නැතහොත්

(i) සරල විරිත - සරල විරිතෙන්

''ගුත්තිල ඇඳුරු සඳ''
''දෙදෙනම ඉද දෙපිට'' } පද්‍ය 1- 13 දක්වා මහපියුම් / ගී විරිත

✯ රස ජනනය වන පරිදි අවස්ථෝචිතව විරිත් වෙනස් වන අවස්ථා

- කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ...
- දිය දිය ගොස පල කෙරෙමින් සැපැමිණි...
- රූ රැසේ අදිනා ලෙසේ අත් .....

(පද්‍ය 14-32 සොළොස්මත් විරිත / පෙඳ විරිත) පද්‍ය 33- 34 සවිසිමත් විරිත නුපුන් සඳ විරිත)

(ii) අවට රැස්වූවන්ගේ ස්වභාවය වර්ණනා කිරීම.

''සතොස් කරන විණා නද ඇසුමට''

''අසන රිසින් නයි කැල ඔසලෝයා''

''නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ.....

''පන්සිල් වීණා නද පසු බැස්සු .....''

(ලකුණු 15යි)

(04) (i) **උග්ගසේන අභියෝග ජය ගත් ආකාරය**

''ලදොත් ජීවත්වෙමි, නොලදොත් මියෙමියි.'' කියා මාරාන්තික උපවාසයක යෙදී ඇයව ලබා ගැනීම

''ගැල් රකිනවුගේ පුත, කුමක් නොදන්නාහුගේ පුත කිය කියා නළවයි.''

''තොප ගිය මැනව, හුන මැනව.''

''ඇගේ බැවුම් පලවා මමත් ශිල්ප උගනිමි.''

''මෙතනට සත් වන දවස් මම ශිල්ප දක්වමි.''

උග්ගසේන සිටු පුත්‍රයා හුණදඬු අඟ දී පිළිසිඹියා පත් රහත්ව හුණ දණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොස් පසඟ පිහිටුවා වැඳගෙන මහණ කරන්න ආරාධනා කළහ.

(ii) **භාෂාව හසුරුවා ඇති ආකාරය**

✯ අවස්ථෝචිතව සංවාදයෙන් ඉදිරිපත් කරන සිද්ධි නිරූපණය

''මේ හැම මා අරභයා කවු ද?

එසේය අනික් කාට කියමි ද?

තොප ගිය මැනව හුන මැනව.

උපමා භාවිතය

- අවකප්පනයෙන් සැදූ හසු රැන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේ''.....
- පැසුණු ගොයම් මුල් වුවා සේ.....

නැතහොත්

(i) **වනය විසින් ගම යට කර ගැනීම.**

- සිළිඳු අතින් ආරච්චිත්, ප්‍රනාන්දුත් මරණයට පත් ව ගෙවල් පාළු වී යාම.

✯ නැංවොහාමි දරුවන් සමඟ ඇගේ ගමට යාම නිසා එම ශක්තිමත් නිවස ද කැලයට යාම.

- ''එක පහරට එක දවසින් එහි තිබුණ ගෙවල් හයෙන් එකක් නැති විය. විසි පස් දෙනෙක් වූ පිරිසෙන් හත් දෙනෙක් ම නැති වූහ.''

✯ ආරච්චිගේ ගෙයි වාසය කිරීමට කෙනෙකු නොවූ හෙයින් එය කැලයට ඇරිණ.''

(ii) **පුංචි මැණිකාගේ චරිත නිරූපණය**

- පුංචි මැණිකා තම පියාට මෙන් ම තම ස්වාමියා වූ බබුන්ට ද ආදරය සෙනෙහස දැක්වීම.
- පුංචි මැණිකා බවුන් එනතුරු බලා සිටියාය.''
- පුංචි මැණිකාගේ කලබල නැති ගතියක් සාන්ත යටහත් පහත් ගතියත් නිසා කවුරුත් ඇට ප්‍රිය කළාය.
- පුංචි මැණිකා බබුන් සොයා හිර ගෙදරට ගිය අවස්ථාවේ පුංචි මැණිකා හිරපල්ලාගෙන් තොරතුරු විමසූ අවස්ථාව
- පුංචි මැණිකා අභියෝග හමුවේ ඉවසීමෙන්, අධිෂ්ඨානශීලීව මුහුණ දුන් ආකාරය

(ලකුණු 15යි)

(05) **උචිත රූපකාර්ථ යෙදීම**

- ✯ බාල අවධියේ සිට ම රට දැය පිළිබඳ හැඟීමකින් යුතුව යුතුකම් ඉටු කිරීමට උත්සාහ දැරීම.

  - නිදහස මහ මුහුදක් වේ.''

  - එහි උල්පත පුත නුඹ වේ.''

  - ජාතිය රන් විමනත් වේ.

  - ආගම මිණි පහනක් වේ.

  ඔහු මෙළොවට පහළ දෙවි

  රජෙකැයි සලකනු මැනවි

  මෙහි යෙදී ඇති පද රූපාකර්ථ සහිත යෙදුමය.

(ලකුණු 10යි)

(06) **භානාභීය පැදි පෙළේ කව්‍යාලංකාර යෙදීම.**

- ✯ අප්තෝපදේශ සහිත සාම්ප්‍රදායික යොදුම් බහුලව යොදා තිබීම.

  ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු .....

  දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා .....

- ✯ පාදාන්ත එළි සමය යොදා තිබීම.

  ගැළපෙන නිදසුන් ලියා තිබීම.

- ✯ උපමා යොදා තිබීම

  ''එක් උනදාට උක් දණ්ඩේ පැණි සේමා .....යන කවි නිදසුනකි.

  - ✯ විධික්‍රියා පද සහිත වියරණ විදි යොදා ගැනීම

    ''ළිඳ කපනු,

    උඩ පනිනු

    කද බඳිනු

    කල් හරිනු''

  - ✯ ප්‍රශ්නාර්ථ යෙදුම් භාවිතය

    රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද ... යන කවිය

(ලකුණු 10යි)

(07) **සිංහබාහු නව ලොවක් අපේක්ෂා කළ ආකාරය**

- ✯ මහ වන මැදක, ගිරි ලෙනක ගෙවන ජීවිතය එලක් නොමැති බව.

  ''සිත නොම සැනසේ හිඳිනට මෙ ලෙසේ

  දිවි හිමියෙන් මෙ ලෙනේ...

- ✯ පියතුමා හා අන් අය අතරෙහි වෙනස දැකීම.

  ''පියතුමගේ ගත නැරඹූ කල සිත කුහුලින් ඉතිරෙන්නේ.....

- ✯ ඔබ දෙදෙන මා සමඟ නොආවොත් යන්ට වේ ඔබ දමා මෙ ලෙනේ....

  අදාළ වෙනත් උදාහරණ ද යොදා ගත හැක.

(ලකුණු 10යි)

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතිය !

හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ